

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2022

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශය

වාණිජ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂය 295

පටුන

			පිටු අංකය
01 වන පරිච්ඡේදය	-	ආයතනික පැතිකඩ	03
02 වන පරිච්ඡේදය	-	ප්‍රගතිය හා ඉදිරික දැක්ම	57
03 වන පරිච්ඡේදය	-	වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය	61
04 වන පරිච්ඡේදය	-	ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ ප්‍රධාන කාර්ය සාධන දර්ශක	68
05 වන පරිච්ඡේදය	-	තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය	69
06 වන පරිච්ඡේදය	-	මානව සම්පත් පැතිකඩ	71
07 වන පරිච්ඡේදය	-	අනුකූලතා වාර්තාව	73

01 වන පරිච්ඡේදය -ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වෙළඳ අමාත්‍යාංශයේ අන්තර්ජාතික වෙළඳ ප්‍රතිපත්ති අංශය වන වාණිජ දෙපාර්තමේන්තුව ද්විපාර්ශවික, කලාපීය හා බහුපාර්ශවික මට්ටම්වලදී ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමේ සමස්ත මෙහෙයවුමෙහි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම සංදර්භය තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන කර්තව්‍යයන්ට වෙළඳ ප්‍රතිපත්තිය හා විදේශයන්හි වෙළඳ ප්‍රවර්ධනය අන්තර්ගත වේ.

1.2 දැක්ම සහ මෙහෙවර

දෙපාර්තමේන්තුවේ දැක්ම

"ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම"

දෙපාර්තමේන්තුවේ මෙහෙවර

"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශවික, කලාපීය සහ බහුපාර්ශවික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම"

1.3 ප්‍රධාන කාර්යයන්

1. ලෝක වෙළඳ සංවිධානයේ සියලු මට්ටම්වලදී (එනම් තීරණ ගැනීම සහ තාක්ෂණික) සාකච්ඡා සහ සම්මුති සාකච්ඡාවලදී සඵල නියෝජනය සහ සහභාගිත්වය තුළින් බහුපාර්ශවික සංසදවලදී ශ්‍රී ලංකාවේ ආර්ථික, වෙළඳ හා වාණිජ අභිලාෂයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවට සැලකිය යුතු ලෙස වැදගත් වන කරුණුවලදී පොදු ස්ථාවරයක් ඇති කර ගැනීම පිණිස සමාන අදහස් ඇති ලෝ.වෙ.සංවිධානයේ රටවල් සමග සම්බන්ධීකරණය හා සහයෝගිතාව පවත්වා ගැනීම.

2. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා අන්‍යෝන්‍ය නොවන වරණීය වෙළඳ ගිවිසුම් එනම් සාමාන්‍යීකෘත වරණ ක්‍රමවේදය යටතේ තීරුබදු සහන ලබා ගැනීම මගින් වෙළඳපොළ ප්‍රවේශය ලබා ගැනීම පිණිස සම්මුති සාකච්ඡා පැවැත්වීම.

3. නිදහස් වෙළඳ ගිවිසුම් සහ කලාපීය වෙළඳ ගිවිසුම් වැනි අන්‍යෝන්‍ය වෙළඳ ගිවිසුම් යටතෙ ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය වෙළඳපොළ ප්‍රවේශය ලබා ගැනීම සඳහා සම්මුති සාකච්ඡා පැවැත්වීම.
   දැනට සාකච්ඡා කරමින් පවතින ගිවිසුම් පහත පරිදි වේ.
   - **i.** බහු ආංශක තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාව සඳහා බෙංගාල බොක්ක මූලාරම්භය (BIMSTEC) **:** ඊට සම්බන්ධ රටවල් වනුයේ **:** බංග්ලාදේශය**,** භූතානය**,** ඉන්දියාව**,** මියන්මාරය**,** නේපාලය**,** ශ්‍රී ලංකාව**,** තායිලන්තය
   - **ii.** චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (**CSFTA)**
   - **iii.** ඉන්දියාව සමඟ ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ETCA)

iv. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)

4. ප්‍රධාන විදේශ අපනයන වෙලඳපොලවල තීරුබදු සහ තීරුබදු නොවන පියවර යන දෙකම වෙළඳපල ප්‍රවේශය ආශ්‍රිත වර්ධනයන් අධීක්ෂණය කිරීම සහ ශ්‍රී ලංකාවේ අපනයන මත එවැනි ක්‍රියාමාර්ගවල ඍණාත්මක බලපෑම අවම කිරීම හෝ ඉවත් කිරීම සඳහා ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික මට්ටම්වල ඵලදායී සහ ප්‍රමාණවත් නියෝජනයක් ලබා දීමෙන් සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ගැනීම.

5. ජාතික මට්ටමින් අවශ්‍ය ප්‍රමිතීන්/ක්‍රියා පටිපාටි සකස් කිරීම සහ කලාපීය/ජාත්‍යන්තර ප්‍රමිති සැකසීම් ආයතනවලින් අනුමැතිය/අනුමත ලබා ගැනීම මගින් ආනයන වෙලඳපොලවල නිශ්චිත වෙළඳපල ප්‍රවේශ බාධක ආමන්ත්‍රණය කිරීම සඳහා සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.

6. නිදහස් වෙළඳ ගිවිසුම්, කලාපීය වෙළඳ ගිවිසුම් සහ සාමාන්‍යකෘත වරණීය ක්‍රමවේද යටතේ පවතින වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා පිළිබඳව කොළඹ සහ ප්‍රාදේශීය නගරවලදී දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ/වැඩමුළු පැවැත්වීම.

7. විදේශ වෙලඳපොලවල ස්වභාවයෙන් තීරුබදු සහ තීරුබදු නොවන පියවර යන දෙකෙහිම වෙළඳපල ප්‍රවේශය ආශ්‍රිත වර්ධනයන් පිළිබඳ තොරතුරු බෙදා හැරීම සහ සැපයුම් පාර්ශ්ව බාධක ආමන්ත්‍රණය කිරීම සඳහා උද්දේශනය කිරීම ඇතුළුව ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි එවැනි පියවරවල බලපෑම විශ්ලේෂණය කිරීම.

8. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රභවස්ථාන සහතිකපත් ලබා ගැනීමට සුදුසුකම් ඇතිකර ගැනීම පිළිබඳ උපදෙස් ලබා දීම සහ මගපෙන්වීම ඇතුළු ප්‍රභවස්ථාන නීති, නිෂ්පාදනය, ක්‍රියා පටිපාටිමය අවශ්‍යතා පිළිබඳ විශේෂඥ උපදෙස් ලබා දීම.

9. පහත සඳහන් වරණීය ක්‍රමයන් සහ කලාපීය, ද්විපාර්ශවීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන පහසුකම් සැලැස්වීම සඳහා ප්‍රභවස්ථාන සහතික කඩිනමින් නිකුත් කිරීම.

    i. සාමාන්‍යකෘත වරණීය ක්‍රමය (GSP)
    ii. වෙළඳ වරණ පිළිබඳ ගෝලීය ක්‍රමවේදය (GSTP)
    iii. සාක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
    iv. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
    v. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
    vi. පාකිස්ථාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
    vii. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
    viii. සිංගප්පුරු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SSLFTA)

10. ජාත්‍යන්තර වෙළඳාමේ නව වර්ධන සහ ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් ආශ්‍රිත මාතෘකා සම්බන්ධයෙන් විදේශීය සම්පත් දායකයන්ගේ සහභාගිත්වයෙන් කොළඹ සහ කලාපීය නගරවල පුහුණු වැඩසටහන්/වැඩමුළු සංවිධානය කිරීම.
11. ශ්‍රී ලංකාව තුළට සහ පිටතට භාණ්ඩයක් ආනයනය කිරීමේදී හෝ අපනයනය කිරීමේදී අනුකූල විය යුතු සියලුම අවශ්‍යතාවයන්ට අදාළ විමසීමකට පිළිතුරු වශයෙන් තොරතුරු ලබා දෙන, සංවිධාන 41 ක ආනයන

අපනයන පරිපාටි ආශ්‍රිත යාවත්කාලීන තොරතුරු සහිතව ‘‘ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය’’ පවත්වා ගැනීම.

12. විදේශීය පාර්ශවයක් සහ ශ්‍රී ලාංකේය පාර්ශවයක් අතර ඇති වන වෙළඳ ආරවුල් සාමකාමීව විසඳීම සඳහා සහාය ලබා දීම.

13. අපනයනකරුවන් වෙත ආනයනික රටවල්වලින් සිය නිෂ්පාදනයන්ට යොමු කෙරෙන ප්‍රපාතන විරෝධී විමර්ශනයන් සඳහා පිළිතුරු සම්පාදනය කිරීමට මග පෙන්වීම සහ සහය ලබා දීම.

14. ශ්‍රී ලංකාවේ අපනයන, ආනයනික රට තුළ ප්‍රතිතෝලන බදු විමර්ශන සඳහා යටත් වන විට එය විශ්ලේෂණය කිරීම හා ඊට පිළිතුරු සකස් කිරීම.

15. විදේශ වාණිජ නියෝජනය - වෙළඳාම ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම සඳහා වන වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යය එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 31 ක සේවය කරන වාණිජ දෙපාර්තමේන්තු නිලධාරීන් 33 දෙනෙකුගෙන් සමන්විත වේ.


16. පවත්නා මෙන්ම විභව්‍ය ශ්‍රී ලාංකීය නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.

17. නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.

18. ණය දෙන ආයතන අනුමත කිරීම.

19. ඒකාබද්ධ කොමිසම/කමිටු සහ වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම් (TIFAs) සංවිධානය කිරීම/ සම්බන්ධීකරණය කිරීම.

1.4 සංවිධාන සටහන: වාණිජ දෙපාර්තමේන්තුව



1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ඒවායේ කාර්යසාධනය

1.5.1 බහු පාර්ශවික සබඳතා අංශයෙ

ලෝක වෙළඳ සංවිධානයේ තීරණ ගැනීමේ සහ තාක්ෂණික යන මට්ටම් දෙකෙහිදීම සාකච්ඡා සහ සම්මුති සාකච්ඡාවලදී සළුල නියෝජනය සහ සහභාගිත්වය තුළින් බහුපාර්ශවික සංසදවලදී ශ්‍රී ලංකාවේ ආර්ථික, වෙළඳ හා වාණිජ අභිලාෂයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම කෙරෙහි බහු පාර්ශවික අංශය මූලිකවම කේන්ද්‍ර ගත වෙයි. එසේම ශ්‍රී ලංකාවට සැලකිය යුතු ලෙස වැදගත් වන කරුණුවලදී පොදු ස්ථාවරයක් ඇති කර ගැනීම පිණිස සමාන අදහස් ඇති ලෝක වෙළඳ සංවිධානයේ අනෙකුත් රටවල් සමග සම්බන්ධීකරණය හා සහයෝගිතාව පවත්වා ගැනීමේ කටයුතුවල ද එය නිරත වෙයි. එසේම, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධිනය (WIPO), ජාත්‍යන්ර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ මධ්‍යස්ථානය (ACWL) ඇතුළුව, වෙනත් බහුපාර්ශවික සංවිධාන කිහිපයක් සමග ද ශ්‍රී ලංකාව සමීප සම්බන්ධතා පවත්වා ගෙන යනු ලැබේ.

I. ලෝ.වෙ. සංවිධානයේ 12වැනි අමාත්‍ය සම්මේලනය (MC12)

ලෝ.වෙ.සංවිධානයේ 12 වැනි අමාත්‍ය සම්මේලනය 2022 ජූනි 12 සිට 17 දින දක්වා සහභාගිකයන්ගේ භෞතික සහභාගිත්වයෙන් ජිනීවාහිදී පවත්වන ලදී. බහුපාර්ශවික සම්මුති සාකච්ඡා තුළින් එළඹී අවසන් තීරණ සහිත අමාත්‍යාංශ ලේඛන 12 ක් නිකුත් කරන ලද අතර ඉන් සමහරක් පහත දැක්වේ.

- **ආහාර අනාරක්ෂිතතාව පිළිබඳ හදිසි ප්‍රතිචාරය** - ශ්‍රී ලංකාව බඳු ආහාර අනාරක්ෂිත රටවල්වලට උපකාර කිරීම අරමුණු කරගනිමින් ලෝක ආහාර සංවිධානය විසින් සිදු කරනු ලබන ආහාර මිලදී ගැනීම් මත අපනයන තහනම් කිරීම් හෝ සීමාකිරීම් නොපැනවීමට ලෝ.වෙ.සං. සාමාජිකයන් එකඟ වුණි.
- **කොවිඩ්-19 එන්නත් නිෂ්පාදනය කිරීම බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වලින් නිදහස් කිරීම** - මෙම අමාත්‍යාංශ තීරණය හේතුවෙන්, ඖෂධ නිපදවීමේ අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ශ්‍රී ලංකාව වැනි රටවලට, පේටන්ට් බලපත්‍ර දරන්නන්ගේ අයිතිවාසිකම් නොතකමින් එම රටවල් කොවිඩ්-19 එන්නත් නිෂ්පාදනය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීමට යටත්ව සහ වසර 5 ක කාල සීමාවක් සඳහා පේටන්ට් බලපත්‍ර අයිතිය වෙනුවෙන් ගෙවීමකින් තොරව විදේශීය ගණිය නිෂ්පාදයන්ගෙන් කොවිඩ් ආශ්‍රිත ඖෂධ නිෂ්පාදන අඩු පිරිවැයක් යටතේ ආනයනය කිරීමට හැකි වනු ඇත. එපමණක් ද නොව, රජයන් දෙකක් අතර එකඟතාව යටතේ අතිරික්ත නිෂ්පාදන අපනයනය කිරීමේ නම්‍යශීලිතාවය නිෂ්පාදනය කරන රටට හිමිවනු ඇත.
- **කොවිඩ් -19 වසංගතය සඳහා ලෝ.වෙ.සංවිධානයේ ප්‍රතිචාරය සහ අනාගත වසංගත සඳහා පූර්ව සූදානම** - මෙම තීරණයට අනුව, දැනට පවතින ලෝ.වෙ.ස. සුනම්‍යතාන්ගෙන් ඔබ්ටට ගොස් ගෙවුම් ශේෂ අර්බුදය සහ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ගැටලු ඇතුළුව, අනාගත වසංගත තත්ත්වයන්හිදී අභියෝග ගණනාවක් ආමන්ත්‍රණය කිරීම සඳහා සළුල විසඳුම්වලට එළඹීමට රටවලට හැකි වනු ඇත.
- **ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුම** - ජීව සමුද්‍රීය මත්ස්‍ය තොගවල තිරසරබව සහතික කිරීම පිණිස ධීවර අංශයට සපයනු ලබන ඉතාමත්ම හානිකර සහනාධාර තුරන් කිරීමේ අදහසින් මෙම ගිවිසුම පිළිබඳ අවසන් නිගමනයකට එළඹෙන ලදී. අනීතික, වාර්තා නොකරනු ලබන සහ නියාමනය නොකරනු ලබන ධීවර ක්‍රියාකාරකම්වල නිරත සහ තම අනන්‍ය ආර්ථික කලාපය තුළ මත්ස්‍ය සම්පත් හීන වන ආකාරයෙන් සීමාව ඉක්මවා ධීවර කටයුතු වල නියැළෙන ධීවරයන් වෙත ලබා දෙමින් පවතින සහාය ඉවත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනයවෙමින් පවතින රටවලට වසර දෙකක සහන කාලයක් ලබා දේ. මෙම ගිවිසුම බලාත්මක කිරීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකක් එය පිළිගැනීම අවශ්‍ය වේ.

රටේ දැනට පවතින තත්ත්වය හේතුවෙන් ගරු අමාත්‍යාතුමන්ට සහ අමාත්‍ය සම්මේලනයේ ශ්‍රී ලංකා නීයෝජිත පිරිසේ කොළඹ සිටින අනෙකුත් සාමාජිකයන්ට පුද්ගලිකව මෙම සාකච්ඡා සඳහා යාමට නොහැකි විය. ඔවුන් වෙනුවෙන්, ජිනීවාහි සිටින ලෝ.වෙ. සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතවරයා මෙම සම්මේලනයේදී ශ්‍රී ලංකා නියෝජිත පිරිසට නායකත්වය ලබා දෙන ලදී. දොළොස්වන අමාත්‍ය සම්මේලනයේ සම්මත කරගත් අමාත්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා අභිලාෂයන් නිරූපණය කරනු වස් වාණිජ දෙපාර්තමේන්තුව ජිනීවාහි ශ්‍රී ලංකා දූත මණ්ඩලය සමග අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. අමාත්‍ය සම්මේලනයට පූර්වයෙන් පැවැති සියලු ප්‍රාරම්භක සාකච්ඡාවන්ට ද ජිනීවාහි ශ්‍රී ලංකා දූත මණ්ඩලය සහභාගි වූ අතර රටේ අභිලාෂයන් ආරක්ෂා කරනු පිණිස අවශ්‍ය අදහස් ලබා දීම පිණිස වාණිජ දෙපාර්තමේන්තුව අදාළ රේඛීය අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණය පවත්වා ගන්නා ලදී.

II. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ ගිවිසුමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම (WTO-TFA)

ලෝ.වෙ.සංවිධානයේ වෙළඳාම පහසුකරණ ගිවිසුම ක්‍රියාවට නැංවීම සිදු කරමින් පවතින අතර බහුපාර්ශවික හා ද්විපාර්ශවික ආධාර ලබා දෙන්නන් සහයෝගය ලබා දෙන මූලාරම්භයන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. වෙළඳාම පහසුකරණ ජාතික කමිටු ලේකම් කාර්යාලයේ කටයුතු ඵලදායී අන්දමින් ඉටු කිරීම පිණිස සහ බහුපාර්ශවික මට්ටමේදී ඇති කර ගත් බැඳීම්වලට අනුව වෙළඳාමම පහසුකරණ ගිවිසුම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම පිණිස වසර ආරම්භයේ සිට, එම කමිටු ලේකම් කාර්යාලයේ කර්තව්‍යයන් කිහිපයක් වාණිජ දෙපාර්තමේන්තුව සමග හවුල්කාරිත්වයෙන් සිදු කරන ලදී. වෙළඳාම පහසුකරණ ජාතික කමිටු ලේකම් කාර්යාලයේ කර්තව්‍ය විශේෂයෙන්ම වෙ.ප.ගි. ක්‍රියාත්මක කිරීමේ මට්ටම මැනීම සඳහා හඳුන්වා දුන් මූලාරම්භයන් සඳහා වාණිජ දෙපාර්තමේන්තුව සම්බන්ධවීමත් සමගින්, ක්‍රියාත්මක කිරීමේ සමස්ත මට්ටම 2022 දෙසැම්බර් අවසානය වන විට 73% ක් ලෙස හඳුනාගන්නා ලදී.

ජිනීවාහි ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ (ITC) සහ ජර්මනියේ ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා ෆෙඩරල් අමාත්‍යාංශයේ (BMZ) තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇතිව අනාගතයේදී වෙ.ප.ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට පහසුකම් සැපයීම සඳහා මෘදුකාංග විසඳුමක් සංවර්ධනය වෙමින් පවතී.

වෙළඳාම පහසුකරණ ජාතික කමිටුවේ කාර්තුමය රැස්වීම් වාණිජ අධයක්ෂ ජනරාල්වරයාගේ සම සභාපතිත්වය යටතේ පවත්වනු ලැබූ අතර වඩාත්ම අදාළ කරුණු විශේෂ අවධානයක් යොමු කරමින් සාකච්ඡා කරන ලදී. මෙම රැස්වීම්වලදී නිරන්තරයෙන් රාජ්‍ය අංශය වෙත යොමුවන අවධානය පුද්ගලික අංශය කෙරෙහි යොමු කළ අතර ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාවට නැංවීම කඩිනම් කරන ලදි. ප්‍රත්‍යන්ත නියෝජිතායතනවල ඉල්ලීම පරිදි, වෙ.ප.ගිවිසුමේ 6.1 සහ 6.2 යන වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා කාල දිගුවක් ඉල්ලමින් දැනුම්දීමක් වෙළඳාම පහසුකරණය පිළිබඳ ලෝ.වෙ. සංවිධාන කමිටුව වෙත 2022 අගෝස්තු මස 31 දින යොමු කරන ලදී.

III. 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත ක්‍රියාත්ම කිරීම

2020.10.19 දින සිට බලාත්මක වූ 218 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ 14 සහ 64 වගන්ති ප්‍රකාරව ප්‍රපාතන විරෝධී හෝ ප්‍රතිතෝලන ක්‍රියාමාර්ග පැනැවීම පිළිබඳව විමර්ශනයක් ආරම්භ කිරීම ඉල්ලා සිටිමින් දේශීය කර්මාන්තය විසින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අයදුම්පත්‍ර වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය. ඉහත පනතේ 45 වන වගන්තිය ප්‍රකාරව, මිල පොරොන්දුවක් සඳහා පටිපාටිය ද ගැසට් නිවේදනයක් ලෙස පළ කිරීම අවශ්‍ය වේ. නිතිපති දෙපාර්තමේන්තුවේ අනුමතිය සහිතව සකස් කරන ලද මෙම නියෝග නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශෝධනය කරන ලදී.

2022.12.22 දින පළ කරන ලද අංක 2311/42 දරන ගැසට් නිවේදනයෙහි, ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු සහ ආරක්ෂණ පියවර පිළිබඳ පනත් දෙක වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස ලැයස්තු ගත කරන ලදී. ඒ අනුව, එකී නියෝගවල අවසන් කෙටුම්පත් අමාත්‍යාංශයේ නීති හා අණපනත් යටතේ ප්‍රකාශයට පත් කිරීම පිණිස වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත භාෂා ත්‍රිත්වයෙන්මු යොමු කරන ලදී.

තවද, ඉහත නියෝගවල මෙහෙයුම් පරිවයන්හි ඇතුලත් කිරීමට නියමිත වෙළඳ ප්‍රතිකර්ම විමර්ශන සඳහා මෙහෙයුම් අත්පොතේ සමාලෝචනය සම්පූර්ණ කර ඇති අතර එය ප්‍රකාශයට පත් කිරීම අපේක්ෂාවෙන් පසුවේ.

IV. ශ්‍රී ලංකාවට එරෙහිව ආරම්භ කරන ලද වෙළඳ ප්‍රතිකර්ම විමර්ශනවලට ප්‍රතිචාර දැක්වීම

ඉන්දියාව, ඕමානය, ශ්‍රී ලංකාව, තායිලන්තය සහ තුර්කිය යන රටවලින් ඇතැම් වානේ ආණ ආනයනය මත ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන ක්‍රියාමාර්ග පැනවීම පිළිබඳ විමර්ශනයක් 2022 ජනවාරි 19 වැනි දින ඇ.එ.ජනපද වාණිජ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. විමර්ශන ක්‍රියාදාමයට සහභාගිවීමෙන් වාණිජ දෙපාර්තමේන්තුව දේශීය කර්මාන්තයට සහ එකී නිෂ්පාදනය නිෂ්පාදනය කොට අපනයන කරන සමාගම වූ ට්‍රිනිටි ස්ටීල් පුද්ගලික සමාගමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙනු ලැබීය.

ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, මුදල් අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව වැනි රාජ්‍ය ආයතන සමඟ වාණිජ දෙපාර්තමේන්තුව රැස්වීම් කිහිපයක් පැවැත්වූ අතර විමර්ශනයට අදාළ දත්ත සහ තොරතුරු රැස් කර ඇත. වෙළඳ අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, ප්‍රතිතෝලන ක්‍රියාමාර්ග පැනවීම පිළිබඳ විමර්ශනයේදී රජය වෙනුවෙන් පෙනී සිටීමට සහ කරුණු දැක්වීමට එක්සත් ජනපදය පදනම් කරගත් නීතිමය සමාගමක් (GDLSK නීති සමාගම) පත් කරන ලදී.

ප්‍රපාතන විරෝධී විමර්ශනයේ මූලික මට්ටමේ විමර්ශනයේදී, ශ්‍රී ලංකාවෙන් ඇමරිකා එක්සත් ජනපදයට වානේ ආණ ආනයනය කිරීම අවම මට්ටමෙන් ඔබ්බට නොයන බව ඇමෙරිකානු බලධාරීන් සොයා ගත් අතර, ඒ අනුව විමර්ශනය අවසන් කරන ලදී.

V. ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය කමිටු සහ මණ්ඩල යටතේ සාකච්ඡා සඳහා සහභාගි වීම

ජිනීවා හි ලෝ.වෙ. සංගමයේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය, වාණිජ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් නියෝජනය කරනු ලබන අතර, දිනපතාම නිත්‍ය ලෝ.වෙ.සංගම් කමිටු සහ මණ්ඩල යටතේ සාකච්ඡා සඳහා සහභාගී වීම සහ පසු විපරම් කිරීම සිදු කරයි. වසර තුළ, ජිනීවා හි දූත මණ්ඩලය ශ්‍රී ලංකාවට අදාළ ගැටළු සම්බන්ධයෙන් ජිනීවා පදනම් කරගත් බුද්ධි මංඩල සමඟ බහුපාර්ශ්වික රැස්වීම් 350 ක්, ද්විපාර්ශ්වික/කණ්ඩායම් රැස්වීම් 100 ක් සහ අන්තර්ක්‍රියා 25 කට පමණ සහභාගී වී ඇත. රටේ අභිලාෂයන් ආරක්ෂා කිරීම සඳහා, දූත මණ්ඩලය ධීවර සහනාධාර, කෘෂිකර්මාන්තය, බුද්ධිමය දේපළ හිමිකම් අත්හැරීම, විද්‍යුත් වාණිජ්‍යය, වෙළඳ පහසුකම් සැපයීම, යනාදී වශයෙන් අමාත්‍ය මට්ටමින්, තානාපති මට්ටමින් සහ තාක්ෂණික මට්ටමේ රැස්වීම් වලදී දළ වශයෙන් සැලකිය යුතු මැදිහත්වීම් 45ක් සිදු කර ඇත.

නිත්‍ය ලෝක වෙළඳ සංගම් කමිටු සහ සභා වලදී ශ්‍රී ලංකාවේ අභිලාෂයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- කෘෂිකර්මය පිළිබඳ කමිටුවේදී, විශේෂයෙන්ම පොදු කොටස් දැරීම සඳහා ස්ථිර විසඳුම්, විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය සහ ආහාර සුරක්ෂිතතා ගැටළු වැනි ප්‍රධාන කෘෂිකාර්මික ගටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අභිලාෂයන් පිළිබඳව කරුණු දක්වන ලදී.

- කොවිඩ් වසංගතයේ බලපෑම මැඩපැවැත්වීම සඳහා හදුන්වා දුන් ශ්‍රී ලංකාවේ ආනයන ප්‍රතිපත්ති, එනම් ආනයන සීමා කිරීම්, රට තුළට ආනයනය කරන ලද තෝරාගත් නිෂ්පාදන සඳහා, තහනම් කිරීම් සහ ආනයන බලපත්‍ර. ක්‍රියාමාර්ග ආරක්ෂා කරන ලදී

- ධීවර සහනාධාර විනයගත කිරීම පිළිබඳ ලෝක වෙළඳ සංවිධානයේ නව ගිවිසුමේ සාකච්ඡා සඳහා සහභාගී වූ අතර සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විශේෂ සහ අවකලන සැලකීම තුළින් සාකච්ඡාවලදී රටේ අභිලාෂයන් සැලකිය යුතු ලෙස ආරක්ෂා කිරීමට හැකි වී ඇත.

- වෙළඳාම සඳහා තාක්ෂණික බාධක (TBT) කමිටු රැස්වීම්වලදී, එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ 2021 අංක 1 දරන ජාතික පාරිසරික නියෝග (ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනාගැනීමේ ප්‍රමිති) සම්බන්ධයෙන් කරුණු විමසා සිටින ලදී. පරිසර අමාත්‍යාංශයේ අදහස් විමසා ඇ.එ.ජනපදයට අවශ්‍ය පැහැදිළි කිරීම් සැපයීමට වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු යොදන ලදී.

- රේගු තක්සේරු කිරීමේ කමිටුවේදී, පාවිච්චි කරන ලද මෝටර් රථවල රේගු වටිනාකම ශ්‍රී ලංකාව තීරණය කිරීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය සිය කනස්සල්ල මතු කරන ලදී. ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණයෙන් ඇමරිකා එක්සත් ජනපදයට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දෙන ලදී.

- ලංකා තේ සඳහා වෙළඳපල ප්‍රවේශය සුරක්ෂිත කිරීම සඳහා ලෝක වෙළඳ සංවිධානය වෙත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් අසර්බයිජානය සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවලට සහභාගී විය.

- වෙළඳපල ප්‍රවේශය පිළිබඳ කමිටුව හරහා ශ්‍රී ලංකාවේ ආනයන ගාස්තු දත්ත සහ ආනයන සංඛ්‍යාලේඛන ලෝක වෙළඳ සංවිධානයේ ඒකාබද්ධ දත්ත ගබඩාවට ඉදිරිපත් කරන ලදී.

- ශ්‍රී ලංකා රේගුවේ එකඟතාවය ඇතිව, වෙළඳපල ප්‍රවේශය පිළිබඳ කාරක සභාව හරහා HS2017 හි ශ්‍රී ලංකාවේ HS අතිස්ථාපන ගොනුව සඳහා නිෂ්කාශනය ලබා දෙන ලදී.

VI. ලෝ.වෙ.සංවිධානයේ 2022 වෙළඳාම සඳහා ආධාර ගෝලීය සමාලෝචනය

රටේ වෙළඳ හා සංවර්ධන ප්‍රමුඛතා සහ පාරිසරික තිරසරභාවය සහ කාන්තාවන් ආර්ථිකව සවිබලගැන්වීම සඳහා සහායවීමේදී ලෝ.වෙ.ස. නායකත්වය දරන වෙළඳාම සඳහා ආධාර මූලාරම්භයට ඉටු කළ හැකි කාර්යභාරය අවධාරණය කරමින් ලෝ.වෙත සංවිධානයේ වෙළඳාම සඳහා ආධාර ගෝලීය සමාලෝචනයේ ප්‍රශ්නාවලියට පිළිතුරු ලබා දීමට වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු යොදන ලදී. කාන්තා හා ළමා සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාවේ අදහස් විමසා මෙම ස්වයං ඇගයීම් ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර දක්වනු ලැබීය.

VII. තාක්ෂණික සහාය

- **සුසංගත පද්ධති අතිස්ථාපනය පිළිබඳව ශ්‍රී ලංකා නිලධාරීන් සඳහා අතත්‍ය ජාතික වැඩමුළුව** - ශ්‍රී ලංකාවේ බද්ධ තීරු බදු උපලේඛනයේ සුසංගත පද්ධති ප්‍රතිස්ථාපනය පිළිබඳව ජිනීවා හි ස්ථිර දූත මණ්ඩලය සහ ලෝ.වෙ.සංගම් මහාලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා බලධාරීන් සඳහා උපදෙස්

ලබා දීමේ සුවිශේෂ අතත්‍ය රැස්වීමක් 2022 අගෝස්තු 23 වැනි දින සංවිධානය කරනු ලැබීය. මුදල් අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ වාණිජ දෙපාර්තමේන්තුව යන ආයතනවලින් සහභාගිකයන් 22 දෙනකු මෙම වැඩමුළුවෙන් ප්‍රතිලාභ ලැබීය.

- **ගෙවීම් හුවමාරු සේවා නිර්බාධකකරණය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විකල්ප පිළිබඳ ජාතික වැඩමුළුව** - සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ලෝ.වෙ.ස. තාක්ෂණික සහාය වැඩසටහන හරහා ලබාගත් ලෝ.වෙ.සංගමයේ ලේකම් කාර්යාලයේ විශේෂඥයන්ගේ සහභාගිත්වය සහිතව ශ්‍රී ලාංකික පාර්ශවකරුවන් සඳහා සුවිශේෂ අතත්‍ය වැඩමුළුවක් සංවිධානය කරන ලදී. සැසි තුනකින් පසුව පැවැත්වුණු ප්‍රශ්නෝත්තර සමන්විත වූ එය 2022 දෙසැම්බර් 12,20 සහ 21 යන දිනයන්හි පවත්වනු ලැබීය. රාජ්‍ය හා පුද්ගලික අංශයෙන් සහභාගිකයන් 80 දෙනෙකුට වැඩි පිරිසක් ඒ සඳහා ලියාපදිංචි වී තිබුණි.

- වාණිජ දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරියකුට 2022 ඔක්තෝබර් මස පැවැත්වීමට නියමිතව තිබූ වෙළඳ භාණ්ඩ හා සංවර්ධනය පිළිබඳ බහු වර්ෂ විශේෂ රැස්වීමේ සාකච්ඡා මණ්ඩප සාමාජිකයකු ලෙස සහභාගිවීමට අවශ්‍ය මූල්‍යාධාර සපයා ගන්නා ලදී.

- ලෝ.වෙ.සංවිධානයේ ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද වැඩමුළු දෙකකට වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය කරන ලදී. වාණිජ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් දස දෙනෙකුට (11) එම දැනුම බෙදාගැනීමේ වැඩසටහන් සඳහා සහභාගී වීමට අවස්ථාව හිමි විය.

VIII. වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD)

වෙ.ස.එ.ජා.සම්මේලනයේ 15 වැනි චතුර්වාර්ෂික සමුළුවෙන් පැන නැගුණු පසුවිපරම් ක්‍රියාමාර්ග එම සම්මේලනයේ නිත්‍ය ආයතනවලදි සාකච්ඡාවට ගන්නා ලදී. ඒ අනුව, වාණිජ දෙපාර්තමේන්තුව සහ ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය ශ්‍රී ලංකාවේ අදාළ රේඛීය ආයතනවල විශේෂඥයින් පහත සඳහන් සිදුවීම්වලට සහභාගී වීමට කටයුතු යොදා ඇත.

- ඊ-වාණිජ්‍යය සහ ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥ කණ්ඩායම (අපනයන සංවර්ධන මණ්ඩලය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) හි විශේෂඥයින් සහභාගී විය)
- පාරිභෝගික ආරක්ෂණ නීතිය සහ ප්‍රතිපත්ති පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥ කණ්ඩායමේ 6 වැනි සැසිය (පාරිභෝගික කටයුතු අධිකාරියේ ප්‍රවීණයන් සහභාගී විය)
- වෙළඳ භාණ්ඩ සහ සංවර්ධන පිළිබඳ බහු-වසර විශේෂඥ රැස්වීම (කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රවීණයන් සහභාගී විය. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සහභාගි වූ විශේෂඥයා විද්වත් කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කළ අතර ඇයගේ සහභාගීත්වය සඳහා පූර්ණ අරමුදල් සපයනු ලැබුවේ UNCTAD ලේකම් කාර්යාලය විසිනි)
- දකුණු-දකුණු ඒකාබද්ධතාවය සහ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ ව්‍යාපෘතිය: තීරය සහ මාර්ග මූලාරම්භයේ ප්‍රධාන භවුල්කාර රටවල ව්‍යුහාත්මක පරිවර්තනය වැඩි දියුණු කිරීම (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ප්‍රවීණයන් සහභාගී විය)
- වසංගත වලට එරෙහිව වරාය ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම (ශ්‍රී ලංකා රේගුවේ විශේෂඥයින් සහභාගී විය)

- UNCTAD හි වෙළඳ හා සංවර්ධන කොමිෂන් සභාවේ 13 වන සැසිවාරය (ශ්‍රී ලංකාවේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ විශේෂඥයින් සහභාගී විය)
- ආයෝජන, ව්‍යාපාර සහ සංවර්ධන කොමිෂන් සභාවේ 13 වැනි සැසිවාරය (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රවීණයන් සහභාගී විය)
- සංවර්ධනය සඳහා මූල්‍යකරණය පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥ කණ්ඩායමේ 6 වැනි සැසිය (මුදල් අමාත්‍යාංශයේ ප්‍රවීණයන් සහභාගී විය)

තවද, UNCTAD වෙළඳ හා සංවර්ධන මණ්ඩලය, වැඩසටහන් සැලැස්ම සහ වැඩසටහන් කාර්ය සාධනය පිළිබඳ ක්‍රියාකාරී පක්ෂය සහ වෙළඳ හා සංවර්ධන කොමිෂන් සභාව ඇතුළු විවිධ UNCTAD සංසද සහ ආයතන සඳහා ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය නිතිපතා සහභාගී විය.

IX. වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල

වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදලේ පාලක මණ්ඩලයේ 34 වන වාර්ෂික රැස්වීම 2022 දෙසැම්බර් 13-14 දිනවල පවත්වන ලද අතර ශ්‍රී ලංකා ආණ්ඩුකාරවරයාට පෞද්ගලිකව රැස්වීමට සහභාගී වීමට නොහැකි වූ බැවින් නෙදර්ලන්තයේ හේග් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය නියෝජනය කළේය. පූර්ණ සැසියේදී ඉදිරිපත් කිරීමට නියමිත රටේ වත්මන් ප්‍රමුඛතා පිළිබිඹු කරන කෙටුම්පත් ප්‍රකාශයක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

ව්‍යාපෘති යෝජනා සඳහා පොදු අරමුදලේ 21 වන දින කැඳවීමේදී වෙළඳ කුටි, නිෂ්පාදන සංගම් සහ රේඛීය අමාත්‍යාංශ අතර ප්‍රචාරයක් ලබා දෙන ලදී. තවද, 2023/24 කාලසීමාව සඳහා පොදු අරමුදලේ උපදේශක කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයෙන් වාණිජ දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කර නාමයෝජනා ඉදිරිපත් කරන ලදී.

1.5.2 ද්විපාර්ශවික කටයුතු අංශය

I. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

2000 මාර්තු 01 දින සිට බලාත්මක වූ ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA), විශාල දැවැන්ත ඉන්දියානු වෙළඳපොළට ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් අඛණ්ඩව ලබා දෙනු ලැබේ. 2022 වසරේදී ශ්‍රී ලංකාව ඉන්දියාවට කරන ලද අපනයනවල මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 847ක් ලෙස වාර්තා වී ඇත. කොවිඩ්-19 වසංගතයේ බලපෑමෙන් ප්‍රකෘතිමත් වීමේ ප්‍රබල සංඥාවක් පෙන්නුම් කරමින් 2021 දී 6.5% ක වැඩිවීමක් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව 2022 දී ඩොලර් මිලියන 560 ක් වටිනා භාණ්ඩ ඉන්දියාවට අපනයනය කර ඇත. 2022 වසර තුළ ශ්‍රී ලංකාව ඉන්දියාවට කරන ලද අපනයනවලින් 66%ක් ගිවිසුමේ තීරුබදු සහන යටතේ සිදු කර ඇති බව සඳහන් කිරීම වටී.

2022 වසරේ ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් සිදුකළ ආනයනවල මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 4.4 ක් විය. 2022 වසරේ නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව සිදු කළ ආනයනය ඇමෙරිකානු ඩොලර් මිලියන 109ක් වූ අතර 2021 වසර සඳහා නිදහස් වෙළඳ ගිවිසුමේ ආනයන වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 189.85ක් ලෙස වාර්තා විය. ඒ අනුව, ගිවිසුමේ තීරුබදු සහන යටතේ 2022 වසර තුළදී ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් ආනයනය කර ඇත්තේ 3%කට ආසන්න ප්‍රමාණයක් පමණි.

සත්ව ආහාර, ගම්මිරිස්, පුවක්, අපද්‍රව්‍ය තෙල්, ඉවතලන කඩදාසි සහ කඩදාසි බෝඩ්, පරිවරණය කළ තඹ වයර් සහ කේබල්, බනිජ ජලය සහ වාතනය කළ ජලය, කපු සායම් කළ ගෙතූ හෝ ගෙතූ රෙදි, පුන්නක්කු, සත්ව හෝ එළවළු මේද සහ තෙල් සහ ඒවායේ කොටස්, බයිසිකල්, අත්‍යවශ්‍ය තෙල් සහ ගෘහ භාණ්ඩ ආදිය නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරන ප්‍රධාන අපනයන භාණ්ඩ අතරට ඇතුළත් වේ.

තවද, ශ්‍රී ලංකාවේ ඇඟලුම් නිෂ්පාදන සඳහා තීරු බදු අනුපාත කෝටාව (TRQ) හරහා වසරකට කැලි මිලියන 8ක් සඳහා ගිවිසුම යටතේ තීරුබදු රහිත ප්‍රතිලාභය ලැබේ. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ උපයෝගිතා අනුපාතය ඩොලර් මිලියන 42.69 ක වටිනාකමකින් යුත් කැලි මිලියන 8 කින් 99.97% ක් විය.

II. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2005 සිට බලාත්මක වූ පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) මගින් ද දෙරට අතර සිදුකරන ද්විපාර්ශවික වෙළඳ කටයුතු අභිවර්ධනය සඳහා දායකත්වයක් ලබා දී ඇත. 2022 වර්ෂයේදී පාකිස්ථානයට සිදුකරන ලද අපනයනවල මුළු වටිනාකම ඇ.ඩො. මිලියන 77.84 ක් වූ අතර 2021 වසරේදී එය ඇ.ඩො. මිලියන 91.86 ක් විය. නිදහස් වෙළඳ ගිවිසුම යටතේ 2022 වසරේ පාකිස්ථානයට සිදු කළ අපනයන ඇ.ඩො. මිලියන 55.26 ක් වූ අතර 2021 වසරේදී එය වාර්තා වූයේ ඇ.ඩො. මිලියන 62.25 ක් ලෙසය. ඒ අනුව, 2022 වසරේදී පාකිස්ථානයට සිදු කළ මුළු අපනයනවලින් 71% ක් සිදු කර ඇත්තේ නිදහස් වෙළඳ ගිවිසුම යටතේය. 2021 වසරේදී ඇ.ඩො. මිලියන 394.34 ක් වූ පාකිස්ථානයෙන් ශ්‍රී ලංකාව සිදු කළ මුළු ආනයනවලට සාපේක්ෂව 2022 වසරේදී සිදු කළ ආනයනවල මුළු වටිනාකම ඇෙ.ඩා.මිලියන 342.32 ක් ලෙස වාර්තා විය. නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව පාකිස්ථානයෙන් සිදු කළ ආනයන ඇ.ඩො. මිලියන 12.06 ක් වූ අතර 2021 වසරේදී එම වටිනාකම වාර්තා වූයේ ඇෙ.ඩා. මිලයන 12.32 ක් ලෙසය.ඒ අනුව, පාකිස්ථානයෙන් සිදු කළ ශ්‍රී ලංකාවේ ආනයන්ගෙන් නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කර ඇත්තේ ආසන්න වශයෙන් 4% ක් පමණි.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කළ අපනයන අතර ප්‍රධාන නිෂ්පාදන වනුයේ බුලත්, දුම්ගසන ලද ස්වභාවික රබර්, විද්‍යුත් ශබ්ද හෝ දෘශ්‍ය සංඥා උපකරණ කොටස්, පොල්, ටිවයින් නූල්, යොත් කැරළි, ලණු හා කේබල්, ඇස්බැස්ටෝස්, රැළි තහඩු, ඉවතලන තෙල්, කොප්පරා, ශල්‍ය අත්වැසුම්, දීසිදි පොල් ආදියයි.

නිදහස් වෙළඳ ගිවිසුම යටතේ, පාකිස්ථානයෙන් වාර්ෂිකව මෙට්‍රික් ටොන් 6,000 ක බාස්මතී සහල් සඳහා තීරු බදු රහිත ප්‍රතිලාභ ශ්‍රී ලංකාව ලබා දෙයි. බතලේගොඩ සහල් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය විසින් නිර්දේශ කරනු ලබන අවම ප්‍රමිතිවලට අනුකූලවීමට යටත්ව රාජ්‍ය සහ පුද්ගලික අංශ විසින් නිදහස් වෙළඳ ගිවිසුම යටතේ බාස්මතී සහල් මෙට්‍රික් ටොන් 6,000 ක වාර්ෂික තීරු බදු රහිත කෝටාවක් අපනයනය කිරීම 2022 ඔක්තෝබර් 4 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීය. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත තීරු බදු නිදහස් කිරීම නිර්දේශ කිරීම මගින් එකී කෝටාව ආනයනය කිරීම පිණිස වාණිජ දෙපාර්තමේන්තුව පහසුකම් සපයයි.

වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අදහස් විමසා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පාකිස්ථානයට තේ සඳහා ශූන්‍ය බදු සහිත මෙට්‍රික් ටොන් 10,000 තිරු බදු කෝටාව උපයෝගී කර ගැනීම උපරිම කිරීම පිණිස තේ සම්බන්ධයෙන් නිෂ්පාදන විශේෂිත රීති සඳහා සම්මුති සාකච්ඡා කිරීමේ නිරතව සිටියි. 2022 දෙසැම්බර් 15 වැනි දින පවත්වනු ලැබූ පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ, ආයෝජන සහ රථ වාහන අංශය පිළිබඳ 3 වැනි ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේදි මෙම කරුණ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස අනු කමිටුවක් ස්ථාපිත කිරීමට යෝජනා කරනු ලැබීය.

පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ, ආයෝජන සහ රථ වාහන අංශය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම

පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ, ආයෝජන සහ රථ වාහන අංශය පිළිබඳ 3 වැනි ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම 2022 දෙසැම්බර් 15 වැනි දින මාර්ගගතව පවත්වනු ලැබීය. එහිදී වාණිජ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකා දූත මණ්ඩලයට නායකත්වය ලබා දුන් අතර පාකිස්ථානු දූත මණ්ඩලයට

නායකත්වය දෙනු ලැබුයේ පාකිස්ථානු වාණිජ අමාත්‍යාංශයේ නිදහස් වෙළඳාම පිළිබඳ අංශයේ සම ලේකම්වරයා විසිනි.

ඉහත සාකච්ඡා මණ්ඩප තුන තුළ සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු පහත පරිදිය.

i. පාකිස්ථාන පාර්ශවය විසින් සෘණ ලැයිස්තුව ඒකපාර්ශවිකව වෙනස් කිරීම පිළිබඳ කරුණ (රථ වාහන අංශයේ හා රථ වාහන නොවන අංශයේ නිෂ්පාදන)
ii. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන විවිධ නිෂ්පාදන මත නියාමන බදු පැනවීම.
iii. අගය එකතු කළ ලංකා තේ මත නිෂ්පාදන විශේෂිත රීති
iv. ශාක සනීපාරක්ෂක ගැටලු
v. ආයෝජන
vi. ලංකා තේ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම/ ලංකා තේ නාමය අවභාවිතය
vii. වාර්ෂිකව මෙට්‍රික් ටොන් 6,000 කෝටාව යටතේ පාකිස්ථානයෙන් බාස්මතී සහල් ආනයනය කිරීම
viii. පළතුරු හා එළවලු මත පැරා බදු/සෙස් බදු

තාක්ෂණික මට්ටමේදී ගැඹුරින් සාකච්ඡා කිරීම පිණිස බාස්මතී ගැටලුව සම්බන්ධයෙන් අනු කමිටුවක් හා ප්‍රභව ස්ථාන රීති (නිෂ්පාදන විශේෂිත රීති පිළිබඳ කරුණ) පිළිබඳ අනු කමිටුවක් ස්ථාපිත කිරීමට මෙම රැස්වීමේදී පාර්ශවයන් දෙකම එකඟ විය.

III. ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම 2018 ජනවාරි 23 දින අත්සන් තබන ලද අතර එය 2018 මැයි මස 1 වන දින සිට බලාත්මක විය. SLSFTA ගිවිසුම යනු භාණ්ඩ, සේවා, සනීපාරක්ෂක හා ශාක සනීපාරක්ෂක ක්‍රියාමාර්ග/ වෙළඳාම සඳහා තාක්ෂණික බාධක, ප්‍රභවස්ථාන රීති, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, රේගු පටිපාටිය සහ වෙළඳාම සඳහා පහසුකම් සැපයීම, රජයේ ප්‍රසම්පාදනය, තරඟකාරිත්වය, වෙළඳ ප්‍රතිකර්ම, ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව, පාරදෘශ්‍යභාවය පිළිබඳ විධිවිධාන, ආරවුල් නිරාකරණය සහ පොදු සහ අවසන් විධිවිධාන ආවරණය කරන විෂය පථයෙන් විස්තීරණ ගිවිසුමක් වන අතර එහි ඇමුණුමෙහි විදුලි සංදේශ, ඊ-වාණිජ්‍යය සහ මූල්‍ය සේවා පිළිබඳ පරිච්ඡේදයක් අන්තර් ගත වේ.

මෙම නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් තැබීමෙන් පසුව ගිවිසුමේ අන්තර්ගතය, යථා ක්‍රියාවලිය සහ ගිවිසුම පිළිබඳ අදහන් විමසීමේ මට්ටම සම්බන්ධයෙන් සිවිල් සමාජයේ විවිධ කොටස් සිය කණස්සල්ල පළ කරන ලදී. තවද, එම ගිවිසුමට අභියෝග කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් 09 ක් ගොනු කරන ලදී.

ගිවිසුම සම්බන්ධයෙන් ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ 02 ප්‍රකාරව, සංශෝධන සඳහා යෝජනා 18 ක් සමගින් ගිවිසුම පිළිබඳ සමාලෝචන ක්‍රියාදාමයක් පවත්වනු ලැබීය. සමාලෝචන ක්‍රියාදාමයේ තාක්ෂණික උපකාරක කමිටුවක් ද ස්ථාපිත කරනු ලැබූ අතර 2022 සැප්තැම්බර් මාසය අවසන් වන විට මෙම සංශෝධන 18 සඳහා ප්‍රතිචාර දක්වන්නන්ගෙන් සියලු පොරොත්තු ප්‍රතිචාර ලබා ගන්නා ලදී.

ගරු ජනාධිපතිතුමන් ලබා දුන් උපදෙස් අනුගමනය කරමින්, ගිවිසුම හැකි ඉක්මණින් ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම පිණිස වාණිජ දෙපාර්තමේන්තුවේ ද නිලධාරියෙකු ඇතුළුව සාමාජිකයන් 8 දෙනෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා පාර්ශවය සඳහා ඒකාබද්ධ කමිටුවක් ස්ථාපනය කරන ලදී. ඒකාබද්ධ කමිටුවේ රැස්වීම් වාණිජ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ අතර ශ්‍රී ලංකා පාර්ශවයේ ඒකාබද්ධ කමිටුවේ සංයුතිය පිළිබඳවා සටහනක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මුලසුන දරනු ලැබූ ඒකාබද්ධ කමිටුවේ ශ්‍රී ලංකා සාමාජිකයන්, රේඛීය නියෝජිතායතනවල අදහස් විමසා යෝජනා/ සංශෝධන සමාලෝචනය කරනු ලැබූ අතර එමගින් බොහෝ ගැටලු විසඳු අතර අතිරේක යෝජනා/ සංශෝධණ කිහිපයක් ද මතු කරන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවට අනුව, දැනට පවතින ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාවට නැංවීමේ කටයුතු ඉදිරියට පවත්වා ගෙන යාම පිණිස නෛතික අවහිරතා නොමැති අතර දැනට පවතින පාඨවල සංශෝධනයකින් තොරව ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ ඒකාබද්ධ කමිටුව සක්‍රීය කිරීම සහ සිංගප්පූරු පාර්ශවයේ අදහස් විමසා ඒකාබද්ධ කමිටුවේ රැස්වීම් කැඳවීම මගින් ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ඉල්ලා සිටිමින් 2022 දෙසැම්බර් 18 වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

IV. අනෙකුත් ද්විපාර්ශවික වෙළඳ ගිවිසුම් හා වරණීය වෙළඳ ගිවිසුම්

සමාලෝචිත කාලසීමාව තුළ වාණිජ දෙපාර්තමේන්තුව තත්ත්ව වාර්තා සහ අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් පිළියෙළ කර කෙටුම්පත් ක්‍රියාකාරී පෙළ සහ පෙර සාකච්ඡා වටයන්හිදී එකඟ වූ කරුණු ජනාධිපති ලේකම් කාර්යාලය, වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සහ විශේෂයෙන්ම අදාළ සියලු ආයතන හා පාර්ශවකරුවන් සමග ද්විපාර්ශවික හා නිදහස් වෙළඳ ගිවිසුම් සහ කලාපීය වෙළඳ ගිවිසුම් ඇතුළුව ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා නිල වශයෙන් විධිනියෝග ලබා දී ඇති ජාත්‍යන්තර වෙළඳාම් කාර්යාලයට සපයන ලදී.

දැනට, ජාත්‍යන්තර වෙළඳ කාර්යාලය විසින් ඉන්දියාව, චීනය සහ තායිලන්තය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා සම්බන්ධීකරණය කරන අතර දෙපාර්තමේන්තුව විසින් සාකච්ඡා නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සියලුම වාර්තා සහ අදහස් ලබා දී අදාළ අනු කමිටු නියෝජනය කළේය.

i. චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA)

චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) පිළිබඳ සාකච්ඡා 2014 සැප්තැම්බර් 16 වැනි දින රාජ්‍ය නායක මට්ටමින් දියත් කර ඇත. 2014-2017 කාලය තුළ සාකච්ඡා වට හයක් (6) සම්පූර්ණ කිරීමෙන් පසු 2017 මාර්තු මාසයේදී CSFTA සාකච්ඡා සම්පූර්ණයෙන්ම ඇණ හිටින ලදී.

වසර 20ක් පුරා මුළු තීරු බදු කාණ්ඩවලින් 75% කට ලිහිල්කරණ බැඳීමක් සහිතව චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා යළි ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සූදානම චීන රජය වෙත දැනුම්දීමට 2022 පෙබරවාරි 28 සහ 2022 අප්‍රේල් 25 යන දිනවල පැවැති රැස්වීම්වලදී අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය විධාන ලබා දෙන ලදී. තවද, ප්‍රධාන සාකච්ඡාකරු ලෙස අග්‍රාමාත්‍ය ලේකම්වරයා අනුමත කරමින් සහ දේශීය කර්මාන්තකරුවන්ගේ සංගම්වල නියෝජනය ලබා ගැනීම පිණිස ජාතික වෙළඳ සාකච්ඡා කමිටුවක් (NTNC) පත්කිරීමට ද නියෝග කරන ලදී.

සම්මුති සාකච්ඡා සඳහා තිරුබදු ලිහිල්කරණ වැඩසටහන (TLP) සම්පාදනය කිරීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් කැඳවනු ලැබූ ප්‍රාරම්භක රැස්වීම් පවත්වනු ලැබීය. වෙළඳ ගිවිසුමේ වෙනස් කෙටුම්පත් ඡේද යටතේ වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මුලසුන දරනු ලබන ප්‍රභවස්ථාන රීති සහ සහ වෙළඳ ප්‍රතිකර්ම පිළිබඳවලට අදාළව නව කමිටු දෙකක් ස්ථාපිත කර තිබේ.

අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් මුලසුන දරන ලද 2022 ජූනි 20 වැනි දින පැවැති ජාතික වෙළඳ සාකච්ඡා කමිටුවේ රැස්වීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩල තීරණ සහ නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ සමගින් චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ 6 වන (අවසාන) වටයේ සාකච්ඡාවල කාර්ය සටහන් සහ කාරක කෙටුම්පත් වාණිජ දෙපාර්තමේන්තුව විසින් අනුකමිටුවල සභාපතිවරුන් 9 දෙනා සමග බෙදා හදා ගන්නා ලදී. මේ අතර, අදාළ කමිටු සාමාජිකයින්ගේ තොරතුරු අග්‍රාමාත්‍ය කාර්යාලයට දැනුම් දෙන ලෙස අනුකමිටු සභාපතිවරුන්ගෙන් ඉල්ලා සිටින ලදී. ශක්‍යතා අධ්‍යයනයට අදාළව, නව ශක්‍යතා අධ්‍යයනයෙන් සොයාගත් කරුණු නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා යළි ආරම්භ කිරීම සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයෙන් බලපෑමක් නොකරන බැවින්, දැනට පවතින ශක්‍යතා අධ්‍යයනය යාවත්කාලීන නොකිරීමට එකඟ වන ලදී.

භාණ්ඩ පිළිබඳ සාකච්ඡා නැවත ආරම්භ කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් අත්සන් කරන ලද 2022 මැයි 5 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකාව විසින් තිරුබදු ලිහිල්කරණ වැඩසටහන පිළිබඳව සිදුකරන ලද යෝජනාවට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ ස්ථාවරයට සාපේක්ෂව චීනයේ පාර්ශවය පහත පරිදි තම ස්ථාවරය දැනුම් දුන්නේය.

	සැලකිල්ලට ගත් ප්‍රධාන කරුණු	චීනය	ශ්‍රී ලංකාව
1	තීරු බදු ලිහිල්කරණ වැඩසටහන - මුළු තීරු බදු කාණ්ඩ බැඳීම අඩු කිරීම	85%- මුළුමණින්ම ඉවත් කිරීම 5%- ඒධ වශයෙන් අඩු කිරීම 10% - සෘණ ලැයිස්තුව	75%- මුළුමණින්ම ඉවත් කිරීම 25% - සෘණ ලැයිස්තුව
2	මූලික ලිහිල්කරණ වැඩසටහන (බලාත්මක වීමේදී ඇතැම් තීරු බදු කාණ්ඩ සඳහා 0% තීරු බදු	ඒ හා සමාන ලිහිල්කරණ වැඩසටහනක් ඉල්ලා සිටිමින් චීනය ප්‍රතිචාර දැක්වීය.	අන්‍යෝන්‍ය නොවිය යුතු බවටත් ශ්‍රී ලංකාවට පමණක් විය යුතු බවටත් ශ්‍රී ලංකාව ඉල්ලීමක් කරන ලදී.
3	ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව	ඇතැම් ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා වඩා දීර්ඝ ක්‍රියාත්මක කිරමේ කාල සීමාවක් සහිත වැඩි නම්‍යශීලීත්වය	වසර 20.

ශ්‍රී ලංකා පාර්ශවයේ යෝජනාව සම්බන්ධයෙන් චීනයේ ස්ථාවරය වාසිදායක නොවූ බැවින්, CSFTA සඳහා සැලකිල්ලට ගත හැකි තීරු බදු ලිහිල්කරණ වැඩසටහන හා තීරු බදු කාණ්ඩ පිළිබඳ විකල්ප තේරීම් අන්තර්ගත විශ්ලේෂණ වාර්තාවක් සකස් කරන ලෙස භාණ්ඩ වෙළඳාම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපතිවරයාට උපදෙස් දෙන ලදී. වාණිජ දෙපාර්තමේන්තුව, කර්මාන්ත අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ඒ ඒ වෙළඳ මණ්ඩල සමග සහයෝගිතාවයෙන් CSFTA යටතේ තිරු බදු ලිහිල්කරණ වැඩසටහන සහ මූලික ලිහිල්කරණ වැඩසටහන සඳහා විකල්ප තේරීම් සම්බන්ධයෙන් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සොයා බලමින් සිටීත

ii. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම සම්බන්ධයෙන් වන සාකච්ඡා 2016 අගෝස්තු මාසයේදී දියත් කරනු ලැබූ අතර සාකච්ඡා වට 11 ක් පවත්වන ලදී. අවසාන සාකච්ඡා වටය (11 වැනි) 2018 ඔක්තෝබර් 3 සිට 5 දක්වා කොළඹදී පවත්වනු ලැබීය.

2022 අගෝස්තු 25 වන දින පැවති රැස්වීමේදී, ජනාධිපති ලේකම්වරයා විසින් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත අපේක්ෂිත නිදහස් වෙළඳ ගිවිසුම් (චීනය සමඟ ඇති නිදහස් වෙළඳ ගිවිසුම හැර) සම්බන්ධයෙන් වගකීම බාර ගන්නා ලෙසත්, ETCA ඇතුළුව අපේක්ෂිත සියලු කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් නියෝග කරන ලදී. ඒ අනුව, ගරු ජනාධිපතිවරයා විසින් ලබා දුන් උපදෙස් පරිදි වත්මන් තත්ත්වය පිළිබඳව තොරතුරු ලබා ගැනීම සහ සාකච්ඡා නැවැත ආරම්භ කිරීම පිණිස වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා එය ETCA ගිවිසුමේ ක්‍රියාකාරී කණ්ඩායම් 08හි සියලු අනු ශාඛාවන්හි සභාපතිවරුන් වෙත සන්නිවේදනය කරන ලදී. එසේ ලැබුණු ප්‍රතිචාර, සියලු අදාළ ආයතන සහ පාර්ශවකරුවන් සමග ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් සහ කලාපීය වෙළඳ ගිවිසුම් ඇතුළුව ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වත්මනෙහි බලය පවරා ඇති ජාත්‍යන්තර වෙළඳ කාර්යාලය වෙත යවා ඇත.

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ETCA) නැවත ආරම්භ කිරීම 2022 දෙසැම්බර් සඳහා තාවකාලිකව යෝජිත බව ජාත්‍යන්තර වෙළඳ කාර්යාලයේ ප්‍රධාන සාකච්ඡාකරුවාණිජ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. ඒ අනුව, ETCA සාකච්ඡාවලට සමගාමීව ආමන්ත්‍රණය කර විසඳීමට නියමිත ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුමට ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත නොවිසඳුණු ගැටලු හඳුනා ගැනීම පිණිස සකස් කරන ලද

කාරණා ගොනුව පිළිබඳ නවතම තොරතුරු ලබා දෙන ලෙස වෙළඳ මණ්ඩල, සංගම් ඇතුළුව පාර්ශවකරුවන්ගෙන් වාණිජ දෙපාර්තමේන්තුව ඉල්ලා සිටින ලදී.

iii. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)

තායිලන්ත අග්‍රාමාත්‍යතුමන්ගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර දෙරටෙහි රාජ්‍ය නායකයන් විසින් 2018 ජූලි 12 වැනි දින 2018 ජූලි 12 වැනි දින නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා දියත් කරන ලදී. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම දියත් කිරීමෙන් අනතුරුව 2018 ජූලි 13 වන දින එම නිදහස් වෙළඳ ගිවිසුමේ පළමු සාකච්ඡා වටය කොළඹදී පැවැත්විණි. SLTFTA හි දෙවන සාකච්ඡා වටය 2018 සැප්තැම්බර් 19-21 දිනවල තායිලන්තයේ බැංකොක් නුවරදී පැවැත්විණි.

ගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් ප්‍රකාරව, අනු කමිටුවල සභාපතිවරුන් සමග බෙදා හදා ගැනීම පිණිස වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා ගිවිසුමේ කෙටුම්පත් (දෙවන වටය) කාරක පෙළ ජනාධිපති ලේකම් කාර්යාලය සමග බෙදා හදා ගන්නා ලදී.

2023 ජනවාරි මාසයේදී පවත්වනු ලබන තෙවන සාකච්ඡා වටය අතරතුර තායිලන්ත පාර්ශවය සමග සාකච්ඡා කිරීම පිණිස අදාළ පරිච්ඡේද පිළිබඳව ශ්‍රී ලංකාවේ ස්ථාවරය සකස් කිරීම පිණිස ඒ ඒ අනුකමිටුවල සභාපතිවරුන් සහ එම අනුකමිටුවල සාමාජිකයන් සහභාගි වන ලදී.

iv. බංගලාදේශය සමග වරණීය වෙළඳ ගිවිසුම

2021 මාර්තු 19 හා 20 දෙදින තුළ සිදුකළ ගරු අග්‍රාමාත්‍යතුමාගේ බංගලිදේශ සංචාරය අතරතුර, 2014 වසරේ සිට සාකච්ඡා කරමින් පවතින ද්විපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම හැකි ඉක්මණින් සාර්ථකව සම්පූර්ණ කිරීම පිණිස ඔවුන්ගේ බැඳියාව දෙරටෙහි නායකයන් විසින් අවධාරණය කරන ලදී. නිදහස් වෙළඳ ගිවිසුමක් උදෙසා පළමු පියවර ලෙස, නිෂ්පාදනවල කෙටි ලැයිස්තුවකින් ආරම්භ වන ද්විපාර්ශ්වික වරණීය වෙළඳ ගිවිසුමක් (PTA) අත්සන් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීමට දෙරටෙහි නායකයෝ එකඟ වූහ.

වරණීය වෙළඳ ගිවිසුමෙන් ආවරණය වනුයේ භාණ්ඩ වෙළඳාම පමණක් බවටත් ඉවත් කරනු හෝ අඩුකරනු ලබනුයේ මූලික රේගු ගාස්තු පමණක් බවටත් දෙපාර්ශවයම එකඟ වන ලදී. නිෂ්පාදන ආවරණය අංක-8 මට්ටමේ තීරු බදු කාණ්ඩ 100 කි. වත්මනෙහි ශ්‍රී ලංකාව හා බංගලාදේශය කලාපීය වෙළඳ ගිවිසුම් පහක එනම්, SAFTA, SAPTA, APTA, GSTP, සහ BIMSTEC පාර්ශවකරුවන් බැවින්, බංගලාදේශ ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු සහන හුවමාරුව සඳහා වන නිෂ්පාදන වනුයේ ඉහත ගිවිසුම් 5 හි සෘණ ලැයිස්තුවේ ඇති නිෂ්පාදන වේ.

ශ්‍රී ලංකාව තීරුබදු කාණ්ඩ 112 ක ලැයිස්තුවක් සහ බංග්ලාදේශය තීරුබදු කාණ්ඩ 131 ක ලැයිස්තුවක් ලෙස රටවල් දෙකම 2021 දෙසැම්බරයේ ඉල්ලීම් ලැයිස්තු හුවමාරු කර ගත්හග බංගලාදේශයේ ඉල්ලීම් ලැයිස්තුව පදනම් කර ගනිමින් ඔවුන් වෙත අපගේ පිරිනැමුම් ලැයිස්තුව සකස් කිරීමේ ක්‍රියාදාමයේ ශ්‍රී ලංකාව වත්මනෙහි නිරතව සිටී. අදාළ පාර්ශවකරුවන්ගේ උපදෙස් මත රේඛීය අමාත්‍යාංශ වෙතින් ලැබෙන ප්‍රතිචාර මත පදනම්ව, තීරුබදු සහන සඳහා ශ්‍රී ලංකාවට සලකා බැලිය හැක්කේ බංගලිදේශයේ තීරුබදු කාණ්ඩ 131 න් තීරුබදු කාණ්ඩ අටක් (08) පමණි. තීරු බදු අඩු කිරීම සඳහා සලකා බැලීමට රේඛීය අමාත්‍යාංශ විසින් එකඟ වී ඇති තවත් තීරු බදු කාණ්ඩ 06ක් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට (SCL) යටත් වන අතර එය කි.වෙ.ගිවිසුම් යටතේ එවැනි නිෂ්පාදන සඳහා තීරුබදු අඩු කිරීම සඳහා සාකච්ඡා කිරීමට ඉඩ ලබා නොදේ.

2022 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවේ බංගලාදේශ මහ කොමසාරිස්තුමන් විදේශ කටයුතු අමාත්‍යාංශයට පැමිණි අවස්ථාවේදී යෝජිත වරණීය වෙළඳ ගිවිසුම අත්සන් තැබීමේ කටයුතු නිමා කිරීම පිණිස කඩිනම් පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. එසේම 4 වැනි වෙළඳ සාකච්ඡා කමිටුව හැකිතාක් ඉක්මණින් පැවැත්වීමට ද තව දුරටත් යෝජනා කරන ලදී.

කෙසේ වෙතත්, බංගලාදේශයේ වත්මන් ඉල්ලීම් ලැයිස්තුව සඳහා තීරු බදු අඩුකිරීම් පිළිබඳව ශ්‍රී ලංකාවේ වත්මන් ස්ථාවරය සැලකිල්ලට ගත් කළ 4 වැනි වෙළඳ සාකච්ඡා කමිටු රැස්වීම කැඳවීම ප්‍රායෝගික නොවේ. එනමුත්, එකඟතා රාමුවේ අපේක්ෂිත වගන්ති (ප්‍රභවස්ථාන රීති සහ ගෙවුම් ශේෂ ක්‍රියාමාර්ග) අවසානයකට ගෙන ඒම පිණිස රැස්වීමට කැඳවීමට හැකියාව තිබේ. පවත්නා තත්ත්වය වාණිජ දෙපාර්තමේන්තුව ජනාධිපති ලේකම් කාර්යාලයට දැනුම් දුන් අතර ඒ යටතේ නව වෙළඳ සාකච්ඡා කමිටුව ස්ථාපිත කරනු ඇත.

V. ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළඳ ගිවිසුම

2016 මැයි 26 වැනි දින පැවති සමුළු රැස්වීමේදී ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළඳ ගිවිසුමක් ශ්‍රී ලංකාව විසින් යෝජනා කරන ලදී. 2017 දී යෝජිත වරණීය වෙළඳ ගිවිසුමේ ප්‍රතිලාභ පිළිබඳව දෙපාර්ශවයේම මූලික අධ්‍යයනයන් සිදු කරන ලදී. 2020 තුළ, වරණීය වෙළඳ ගිවිසුම පිළිබඳ සන්නිවේදන හුවමාරු විය.

පැරා තීරු බදු ලෙස සලකනු ලබන වරාය හා ගුවන් තොටුපොළ බද්ද සහ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය (සෙස් බද්ද) යන බදු නොමැතිව රේගු ආනයන බදු අඩු කිරීමට හෝ මුළුමණින්ම ඉවත් කිරීම පිණිස වන බැඳීමක් ශ්‍රී ලංකාව ඉටු කරන බැවින් රෙගු ආනයන බදු මත පමණක් තීරු බදු ලිහිල්කරණ සහිත වැඩසටහනකට ඉන්දුනීසියානු පාර්ශවය එකඟවන්නේ ද යන්න තහවුරු කර ගන්නා ලෙස 2021.11.16 දින වාණිජ දෙපාර්තමේන්තුව විදේශ අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් යෝජනා කරන ලද ඉහත සීමාවන්ට ඉන්දුනීසියානු පාර්ශ්වය එකඟ වී ඇති අතර, වරණීය වෙළඳ ගිවිසුමක් වෙළඳ සාකච්ඡා කමිටුවක යොමුකිරීම් අනුදේශවලට පාර්ශවයන් දෙකම ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වී ඇති අතර ඊ ළඟ පියවර වනුයේ දෙරටේ අමාත්‍යවරුන් විසින් ඒකාබද්ධ අමාත්‍යාංශ ප්‍රකාශනයක් හරහා වරණීය වෙළඳ ගිවිසුම දියත් කිරීමයි. යෝජිත වරණීය වෙළඳ ගිවිසුම පිළිබඳ ඉදිරි සාකච්ඡා ජාත්‍යන්තර වෙළඳ කාර්යාලය වෙත ලබා දී ඇති විධි නියෝගය ප්‍රකාරව එම කාර්යාලය විසින් සිදු කරනු ඇත.

VI. යුරෝපීය සංගමය සමඟ ශ්‍රී ලංකාවේ වෙළඳ සබඳතා

අ. යුරෝපීය සංගමය සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශවික වෙළඳාම

දශක ගණනාවකට වැඩි කාලයක් පුරා යුරෝපීය සංගමය සමඟ වෙළඳ සබඳතා පවත්වා ඇති අතර වසර ගණනාවක් මුළුල්ලෙහි ශ්‍රී ලංකාවේ අපනයන සඳහා විශාලතම අපනයන ගමනාන්තය වූයේ යුරෝපා සංගමයයි. 2020 පෙබරවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බ්‍රෙක්සිට් යටතේ එක්සත් රාජධානීය යුරෝපා සංගමයෙන් ඉවත්වීම හේතුවෙන්, යුරෝපීය සංගමය වෙත ශ්‍රී ලංකාවේ මුළු අපනයන 2020 වසරේදී ඇ.ඩො. බිලියන 2.3 දක්වා අඩු වූ අතර ඇ.එ.ජනපදයෙන් පසුව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන වෙළඳපොළ වනුයේ යුරෝපා සංගමයයි. කෙසේ වෙතත්, 2021 දී යුරෝපා සංගමයට ශ්‍රී ලංකාවේ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 2.95 දක්වා ඉහළ ගොස් ඇති අතර 2022 දී අපනයනය තවදුරටත් බිලියන 3.04 දක්වා වැඩි විය.

ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට අපනයනය කරන ප්‍රධානතම අපනයන භාණ්ඩය වූයේ ඇඟලුම් ය. යුරෝපා සංගමය වෙත අනෙකුත් ප්‍රධාන අපනයන නිෂ්පාදන වන්නේ ඝන ටයර් සහ වායව රබර් ටයර්, රබර් අත්වැසුම්, තේ, දුම්කොළ නිෂ්පාදන, පොල් නිෂ්පාදන, මාළු නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ කොටස්, වටිනා සහ අර්ධ වටිනා ගල් යනාදියයි. ඖෂධ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ, රෙදි සහ තන්තු, කඩදාසි නිෂ්පාදන යුරෝපා සංගමයේ ප්‍රධාන ආනයනයන් වේ. 2020 ට පෙර යුරෝපා සංගමය වෙතින් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ප්‍රධානතම භාණ්ඩ අතරින් එකක් වූයේ මෝටර් කාර් ය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව වාහන ආනයනය සඳහා පනවා ඇති තාවකාලික සීමා කිරීම් හේතුවෙන් යුරෝපා සංගමය වෙතින් මෝටර් රථ ආනයනය සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

ආ. යුරෝපා සංගමයේ GSP+ සහනය සහ එහි උපයෝජනය

ශ්‍රී ලංකාව 1971 සිට 2005 දක්වා යුරෝපා සංගමයෙහි සම්මත GSP යෝජනා ක්‍රමය උපයෝගී කර ඇත. මූලික මානව හිමිකම්, කම්කරු අයිතිවාසිකම් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනෙකුත් සම්මුතීන් 27 ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහ නිත්‍ය අධික්ෂණ සහයෝගිතාව ව්‍යාප්ත කිරීම මත යුරෝපා සංගමය විසින් ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි සංවර්ධනය වෙමින් පවතින රටවලට සහාය වීම සඳහා ලබා දෙන GSP+ පහසුකමේ ප්‍රතිලාභියකු බවට 2005 දී ශ්‍රී ලංකාව පත්ව ඇත. 2010 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ GSP+ සහනය අහිමි වූ අතර එතැන් සිට 2017 මැයි දක්වා ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කරන අපනයන සඳහා සම්මත GSP යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීය. ශ්‍රී ලංකාව 2017 මැයි 19 වන දින GSP+ නැවැත ලබා ගැනීමට සමත් විය.

එහි ආරම්භයේ සිටම, යුරෝපා සංගමයේ GSP යෝජනා ක්‍රමය, GSP සඳහා සුදුසුකම් ලබන සහ උපයෝගී කර ගනු ලබන නිෂ්පාදනවල මිල තරඟකාරිත්වය ඉහළ නැංවීම මගින් ශ්‍රී ලංකාවෙන් යුරෝපා සංගමය වෙත කරන සමස්ත අපනයන වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ අපනයන කළඹ විවිධාංගීකරණය කිරීමට GSP සහන උපකාරී විය.

2010 දී ශ්‍රී ලංකාවේ GSP+ උපයෝගිතා අනුපාතය 73% ක් වූ අතර එය වසරක් තුළ වාර්තා වූ ඉහළම ප්‍රතිශතයයි. 2010 අගෝස්තු සිට 2017 දක්වා GSP යටතේ යුරෝපා සංගමයට සිදුකරන ලද ශ්‍රී ලංකාවේ අපනයන යුරෝ බිලියන 2.1 සිට යුරෝ බිලියන 2.6 දක්වා ඉහළ ගොස් ඇති අතර GSP උපයෝගිතා අනුපාතය 2011 දී 66% සිට 2017 දී 55% දක්වා අඩු වූ නමුත් 2018 දී 58% සිට 2020 දී 64% දක්වා වැඩි වී ඇත. 2021 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා උපයෝගිතා අනුපාතය වාර්තා වූයේ 66% ක් ලෙසයි.

2013 වසරේදී හැර, 2011 සිට 2017 දක්වා කාලය තුළ අපනයන සාමාන්‍යයෙන් ඉහළ ගොස් ඇති අතර උපයෝගිතා අනුපාතය පහත වැටී ඇත. සාමාන්‍යයෙන් නිරීක්ෂණය වී ඇත්තේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ, වැඩි දියුණු කරන ලද GSP සහන සහ 1990 සිට 2010 දක්වා දශකය තුළ ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කළ අපනයනවල වර්ධනය අතර ධනාත්මක සහසම්බන්ධතාවයක් ඇති බවයි. මෙම ධනාත්මක සහසම්බන්ධය 2017 දී GSP+ නැවත ලබා ගැනීමෙන් පසුවද අඛණ්ඩව පවතී.

අංශ අනුව GSP+ උපයෝගිතාව ගත් කළ, GSP+ යටතේ නිෂ්පාදන කාණ්ඩ 7,000 කට වඩා ශුන්‍ය තීරුබදු මට්ටමක පැවැතුණ ද, පහත වගුවේ දක්වා ඇති පරිදි GSP+ යටතේ ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන අංශ කිහිපයක් කෙරෙහි පමණක් වැඩියෙන් සංකේන්ද්‍රණය වී ඇති බව දක්නට ලැබේ. ඇඟලුම් ක්ෂේත්‍රයේ පහළ උපයෝගිතාවය සඳහා හේතුව වන්නේ දැඩි ප්‍රභවස්ථාන නීතිවලට අනුකූලවීමේ පිරිවැය තීරුබදු සහනවලින් ලැබෙන ප්‍රතිලාභයට වඩා බෙහෙවින් වැඩි වීමයි.

GSP+ සහනය ලබා ගැනීමේ අරමුණ වන්නේ යුරෝපා සංගමයේ සාමාජික රටවලට සිදු කරන ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන වැඩි දියුණු කිරීමයි. යුරෝපා සංගමය වෙත රටක් විසින් සිදු කරන අපනයනය වර්ධනය වෙමින් ඒ සමගින්ම GSP ක්‍රමය උපයෝජනය අඩු වනු අවස්ථාවක, එයින් ඇඟවෙනුයේ රටක අපනයනය GSP+ මත දැඩි ලෙස රඳා නොපවතින බවයි. GSP+ තිරුබදු සහනය නොමැතිව ශ්‍රී ලංකාවේ අපනයනයන්ට තරඟ කළ හැකිවීම හිතකර වර්ධනයක් වේ.

2024 සිට 2034 කාල සීමාව සඳහා යුරෝපා සංගමයේ නව සාමාන්‍යකරණය කරන ලද වරණීය ක්‍රමවේදයක් (GSP) සඳහා ව්‍යවස්ථාදායක යෝජනාවක් 2021.09.22 දින යුරෝපීය කොමිෂන් සභාව අනුමත කරන ලදී. 2023 වසර අවසානයේදී යොදා ගැනීමට පෙර මෙම යෝජනාව යුරෝපීය පාර්ලිමේන්තුවේදී සහ මණ්ඩලයේදී

සාකච්ඡා කරනු/ විවාද කරනු ඇත. GSP යෝජනා ක්‍රම තුනක්, එනම් EBA, සම්මත GSP සහ GSP+ පවත්වා ගෙන යාමට යෝජනා කර ඇත.

ලියාපදිංචි අපනයනකරු පද්ධතිය (REX පද්ධතිය) යනු 2017 ජනවාරි 1 වන දින සිට යුරෝපා සංගමයේ සාමාන්‍ය මනාප ක්‍රමයට (GSP) අදාළ වන භාණ්ඩවල සම්භවය සහතික කිරීමේ පද්ධතියයි. ශ්‍රී ලංකාව 2018 ජනවාරි 1 වන දින සිට REX ක්‍රමය ක්‍රියාත්මක කළ අතර DoC REX පද්ධතිය සඳහා මාර්ගගත ලියාපදිංචිය සඳහා අපනයනකරුවන්ට පහසුකම් සපයයි.

ඈ. යුරෝපා සංගමයේ සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) සහ වෙළඳාම සඳහා තාක්ෂණික බාධා (TBT)

ආහාර සුරක්ෂිතතාව (ආහාර සහ ආහාර සඳහා කඩිනම් අනතුරු ඇඟවීම් පද්ධතිය -RASFF) සහ ශාක මත පදනම් වූ තොග (ශාක සෞඛ්‍යය සඳහා යුරෝපීය ශාක සනීපාරක්ෂක කඩිනම් අනතුරු ඇඟවීම් පද්ධතිය- EUROHYT) පිළිබඳ අනුකූල නොවීමේ අනතුරු ඇඟවීම්:

ආහාර සහ පෝෂණය පිළිබඳ කඩිනම් අනතුරු ඇඟවීමේ පද්ධතිය යනු යුරෝපා සංගමය තුළ ආහාර සුරක්ෂිතතාවය පිළබඳ ගැටලු වාර්තා කරන ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන කිහිපයක් යුරෝපා සංගමයෙන් ලැබෙන RASFF අනතුරු ඇඟවීම් ලබා ගැනීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා වගකිව යුතු නියෝජිතායතන ලෙස හඳුනාගෙන ඇත. පොදුවේ ගත් කළ දැනුම් දෙන රටක වෙළඳපොලේ තබා ඇති හෝ යුරෝපා සංගම් අසල්වැසි රටක් සමඟ දේශසීමාවේ යුරෝපා සංගමයට ඇතුල් වීමේ ස්ථානයක රඳවා තබා ඇති බිස්කට්. සහල්, බුලත්කොළ, මිරිස්, ශීත කළ මාළු, ඖෂධ පැලෑටි වැනි ආහාර හෝ එම ආහාර අයිතමවල ආහාර ස්පර්ශ ද්‍රව්‍යවල හඳුනාගත් අවදානම් පිළිබඳ යුරෝපා සංගමයෙන් අනුකූල නොවීමේ අනතුරු ඇඟවීම් වාර්තා කර ඇත.

යුරෝපීය සංගමයෙන් ලැබෙන EUROHYT අනතුරු ඇඟවීම් ලබා ගැනීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීමට අදාළ රජයේ අධිකාරිය ලෙස ශ්‍රී ලංකාවේ ජාතික ශාක නිරෝධායන සේවය හඳුනාගනු ලැබ ඇත.

ඇ. කාබනික නිෂ්පාදන පිළිබඳ යුරෝපා සංගමයේ නව රෙගුලාසි

කාබනික නිෂ්පාදනය හා කාබනික නිෂ්පාදන ලේබල් කිරීම සම්බන්ධ යුරෝපා සංගමයේ නව නීති 2022 ජනවාරි 01 දින සිට බලාත්මක විය. ශ්‍රී ලංකාවට මේ නිසා ඇතිවිය හැකි බලපෑම පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා පාලන සංගමය යන ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත් කර තිබේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ කුඩා කාබනික ගොවි සංගමය සමග එක්ව මෙම නව නීති හේතුවෙන් ශ්‍රී ලංකා අපනයනකරුවන්ට ඇතිවිය හැකි බලපෑම පිළිබඳ වාර්තාවක් යුරෝපා සංගමයට කරුණු දක්වන ලදී.

ඉ. යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාව

යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාව ආරම්භ වන්නේ 1975 දී යුරෝපීය කොමිසම සහ ශ්‍රී ලංකා රජය වාණිජ සහයෝගිතා ගිවිසුමක් අවසන් කළ අවස්ථාවේ සිටය. අද වන විට එම සබඳතා පාලනය වන්නේ 1995 අප්‍රේල් මාසයේ සිට බලාත්මක වූ "තුන්වන පරම්පරාවේ" සහයෝගිතා සහ හවුල් ගිවිසුමක් මගිනි. ගිවිසුම සුමටව ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා දෙපාර්ශවය ඒකාබද්ධ කොමිසමක (JC) ආකෘතියෙන් නිතිපතා රැස්වේ.

යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමෙහි 24 වන සැසිවාරය 2022 පෙබරවාරි 8 වන දින බ්‍රසල්ස් හිදී පැවැත්විණි. මෙම හමුවේදී ද්විපාර්ශ්වික සබඳතා සමාලෝචනය කරන ලද අතර බහුපාර්ශ්වික සංසදවලදී පාලනය, සංහිඳියාව සහ මානව හිමිකම්, වෙළඳාම, සංවර්ධන සහයෝගිතාව, දේශගුණික විපර්යාස සහ පරිසරය, ආංශික සහයෝගිතාව, ආරක්ෂාව සහ ප්‍රතිත්‍රස්තවාදය සහ සහයෝගිතාව ඇතුළු පුළුල් පරාසයක මාතෘකා පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම සහ යාවත්කාලීන කිරීම් සිදු විය.

2022 ජනවාරි 26 වැනි දින මාර්ගගතව පැවති වෙළෙඳ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ නිගමන 24 වැනි ඒකාබද්ධ කොමිසම විසින් සමාලෝචනය කරන ලදී. බොහෝ යුරෝපීය නිෂ්පාදන තම වෙළඳපොළට ඇතුළු වීම වළක්වන ආනයන සීමා ඉවත් කරන ලෙස යුරෝපා සංගමය ශ්‍රී ලංකාවෙන් දැඩි ලෙස ඉල්ලා සිටියේය. ගෝලීය වසංගතයේ බලපෑම හේතුවෙන් විදේශ විනිමය හිඟයක් ඇතිවීම හේතුවෙන් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා තාවකාලික ආනයන සීමාවන් දැඩි ලෙස අතුරු පියවරක් ලෙස පනවා ඇති බව ශ්‍රී ලංකාව පැහැදිළි කර දෙන ලදී. මෙම ක්‍රියාමාර්ග අඛණ්ඩ සහ ප්‍රගාමී සමාලෝචනයකට යටත් වන බව ද ශ්‍රී ලංකාව සඳහන් කළේය. 2021 සැප්තැම්බරයේ පැවති GSP+ අධීක්ෂණ මෙහෙයුමේදී ශ්‍රී ලංකා පාර්ශවකරුවන්ගේ සාධනීය දායකත්වය යුරෝපා සංගමය විසින් පිළිගත් අතර, රටේ තිරසාර සංවර්ධනය සඳහා GSP+ යෝජනා ක්‍රමයේ වටිනා දායකත්වය ශ්‍රී ලංකාව විසින් අගය කරන ලදී. GSP+ යෝජනා ක්‍රමය සහ යුරෝපා සංගමය ප්‍රගතිය පිළිබඳ වැඩිදුර යාවත්කාලීන කිරීම් ලබා දෙන ලෙස ශ්‍රී ලංකාවට ආරාධනා කළේය.

අනීතික, වාර්තා නොකරන ලද හා නියාමනය නොකරනු ලබන මසුන් ඇල්ලීමේ භාවිතාවන් වැළැක්වීම සහ තුරන් කිරීම සහ හවුල්කාරිත්වයේ කැපවීම් වලට ගරු කිරීම සඳහා අඛණ්ඩ සහයෝගිතාවයේ වැදගත්කම පිළිබඳව දෙපාර්ශවයම එකඟ විය. යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව නීති රීති මත පදනම් වූ ජාත්‍යන්තර පිළිවෙලක් සහ ඵලදායී බහුපාර්ශ්විකත්වය ප්‍රවර්ධනය කිරීමේ ඒකාබද්ධ ප්‍රයත්නයන් අඛණ්ඩව කරගෙන යාමට ඔවුන්ගේ කැපවීම අවධාරණය කළහ. ඉන්දියන් සාගරයේ කලාපීය වර්ධනයන් සහ සහයෝගිතාව පිළිබඳව ද ඔවුහු සාකච්ඡා කළහ. යුරෝපා සංගමය විසින් 2021 දෙසැම්බර් 01 දින දියත් කරන ලද ලොව පුරා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන ප්‍රධාන ආයෝජන සඳහා වන යුරෝපා සංගමයේ නව සැලැස්ම 'Global Gateway' මෙහිදී ඉදිරිපත් කරන ලදී. මෙම මුලපිරීම ශ්‍රී ලංකාව විසින් පිළිගනු ලැබීය. ඒකාබද්ධ කොමිසමේ මීළඟ රැස්වීම 2023 දී කොළඹදී කැඳවීමට දෙපාර්ශ්වය එකඟ විය.

ඊ. වෙළඳාම සහ ආර්ථික සබඳතා සහයෝගිතාව පිළිබඳ යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම (WGTEC)

වෙළඳාම සහ ආර්ථික සබඳතා සහයෝගිතාව පිළිබඳ යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායමේ වාර්ෂික සැසිය 2022 ජනවාරි 26 වැනි දින මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදී. WGTEC ශ්‍රී ලංකාව පාර්ශවයෙන් සත්කාරකත්වය දරන ලද අතර එහි සම සභාපතිත්වය දරනු ලැබුවේ ශ්‍රී ලංකා වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් සහ දකුණු සහ අග්නිදිග ආසියාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, DG TRADE, යුරෝපීය කොමිසමේ ඒතත ප්‍රධානියා විසිනි. ශ්‍රී ලංකාවේ නියෝජිත පිරිස වාණිජ දෙපාර්තමේන්තුව, විදේශ අමාත්‍යාංශය, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ, ජාතික ශාක නිරෝධායන සේවාවේ (NPQS), අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) සහ ආයෝජන මණ්ඩලයේ (BOI) නිලධාරීන්ගෙන් සමන්විත විය.

GSP+ සහ GSP+ අධීක්ෂණ යාන්ත්‍රණය පිළිබඳ යුරෝපා සංගමයේ පාර්ශ්වයෙන් දැනුවත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, වෙළඳ ප්‍රතිපත්ති වර්ධනයන්, යුරෝපා සංගම් GSP සහ GSP+ කාරණා පිළිබඳ දළ විශ්ලේෂණයට අදාළව දෙපාර්ශවය යාවත්කාලීන කිරීම් සහ සාකච්ඡා කළහ. 2021 ඔක්තෝබර් අධීක්ෂණ මෙහෙයුම සහ 2024-2033 වසර 10 චක්‍රය සඳහා යුරෝපා සංගමය විසින් නව GSP නියාමනය සඳහා වූ යෝජනාව පිළිබඳ පසු විපරම් කිරීම. අනෙකුත් අවදානම් නිර්ණායක 2 ක් එනම් අපනයන විවිධාංගීකරණය සහ යුරෝපා සංගමය වෙත GSP අපනයනවල වෙළඳපල කොටස තිබියදීත්, ඇඟලුම් වෙළඳාම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් GSP+ වෙතින් රටවල් උපාධි ලබා ගැනීමේදී යුරෝපා සංගමය විසින් දළ ජාතික ආදායම් නිර්ණායක පමණක් භාවිතා කිරීම පිළිබඳව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද සැලකිල්ල. ශ්‍රී ලංකාවේ ආයෝජන පරිසරය පිළිබඳ කෙටි සාකච්ඡාවක්, ලෝක වෙළඳ සංවිධානය යටතේ ඇති කරුණු සහ බහුපාර්ශ්වික/ බහුපාර්ශ්වික න්‍යාය පත්‍රය ලෝක වෙළඳ සංගමයේ වර්ධනයන් පිළිබඳ යුරෝපා සංගමයේ පාර්ශවයෙන් යාවත්කාලීන කිරීමක් සමඟ; MC12 සහ ශ්‍රී ලංකාව ඊ-වාණිජ්‍යය, සේවා දේශීය රෙගුලාසි, තොරතුරු තාක්ෂණ ගිවිසුම (ITA) සහ රජයේ ප්‍රසම්පාදන ගිවිසුම (GPA) පිළිබඳ සිය ස්ථාවරය ඉදිරිපත් කිරීම සඳහා වන සූදානම ද සාකච්ඡා කෙරිණි.

ද්විපාර්ශ්වික වෙළඳපල ප්‍රවේශ ගැටළු පිළිබඳව සාකච්ඡාව තවදුරටත් අවධානය යොමු කරන ලද අතර එහිදී ශ්‍රී ලංකාව සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක පියවර සහ ප්‍රමිති පිළිබඳ යුරෝපා සංගමයේ පාර්ශවයට සිය ප්‍රවේදිතා

සහ යෝජනා ඉදිරිපත් කළේය. ආනයන සීමා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ගත් තීරණය කෙරෙහි යුරෝපා සංගමයේ පාර්ශ්වයේ ප්‍රධාන අවධානය යොමු විය. තවද, 2021 පෙබරවාරි මාසයේදී නිම කරන ලද වෙළඳ ආශ්‍රිත ආධාර වැඩසටහන යටතේ ලබා දුන් සහය සඳහා ශ්‍රී ලංකා පාර්ශ්වය යුරෝපා සංගමයේ පාර්ශවයට ස්තුතිය පුද කරන අතරම, තාක්ෂණික සහ මූල්‍ය ආධාර අපේක්ෂා කරන නව යෝජනා ගණනාවක් යුරෝපා සංගමය වෙත ඉදිරිපත් කළේය. වෙළඳාම සම්බන්ධ සහය පිළිබඳ ශ්‍රී ලංකාවේ ඉල්ලීම් යුරෝපා සංගමයේ පාර්ශ්වය ධනාත්මකව සටහන් කළේය.

තවද, ඉන්දුනීසියාව සමඟ ඇතැම් රෙදිපිළි නිෂ්පාදන සඳහා ප්‍රභවස්ථාන රීති හරස් කලාපීය සමුච්චිත කිරීම සඳහා වූ ශ්‍රී ලංකාවේ යෝජනාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පාර්ශ්වය යුරෝපා සංගමයේ පාර්ශ්වයෙන් පසු විපරම් කළ අතර යුරෝපා සංගම් -එක්සත් රාජධානි නිදහස් වෙළඳ ගිවිසුම.මත පාදකව එක්සත් රාජධානියේ නිෂ්පාදිත රෙදිවලින් සාදන ලද ඇඟලුම් සඳහා යුරෝපා සංගමයෙන් විස්තීරණ තීරුබදු සහන ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කළ ඉල්ලීම සම්බන්ධයෙන් යුරෝපා සංගමයේ පාර්ශවය යාවත්කාලීන කරන ලදී.

දෙරට අතර වෙළෙඳ සහ ආර්ථික සංවාදය ඉදිරියට ගෙන යාමට දෙපාර්ශ්වයම තම කැපවීම ප්‍රකාශ කළහ.

VII. එක්සත් රාජධානිය සමඟ වෙළඳාම

අ. එක්සත් රාජධානිය සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශවික වෙළඳාම

එක්සත් රාජධානිය වෙත ශ්‍රී ලංකාව කරන ලද අපනයන 2021 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 934 ට සාපේක්ෂව 2% ක වර්ධනයක් වාර්තා කරමින් 2022 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 957 ක් ලෙස වාර්තා විය. වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකාවෙන් එක්සත් රාජධානියට අපනයනය කරන ප්‍රධානතම අපනයන භාණ්ඩය ඇඟලුම් වූ අතර එක්සත් රාජධානියෙ වෙත ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රධාන අපනයන වූයේ රබර් නිෂ්පාදන, මාළු, කොහුබත්, රෙදිපිළි භාණ්ඩ, පාවහන්, යන්ත්‍රෝපකරණ කොටස් යනාදියයි. GSP+ යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව එක්සත් රාජධානියට කරන ලද අපනයන 2022 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 653 ක් වූ අතර එය 2021 ට සාපේක්ෂව 4% ක පහත වැටීමක් විය. ආනයනය සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකාව එක්සත් රාජධානියෙන් කරන ලද ආනයනය 2021 වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 237 ට සාපේක්ෂව 18% ක පහත වැටීමක් වාර්තා කරමින් 2022 දී ඇමරිකානු ඩොලර් මිලියන 194 ක් ලෙස වාර්තා විය.

ආ. බ්‍රෙක්සිට්, එ.රා. GSP යෝජනා ක්‍රමය සහ මහජන උපදේශනය

බ්‍රෙක්සිට් නමින් හැඳින්වූ ක්‍රියාමාර්ගය ඔස්සේ 2020 ජනවාරි 01 වනදා සිට එක්සත් රාජධානිය නිල වශයෙන් යුරෝපීය සංගමයෙන් ඉවත් වූ අතර එතැන් සිට 2020 දෙසැම්බර් 31 දක්වා ශ්‍රී ලංකාව ඇතුළුව යුරෝපීය සංගමයේ GSP ප්‍රතිලාභී රටවලට යුරෝපා සංගම් GSP+ ප්‍රතිලාභ ඒ ආකාරයෙන්ම එක්සත් රාජධානියෙන් ඉල්ලා සිටීමට හිමිකම ලැබුණි. මේ අතර, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව 2020.02.06 සිට 2020.03.05 දක්වා කාලය තුළ UK Global Tariff (UKGT) නමින් යෝජිත නව තීරුබදු ක්‍රමවේදය පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීම සඳහා පාර්ශ්වකරුවන් සහ සාමාන්‍ය ජනතාව සඳහා මාර්ගගත මහජන උපදේශනයක් විවෘත කරන ලදී.

UKGT, එහි අන්තර් වාර GSP යෝජනා ක්‍රමය සහ අභිවර්ධිත රාමුව ක්‍රියාත්මක කරන අතරම, 2022 වසරේ සිට නව GSP යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට එ.රා. රජය තීරණය කර තිබේ. එම නව GSP යෝජනා ක්‍රමය හඳුන්වාදීම පිණිස, එ.රා.රජය සති අටක තවත් මාර්ගගත පාර්ශවකාර උපදේශනයක් 2021 අගෝස්තු/ සැප්තැම්බර් මාසවලදී දියත් කරන ලදී. එහි දේශීය උපදේශන ක්‍රියාදාමය සඳහා වාණිජ දෙපාර්තමේන්තුව නායකත්වය ලබා දුන් අතර එය අවසන් වීමට නියමිතව තිබූ අවසන් දිනය වන 2021 සැප්තැම්බර් 12 වැනි දින වන විට ඇඟලුම්, රබර්, තේ, පොල්, ධීවර, කුළුබඩු, සෙරමික් සහ වීදුරු, සැහැල්ලු

ඉංජිනේරු, බයිසිකල්, පාවහන්, මැණික් සහ ස්වර්ණාභරණ, ප්ලාස්ටික්, විදුලි, නිෂ්පාදන සහ පිරිසැකසූ ආහාර නියෝජනය කරමින් අංශ 14 ක මාර්ගගත කරුණු දැක්වීම් සම්පූර්ණ කිරීම පිණිස පහසුකම් සපයන ලදී. තවද, තනි පුද්ගල උපදේශනවල සමස්ත ප්‍රතිඵලය සැලකිල්ලට ගනිමින් වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙනම ඉදිරිපත් කිරීමක් කරන ලදී. අවස්ථා දෙකකදී, ශ්‍රී ලංකාව ඔවුන්ගේ නව GSP යෝජනා ක්‍රමයේ ආකෘතිය සහ අන්තර්ගතය තීරණය කිරීම සඳහා ප්‍රතිලාභීන්ගෙන් යෙදවුම් ලබා ගැනීමේ අරමුණින් පවත්වන ලද එක්සත් රාජධානියේ මහජන උපදේශන සඳහා සහභාගී විය. මෙම උපදේශන එක්සත් රාජධානියේ GSP යෝජනා ක්‍රමය සඳහා ශ්‍රී ලංකාවේ අයදුම්පත් ලෙස නොසැලකිය යුතුය.

ඇ. එක්සත් රාජධානියේ නව GSP යෝජනා ක්‍රමය - සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වෙළඳ යෝජනා ක්‍රමය (DCTS)

සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් රාජධානියේ වෙළඳපොළට ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව එක්සත් රාජධානියේ රජය 2022 අගෝස්තු 16 වන දින "සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය (DCTS)" නව එක්සත් රාජධානියේ GSP යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. DCTS යටතේ, එක්සත් රාජධානියට අපනයනය කිරීම සඳහා අඩු තීරුබදු සහ වඩා සරල ප්‍රභවස්ථාන රීති අවශ්‍යතා ලබා ගැනීමෙන් රටවල් 65ක් ප්‍රතිලාභ ලබනු ඇත. ශ්‍රී ලංකාව DCTS අභිවර්ධිත වරණීය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන රටකි. සමහර ජාත්‍යන්තර සම්මුතීන් අනුමත කිරීමට සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට රටවලට ඇති අවශ්‍යතාවය ඉවත් කිරීම මගින් එක්සත් රාජධානියේ රජය සියලුම ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි අඩු ආදායම්ලාභී රටවලට (LICs) සහ පහළ මධ්‍යම ආදායම් ලබන රටවලට (LMICs) DCTS වැඩිදියුණු කළ මනාප වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසයි. අපනයන තරහකාරිත්වය පිළිබඳ නිර්ණායක අත්හිටුවීමෙන් සහ අපනයන විවිධාංගීකරණයේදී පවතින නිර්ණායක පමණක් අදාළ කර ගනිමින් DCTS හි ආර්ථික අවදානම් තක්සේරුව සංශෝධනය කෙරේ. මෙම තක්සේරුව සඳහා පදනම තවදුරටත් වැඩි දියුණු කිරීමේ අදහසින් DCTS දියත් කිරීමෙන් වසරක් ඇතුළත ආර්ථික අවදානම තක්සේරු කිරීම සඳහා විකල්ප තේරීම් සමාලෝචනයක් සම්පූර්ණ කිරීමට එක්සත් රාජධානියේ රජය අදහස් කරයි. ව්‍යාපාර සඳහා අඛණ්ඩතාව සහතික කිරීම පිණිස DCTS දියත් කිරීමේ සිට වසර තුනක් සඳහා දැනට පවතින GSP අභිවර්ධිත රාමු රටවලට (එක්සත් රාජධානිය සමග තවත් වරණීය වෙළඳ සැකසුමකින් තොරව) DCTS අභිවර්ධිත වරණ රජය ප්‍රදානය කරයි.

2023 මුල් භාගයේදී එක්සත් රාජධානියේ වර්තමාන සාමාන්‍යකෘත වරණීය යෝජනා ක්‍රමය (GSP) DCTS මගින් ප්‍රතිස්ථාපනය කරනු ඇත. මෙම යෝජනා ක්‍රමය දැනට එක්සත් රාජධානියේ GSP යටතේ ප්‍රතිලාභ ලබන රටවලට අදාළ වේ. බොහෝ අඩු ආදායම්ලාභී රටවලට සහ පහළ මධ්‍යම ආදායම් ලබන රටවලට සුදුසුකම් ලත් භාණ්ඩවලින් 85% ක් සඳහා ආයුධ සහ තීරුබදු රහිත, කෝටා-නිදහස් වෙළඳාම හැර අන් සියල්ල සඳහා DCTS තීරුබදු රහිත, කෝටා රහිත වෙළඳාම LDC වෙත ලබා දෙනු ඇත.

IX ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම (TIFA)

දෙරට අතර ද්විපාර්ශ්වික වෙළඳ සහ ආයෝජන සබඳතා වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීමේ ඉදිරිදර්ශනය ඇතිව ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව 2017 නොවැම්බර් මාසයේදී වෙළඳ හා ආයෝජන රාමු වැඩපිළිවෙලට (TIFA) අත්සන් කරන ලදී. වෙළෙඳ හා ආයෝජන පිළිබඳ ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා ඒකාබද්ධ කොමිසම (JC) මෙම වැඩපිළිවෙළ යටතේ පිහිටුවන ලද අතර එම කොමිසමේ සභාවේ පළමු සැසිවාරය 2018 අප්‍රේල් මාසයේදී ඕස්ට්‍රේලියාවේදී පැවැත් වූ අතර එහි 2 වැනි සැසිවාරය 2019 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ පැවැත්විණි.

කොමිසමෙහි 3 වැනි සැසිවාරයට පෙර, 2020-2021 කාලසීමාව සඳහා එහි ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා TIFA හි අතුරු රැස්වීමක් 2021 නොවැම්බර් 17 වැනි දින අතථ්‍යව පවත්වන ලදී. ක්‍රියාකාරී සැලැස්ම රජයෙන් රජයට සම්බන්ධවීම්, සංවර්ධන හවුල්කාරිත්වයන්, වෙළඳපල ප්‍රවේශය සහ වාණිජ අවශ්‍යතා සඳහා අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් කාණ්ඩ හතරකින් සමන්විත වේ.

ක්‍රියාකාරී සැලැස්මට නව යෝජනා කිහිපයක් ද ඇතුළත් කරනු ලැබීය. ශ්‍රී ලංකාවට අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීමේ හැකියාව සහ ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ආයතන මගින් ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමේ හැකියාව, වෙළඳ භාණ්ඩ මධ්‍යස්ථානය, ලෝක බැංකුවේ සහාය ඇතිව වෙළඳාම සඳහා ජාතික තනි කවුළුව, ආයෝජක යෙදුම්වල ප්‍රගතිය, නැව් සම්බන්ධතා ආදිය ඕස්ට්‍රේලියානු පාර්ශ්වය විස්තාරණය කළේය. අනුකූලතා තක්සේරුව පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (MRA), හඳුනාගත් නිෂ්පාදන සඳහා නිරෝධායන නිෂ්කාශනය වේගවත් ලෙස සැකසීම, මල් වගා ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් ක්ෂේත්‍ර සහතික කිරීමේ ක්‍රමය සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහාය සහ වාසර සමීක්ෂණයක් සඳහා කහටගහ මිනිරන් පතලට අවශ්‍ය කරනු ලබන සහාය වැනි ප්‍රමුඛතා හතරක් ලංකා පාර්ශ්වය විසින් අවධාරණය කරන ලදී.

කොළඹ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ ක්‍රියාකාරී සැලැස්මේ 2 වන සමාලෝචන රැස්වීම සහ 3 වන සමාලෝචන රැස්වීම පිළිවෙලින් 2022 මාර්තු 15 සහ නොවැම්බර් 23 යන දිනවල පැවැත්විණි. සමාලෝචන රැස්වීම්වලදී දෙපාර්ශවයම ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය හුවමාරු කරගත් අතර විශේෂයෙන් පුනරුක්ති ඉවත් කරමින් ක්‍රියාකාරී සැලැස්ම ආකෘතිය වඩාත් ඵලදායී ලෙස නැවත සකස් කිරීමට එකඟ විය.

X. ආර්ථික සහ වෙළඳ සහයෝගිතාව පිළිබඳ චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ (JETC) 7 වැනි සැසිවාරය

ද්විපාර්ශ්වික වෙළඳාම සහ දෙරට අතර ආර්ථික සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 1982 දී අත්සන් කරන ලද වෙළඳ සහ ගෙවීම් ගිවිසුම සහ ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම් යන ගිවිසුම් දෙකක් ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව 1991 දී ශ්‍රී ලංකා-චීන ආර්ථික සහ වෙළඳ සහයෝගිතාව සඳහා ඒකාබද්ධ කමිටුව (JETC) පිහිටුවන ලදී.

ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ 7 වැනි සැසිවාරය 2021 සැප්තැම්බර් 24 වැනි දින අතථ්‍ය අකාරරයෙන් පැවැත්විණි. එකඟ වූ යෝජනා ක්‍රියාත්මක කිරීම දෙපාර්ශවයටම හැකි වන පරිදි JETC හි 7 වැනි සැසිවාරයේදී පැන නගින කරුණු පිළිබඳ පසු විපරම් රැස්වීමක් 2022 මාර්තු 31 වැනි දින පවත්වන ලදී.

XII. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර වෙළඳාම සහ ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI).

ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර ද්විපාර්ශ්වික සහයෝගිතාව සඳහා වූ ඒකාබද්ධ කොමිසමක් (JCBC) පිහිටුවීම පිළිබඳ අවබෝධතා ගිවිසුමක් 2007 ඔක්තෝම්බර් 1 වන දින අත්සන් කරන ලද අතර එහි 01 වන රැස්වීම 2012 ජනවාරි 26 වන දින කොළඹදී පැවැත්විණි. 2014 ඔක්තෝබර් 13 වන දින, JCBC යටතේ දෙරට අතර වෙළඳාම සහ ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමක් (WGTI) පිහිටුවීමට එකඟ විය.

සාකච්ඡා වට කිහිපයකින් පසුව, 2022 ඔක්තෝබර් 7 වැනි දින පැවති රැස්වීමේදී ක්‍රියාකාරී කණ්ඩායමෙහි යෝජිත යොමුකිරීම් අනුදේශ (ToR) සඳහා දෙපාර්ශවය එකඟ වූ අතර, ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ද්විපාර්ශ්වික සහයෝගිතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ මීළඟ වටයේදී ක්‍රියාකාරී කණ්ඩායමෙහි යොමුකිරීම් අනුදේශ සම්මත කිරීමට තවදුරටත් එකඟ විය.

අමාත්‍ය මණ්ඩලය විසින් යොමුකිරීම් අනුදේශ සඳහා අනුමැතිය ලබා දුන් අතර අලුතින් පිහිටුවන ලද ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන කාර්යාලය (OIT) සමඟ සාකච්ඡා කර ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවීමට යෝජනා කරන ලදී.

XIII. වෙළඳ, ආර්ථික, විද්‍යා සහ තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ශ්‍රී ලංකා-රුසියානු අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කොමිසම (IGC)

අන්තර්රාජ්‍ය ඒකාබද්ධ කොමිසම පිහිටුවීම පිළිබඳ ගිවිසුම 2015 අප්‍රේල් 23 වැනි දින රුසියානු පාර්ශ්වය විසින් අත්සන් කරන ලද අතර ශ්‍රී ලංකාව 2015 ජුනි 23 වැනි දින රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ අත්සන් කරන ලදී. ඒ අනුව

2015 ජූනි 23 දින සිට බලපැවැත්වෙන පරිදි ගිවිසුම බලාත්මක විය. කොමිසමෙහි පළමු සැසිවාරය 2016 පෙබරවාරි 10 සිට 12 දක්වා මොස්කව්හිදී පැවැත්වුණු අතර 2 වැනි සැසිවාරය 2017 ඔක්තෝබර් 24 සිට 26 දක්වා කොළඹදී පැවැත්විණි.

ඒකාබද්ධ කොමිසමේ 3 වන සැසිවාරය 2022 පෙබරවාරි මාසයේදී සහ පසුව 2022 අප්‍රේල් මාසයේදී සහ 2022 සැප්තැම්බර් මාසයේදී කොළඹදී පැවැත්වීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, විවිධ හේතූන් මත 2022 තුළ සැසිය පැවැත්වුණේ නැත.

අදාළ ශ්‍රී ලංකා බලධාරීන්ගෙන් රුසියානු යෝජනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අදහස් ලබා ගැනීම සහ මින් පෙර ශ්‍රී ලංකා පාර්ශවය විසින් සභාගත කරන ලද යෝජනා යළි තහවුරු කිරීම පිණිස වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මුලසුන දරන ලද මූලික රැස්වීමක් ශ්‍රී ලංකා පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් 2022 අගෝස්තු මාසයේදී පවත්වන ලද අතර 2023 පළමු කාර්තුවේදී 3 වැනි සැසිය පැවැත්වීම පිණිස සියලු පූර්ව සූදානම්වීමේ කටයුතු දැනටමත් සිදු කර තිබේ.

XIV. ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළෙඳාම ආශ්‍රිත කරුණු පිළිබඳ උප කමිටුව

තායිලන්තය විසින් සත්කාරකත්වය දරන ලද ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළෙඳාම ආශ්‍රිත කරුණු පිළිබඳ 4 වැනි අනුකමිටු රැස්වීම 2022 මැයි 6 වැනි දින අතථ්‍ය ආකාරයෙන් පවත්වන ලදී.

මෙම රැස්වීම තායිලන්තයේ වෙළඳ සාකච්ඡා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ වාණිජ දෙපාර්තමේන්තුවේ වැඩබලන වාණිජ අධ්‍යක්ෂ ජනරාල්ගේ සම-ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. සාකච්ඡාවේ ප්‍රධාන අයිතමය වූයේ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම (JAP) ය. දෙරටෙහිම විකසනය වෙමින් පවතින ආර්ථික පරිසරය සහ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා සැලකිල්ලට ගනිමින් උපායමාර්ගික ආර්ථික හවුල්කාරිත්වය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වෙළඳ සහ ආයෝජනවල ප්‍රමුඛතා ආර්ථික සහයෝගිතා ක්ෂේත්‍ර වන්නේ ආයෝජන, යටිතල පහසුකම්, කෘෂි කර්මාන්තයේ සංවර්ධනය, ධීවර කර්මාන්තය, මැණික් හා ස්වර්ණාභරණ, සංචාරක ව්‍යාපාරය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, මූල්‍ය සහයෝගිතාව, ඇසුරුම් කර්මාන්ත, තොරතුරු තාක්ෂණ අංශයේ සංවර්ධනය සහ අන්‍යෝන්‍ය ආර්ථික අභිලාෂයන් සහිත අනෙකුත් අංශ වේ.

XV. ජාතික වෙළඳ සාකච්ඡා කමිටුව (NTNC) ස්ථාපිත කිරීම

වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ඇතුළු සාමාජිකයින් අට දෙනෙකුගෙන් (8) සමන්විත ජාතික වෙළඳ සාකච්ඡා කමිටුව (NTNC) පත් කිරීමට සහ එහි ප්‍රධාන සාකච්ඡාකරු ලෙස හිටපු වාණිජ අධ්‍යක්ෂ ජනරාල් කේ.ජේ. වීරසිංහ මහතා පත්කිරීමට ගත් තීරණය සඳහා 2022 ඔක්තෝම්බර් 17 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය හිමි විය.

සාකච්ඡා කමිටුවේ විෂය පථය යටතේ, අනු කමිටු 10 ක් ඇති අතර පහත සඳහන් අනු කමිටු වල සභාපතිත්වය දරනු ලබන්නේ වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසිනි.

i. සේවා වෙළඳාම පිළිබඳ අනු කමිටුව
ii. වෙළඳ පිළියම් පිළිබඳ අනු කමිටුව
iii. ප්‍රභවස්ථාන රීති පිළිබඳ අනු කමිටුව

තවද, වාණිජ දෙපාර්තමේන්තු නිලධාරීන් භාණ්ඩ වෙළඳාම, ආයෝජන, රේගු සහයෝගිතාව සහ වෙළඳ පහසුකම් සහ SPS/TBT පිළිබඳ අනු කමිටු සාමාජිකයන් ලෙස සේවය කරනු ලැබේ. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, අනු කමිටු රැස්වීම් සහ තාක්ෂණික සාකච්ඡා සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය.

XVI. ජාත්‍යන්තර වෙළඳාම සඳහා කාර්යාලය ස්ථාපිත කිරීම

වාණිජ දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ඇතුළුව අදාළ සියලු ආයතන සහ පාර්ශවකරුවන් සමග ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් සහ කලාපීය වෙළඳ ගිවිසුම් ඇතුළු ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන කාර්යාලය (OIT) නමින් වෙනම කාර්යාලයක් පිහිටුවීමට ගත් තීරණය අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇත.

ප්‍රමුඛතා රටවල් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා නැවත ආරම්භ කිරීම සඳහා නි.වෙ.ගිවිසුම් පිළිබඳ සහ වෙනත් අදාළ තොරතුරු ලබා දීමෙන් වාණිජ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර වෙළඳාම සඳහා කාර්යාලය වෙත සහාය වෙමින් සිටින අතර නි.වෙ.ගිවිසුම් සහ වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ දැනට පවතින සාකච්ඡා පිළිබඳව ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන කාර්යාලය විසින් සංවිධානය කරන ලද රැස්වීම්වලට සහභාගී විය.

1.5.3 කලාපීය කටයුතු අංශය

I. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)

දකුණු ආසියානු වරණීය වෙළඳ ගිම්සුමෙහි සාමාජික රටවල් වන්නේ බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාවයි. එම ගිවිසුම 1993 අප්‍රේල් 11 වන දින අත්සන් කරන ලද අතර 1995 දෙසැම්බර් 7 වන දින සිට බලාත්මක විය. දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය (SAFTA) ක්‍රියාත්මක කිරීමත් සමගින් SAPTA ප්‍රතිස්ථාපනය විය. මේ අනුව, SAPTA යටතේ තිරුබදු මනාප භාවිතය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.

SAPTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයනය 2022 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1.43 ක් ලෙස වාර්තා වූ අතර 2021 දී එය ඇමෙරිකානු ඩොලර් මිලියන 1.42 ක් විය. SAPTA යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වන්නේ කුහර රහිත රබර්, වල්කනයිස් කරන ලද රබර් සහ තේ යනාදියයි. SAPTA යටතේ ශ්‍රී ලංකාවේ ආනයනය 2021 දී ඇමරිකානු ඩොලර් මිලියන 0.13 ට සාපේක්ෂව 2022 දී ඇමරිකානු ඩොලර් මිලියන 0.26 ක් ලෙස වාර්තා විය.

II. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

2004 ජනවාරි මාසයේදී ඉස්ලාමාබාද්හි පැවති 12 වන සාර්ක් සමුළුවේදී දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කරන ලද අතර එය 2006 ජනවාරි 1 වන දින බලාත්මක විය. SAPTA පිහිටුවීමත් සමඟ ආරම්භ වූ වරණීය වෙළඳාම ප්‍රවර්ධනය කිරීම තුළින් කලාපීය ආර්ථික ඒකාබද්ධතා වැඩසටහන තවදුරටත් වැඩිදියුණු කිරීම SAFTA හි අරමුණයි. 1995. සාර්ක් සාමාජිකයින් නිදහස් වෙළඳ ප්‍රදේශයක්, රේගු සංගමයක්, පොදු වෙළඳපලක් සහ පොදු ආර්ථික හා මූල්‍ය සංගමයක් ඇතුළත් දකුණු ආසියානු ආර්ථික සංගමයක් (SAEU) නිර්මාණය කිරීමෙන් කලාපයේ ආර්ථික ඒකාබද්ධතාවය තව දුරටත් ශක්තිමත් අදහස් කරයි. 2014 වසරේ පැවති 18 වැනි සාර්ක් සමුළුවේදී මෙම කැපවීම යළි තහවුරු කරන ලදී.

ශ්‍රී ලංකාව 2015 නොවැම්බර් 21 වන දින වෙළඳ ලිහිල්කරණ වැඩසටහනේ (TLP) I අදියර යටතේ තිරුබදු ලිහිල් කිරීම සඳහා වූ සිය බැඳීම සම්පූර්ණ කරන ලදී. වෙළඳ ලිහිල්කරණ වැඩසටහනේ II අදියර (සංවේදී ලැයිස්තු අඩු කිරීම) ද 2009 ඔක්තෝම්බර් මස 5 වැනිදා නේපාලයේ පැවති පැවැති SAFTA විශේෂඥ කමිටුවේ දී සාර්ථකව සාකච්ඡා කරන ලද අතර සියලුම සාමාජික රටවල් විසින් එය ක්‍රියාත්මක කරන ලදී. II අදියර යටතේ, සාමාජිකයින් ඔවුන්ගේ ආරම්භක සංවේදී ලැයිස්තු අවම වශයෙන් 20% ක අඩු කිරීමකට එකඟ විය.

ශ්‍රී ලංකාව 2012.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදියර II යටතේ එකඟ වූ තිරුබදු මත රේගු ආනයන බදු (CID) ක්‍රමානුකූලව අඩු කරමින් වාරික 6න් 5ක් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. 2018.12.31 වන විට ශ්‍රී ලංකාව එය සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණද, SAFTA වෙළඳ ලිහිල්කරණ වැඩසටහනේ II අදියර ශ්‍රී ලංකාවට අවසන් කිරීමට

නොහැකි වූයේ එය සමාලෝචනය කිරීමට රජය ගත් තීරණයක් හේතුවෙන් වන අතර මේ පිළිබඳව ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශය සමඟ පසු විපරම් කර ඇත. එම ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකාව හැර අනෙකුත් සියලුම සාමාජික රටවල් ඔවුන්ගේ සංවේදී ලැයිස්තු 20% කින් අඩු කිරීමට එකඟ වී ඇති අතර, ශ්‍රී ලංකාව SAFTA වෙළඳ ලිහිල්කරණ වැඩසටහනේ III අදියර යටතේ 10% ක අඩු කිරීමකට පමණක් එකඟ වී ඇත. පාර්ශ්වකරුවන් සමඟ කරන ලද උපදේශන මත පදනම්ව, වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවට සිය 10% අඩු කිරීමේ කැපවීම සපුරාලීම සඳහා අවශ්‍ය තීරුබදු රේඛා සංඛ්‍යාව හඳුනා ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇති අතර එම කාරණය මුදල් අමාත්‍යාංශය සමඟ පසු විපරම් කර ඇත. ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී.

2021 ජූලි 28-29 දක්වා පැවැත්වීමට නියමිතව තිබූ 10 වැනි SAFTA විද්වත් කමිටු (SCOE) රැස්වීම කල් දැමූ අතර එය 2022 තුළදී පවා නොපැවැත්විණි.

SAFTA යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳාම නොසැලකිය හැකි තරම්ය. සාර්ක් කලාපයේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වන ඉන්දියාව සහ පකිස්ථානය සමඟ වෙළඳ ගිවිසුම් දෙක යටතේ වෙළඳාම වැඩි වශයෙන් උත්පාදනය වේ. SAFTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයනය 2021 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 101.64 ට සාපේක්ෂව 28% ක අඩුවීමක් වාර්තා කරමින් 2022 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 72.78 ක් ලෙස වාර්තා විය. SAFTA තීරුබදු ප්‍රතිලාභ භුක්ති විඳින ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන අතර ගම්මිරිස්, වියළි පොල්, සාදික්කා, ඇලුමිනියම් බහාලුම් පටු වියන ලද රෙදි, කෘත්‍රිම තන්තු, වීදුරු බෝතල්, දවටන රෙදි, කාර්මික මේද අම්ල ආදිය ඇතුළත් වේ.. SAFTA යටතේ ශ්‍රී ලංකාවේ ආනයනය 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ ඇමරිකානු ඩොලර් මිලියන 7.65 ට සාපේක්ෂව 2022 දී ඇමරිකානු ඩොලර් මිලියන 5.04 ක් ලෙස වාර්තා විය.

III. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

කලින් බැංකොක් ගිවිසුම ලෙස හඳුන්වනු ලැබූ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA), ආසියානු හා ශාන්තිකර කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාවේ (UN-ESCAP) මූලාරම්භයක් ලෙස 1975 දී අත්සන් කරන ලදී. ආසියා ශාන්තිකර කලාපයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ඇති පැරණිතම වරණීය වෙළඳ ගිවිසුම මෙයයි. සහභාගිත්ව රාජ්‍යයන් අතර භාණ්ඩ වෙළඳාම කෙරෙහි අවධානය යොමු කරමින් සාම්ප්‍රදායික වරණීය වෙළඳ ගිවිසුමක් ලෙස මුලදී APTA දියත් කරන ලදී. 2005 දී APTA ලෙස නම වෙනස් කිරීමත් සමඟ, අනෙකුත් සහයෝගිතා ක්ෂෙත්‍ර වෙත ආවරණය පුළුල් කිරීම සඳහා මෙම කලාපීය වෙළඳ ගිවිසුමට බලය හිමි විය.

APTA යටතේ මේ වන විට සම්මුති සාකච්ඡා වට 04ක් අවසන් කර ඇති අතර සහභාගී වන රාජ්‍යයන් විසින් තීරු බදු කාණ්ඩ 10,461ක් සඳහා සහන ලබා දී ඇත. APTA සාකච්ඡා 4 වැනි වටයේදී එකඟ වූ තීරුබදු සහන පොරොන්දු ශ්‍රී ලංකාව 16.03.2018 දින ක්‍රියාත්මක කළේය. APTA සාකච්ඡා 05 වැනි වටය යටතේ වාණිජ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ එක්ව ස්ථාවර කමිටු (SC) සැසිවාර (භාණ්ඩ වෙළඳාම පිළිබඳ සාකච්ඡා ඇතුළුව) සහ ආයෝජන, වෙළඳ පහසුකම්, සේවා සහ ප්‍රභවස්ථාන රීති පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම්වල රැස්වීම් වල නිරත වී ඇත. .

2019 ඔක්තෝබර් 28-30 දක්වා තායිලන්තයේ පැවති APTA ස්ථාවර කමිටුවේ 56 වැනි සැසිවාරයේදී ගනු ලැබූ තීරණවලට අනුව, APTA යටතේ භාණ්ඩ වෙළඳාම පිළිබඳ 5 වන වටයේ සාකච්ඡා සඳහා තීරුබදු අඩු කිරීමේ ක්‍රම පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශයට දැනුම් දෙන ලදී..

මීළඟ වටය සඳහා සලකා බැලීම සඳහා ශ්‍රී ලංකාව එහි බදුවලට යටත් වන තීරුබදු කාණ්ඩ 15%ක් සහ වරණීය ආන්තිකවලින් 25%ක මට්ටමක් පිරිනැමීමට එකඟ විය. කෙසේ වෙතත්, APTA සාමාජික රටවලින් කළ ඉල්ලීම් පදනම්ව, සියලු කරුණු සමාලෝචනය කර තම වැඩි දියුණු කළ පිරිනැමුම් 2019.11.30 දින වන විට ඉදිරිපත් කරන ලෙස ස්ථාවර කමිටුව සියලු සහභාගිත්ව රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටින ලදී. එබැවින්, බදුවලට යටත් වන තම තීරුබදු කාණ්ඩ යටත් පිරිසෙයින් 20% වන ලෙස සිය පිරිනැමුම ඉහළ නැංවීමට ශ්‍රී ලංකාවට සිදු වේ. වාණිජ

දෙපාර්තමේන්තුව මෙම කරුණ මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කරන ලද අතර එම ක්‍රියාවලිය තවදුරටත් සිදුවෙමින් තිබේ.

ස්ථාවර කමිටුවේ 57 වැනි සැසිවාරය සහ APTA හි ක්‍රියාකාරී කණ්ඩායම්වල රැස්වීම් 6 ක් පැවැත්වීමට APTA ලේකම් කාර්යාලයෙන් ලැබුණු යෝජනාවක් මත, ශ්‍රී ලංකාව 2023 පළමු කාර්තුව තුළ රැස්වීම් පැවැත්වීමට යෝජනා කළේය.

APTA ප්‍රවර්ධන සැසිය 2022 සැප්තැම්බර් 01 වැනි දින සිංගප්පූරුවේදී පැවැත්වුණු 10 වැනි ආසියා-ශාන්තිකර වෙළෙඳ පහසුකම් සංසදයට අනුගාමීව පැවැත්විණි. මෙම සංසදයට ශ්‍රී ලංකා රේගුව සහභාගී විය.

APTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයනය 2021 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 238.61 ට සාපේක්ෂව 6% ක පහත වැටීමක් වාර්තා කරමින් 2022 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 225.16 ක් ලෙස වාර්තා විය. APTA යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන ප්‍රධාන අපනයන වන්නේ තේ, කොහු කෙඳි, සක්‍රිය කාබන්, ඇඟලුම්, ධීවර නිෂ්පාදන යනාදියයි. APTA යටතේ ශ්‍රී ලංකාවේ ආනයනය 2021 වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 24.22 ට සාපේක්ෂව 67% ක පහත වැටීමක් වාර්තා කරමින් 2022 දී ඇමරිකානු ඩොලර් මිලියන 8.09 ක් ලෙස වාර්තා විය.

IV. ගෝලීය වෙළඳ වරණීය ක්‍රමය (GSTP)

සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර වෙළඳ අවස්ථා වර්ධනය කිරීම සඳහා වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) විසින් ආරම්භ කරන ලද ගෝලීය වරණීය වෙළඳ ක්‍රමය (GSTP) 1989 අප්‍රේල් 19 දින සිට බලාත්මක විය. GSTP ශ්‍රී ලංකාව ඇතුළු සාමාජික රටවල් 42 කින් සමන්විත වේ.

GSTP යටතේ ශ්‍රී ලංකාවේ අපනයනය 2021 දී ඇමරිකානු ඩොලර් මිලියන 91.82 ට සාපේක්ෂව 31% ක පහත වැටීමක් වාර්තා කරමින් 2022 දී ඇමරිකානු ඩොලර් මිලියන 63.54 ක් ලෙස වාර්තා විය. GSTP යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භාණ්ඩය කුරුඳු වන අතර එය GSTP වෙත කරන ලද මුළු අපනයනයෙන් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් දරයි. සාමාජික රටවල්, පසුව ඇලුමිනියම් කැන් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන. 2021 වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 0.01 ට සාපේක්ෂව 2022 දී GSTP යටතේ ශ්‍රී ලංකාවට කිසිදු ආනයනයක් වාර්තා වී නොමැත.

V. බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාලි බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC)

බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාලි බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (බිම්ස්ටෙක්) සාමාජික රටවල් 07 කින් සමන්විත කලාපීය සංවිධානයකි: දකුණු ආසියානු කලාපයෙන්-බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාව සහ අග්නිදිග ආසියානු කලාපයෙන්- මියන්මාරය සහ තායිලන්තය. 2004 පෙබරවාරි 8 වන දින තායිලන්තයේ දී රාමු ගිවිසුම අත්සන් කිරීමෙන් පසු බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ප්‍රදේශ (**FTA)** සාකච්ඡා ආරම්භ විය.

වසර කිහිපයකින්පසු, යෝජිත බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ප්‍රදේශ යටතේ 21 වන වෙළඳ සාකච්ඡා කමිටුව (TNC) 2018 නොවැම්බර් 18-19 දක්වා ඩකාහිදී පැවැත්වුණු අතර, එම රැස්වීමේදී භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම, ප්‍රභවස්ථාන නීති පිළිබඳ පාඨ, සේවා වෙළඳාම, ආයෝජන, රේගු සහයෝගිතාව, වෙළඳ පහසුකම් සහ ආරවුල් විසඳීම පිළිබඳව සාකච්ඡා කර ප්‍රගතියක් අත් කර ගන්නා ලදී.

බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ස්ථාන යටතේ ශ්‍රී ලංකාවේ මූලික භාණ්ඩ ලැයිස්තුව/තීරුබදු ලිබරල්කරණ වැඩසටහන (TLP) 2016 දී බිම්ස්ටෙක් ලේකම් කාර්යාලය වෙත යවන ලදී. 21 වන වෙළඳ සාකච්ඡා කමිටුවේදී ගත් තීරණ අනුව මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ තීරුබදු ලිහිල්කරණ වැඩසටහනේ HS 2017 පෙළ අතිස්ථාපනය කර ඇත. කෙසේ වෙතත්, නිදහස් වෙළඳ ප්‍රදේශ/වරණීය වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු ලිහිල්කිරීමේ වැඩසටහනෙහි

සමාලෝචනය කිරීම සඳහා 2021.02.08 දිනැති කැබිනට් තීරණයට අනුව, යෝජිත බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ප්‍රදේශ යටතේ HS 2017 පෙළෙහි තීරුබදු සහන නැවත සැලසුම් කිරීම මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරමින් සිදු වෙමින් පවතී.

යෝජිත බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ප්‍රදේශ යටතේ ප්‍රභවස්ථාන රීති පිළිබඳ 20 වැනි ක්‍රියාකාරී කණ්ඩායම 2022 ජනවාරි 10-11 දක්වා අතථ්‍ය ආකාරයෙන් පැවැත්විණි. බිම්ස්ටෙක් ක්‍රියාකාරී කණ්ඩායමේ ප්‍රභවස්ථාන රීති පිළිබඳ 21 වැනි රැස්වීම දෙමුහුන් ආකාරයෙන් 18-19 ඔක්තෝබර් 2022 දක්වා බංග්ලාදේශයේ ඩකාහිදී පැවැත්විණි. . යෝජිත බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ප්‍රදේශ මූලාරම්භයේ රීති පරිච්ඡේදයේ කෙටුම්පත් පාඨ, මෙහෙයුම් සහතික කිරීමේ ක්‍රියා පටිපාටිය සහ යෝජිත බිම්ස්ටෙක් FTA පරිච්ඡේදයේ භාණ්ඩ වෙළඳාමට අදාළ නිෂ්පාදන විශේෂිත රීති පිළිබඳ කැපී පෙනෙන කරුණු කිහිපයක් මෙම රැස්වීමේදී සමාප්ත කරන ලදී.

VI. වෙළඳාම සහ ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම(WGTI), ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානය (IORA)

ශ්‍රී ලංකාව 2022 අප්‍රේල් 6 සහ ජූලි 07 යන දිනවල පාහේ පවත්වන ලද වෙළඳාම සහ ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ (WGTI) -IORA හි 19 වන සහ 20 වැනි රැස්වීම්වලට සහභාගී විය.

ක්‍රියාකාරී කණ්ඩායමෙහි වැඩ සැලැස්ම යටතේ, IORA සාමාජික රටවල තීරුබදු නොවන බාධක පිළිබඳ මාර්ගගත වාර්තාකරණ පද්ධතියක් සඳහා මොරිෂස් රාජ්‍යය විසින් ක්‍රමවේද කෙටුම්පතක් යෝජනා කර සකස් කර ඇත. යෝජිත පද්ධතිය පිළිබඳව ඇතැම් දේශීය පාර්ශවකරුවන්ගෙන් ලැබුණු අදහස් සහ නිරීක්ෂණ වාණිජ දෙපාර්තමේන්තුව විසින් දැනටමත් ඉදිරිපත් කර ඇත.

VII. ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර යෝජිත වරණීය වෙළඳ ගිවිසුම (BSPTA)

2021 ජුනි මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් සාකච්ඡා සඳහා වූ විධිනියෝගය අනුව බංග්ලාදේශය සමඟ ද්විපාර්ශ්වික මනාප වෙළඳ ගිවිසුමක් (BSPTA) පිළිබඳ සාකච්ඡා ආරම්භ කරන ලදී. මේ දක්වා සාකච්ඡා වට තුනක් පවත්වා, රාමු ගිවිසුමේ ප්‍රධාන අංග අවසන් කරන ඇත.

සාකච්ඡා යටතේ ඇති ගිවිසුම මගින් භාණ්ඩ වෙළඳාම පමණක් ආවරණය වන අතර මූලික රේගු බදු පමණක් ඉවත් කිරීම හෝ අඩු කිරීම සිදු කරයි. දේශපාලන අභිමතාර්ථය වූයේ නිෂ්පාදනවල කෙටි ලැයිස්තුවක් සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම ආරම්භ කිරීමයි, එබැවින් පළමු අදියරේදී එය සමෝධානික පද්ධති වර්ගීකරණයේ අංක 8 මට්ටමේ තීරුබදු රේඛා 100 ක් පමණක් ආවරණය කරයි.

ඉල්ලීම් ලැයිස්තු හුවමාරු කිරීම පාර්ශවකරුවන්ගේ උපදේශනයෙන් පසුව සිදු කරන ලදී. ශ්‍රී ලංකාව නිෂ්පාදන 112 ක ලැයිස්තුවක් බංග්ලාදේශය වෙත ඉදිරිපත් කළ අතර, ශ්‍රී ලංකාවට නිසි සලකා බැලීම සඳහා බංග්ලාදේශ පාර්ශවයෙන් නිෂ්පාදන 131 ක ලැයිස්තුවක් ලැබිණි. පාර්ශව දෙකම දැන් ගිවිසුම යටතේ ලබා දීමට නියමිත තීරු බදු සහන සඳහා අදාළ ලැයිස්තු ඇගයීම සහ පිරිනැමීම් ලැයිස්තු සකස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

ගරු අමාත්‍යතුමාගේ උපදෙස් යටතේ දෙරට අතර සාකච්ඡා අවසන් කිරීමට සහ හැකි ඉක්මනින් දෙරට අතර යෝජිත වරණීය වෙළඳ ගිවිසුම අත්සන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට විදේශ කටයුතු අමාත්‍යාංශය ඉල්ලීමක් කර ඇත. මෙම ඉල්ලීම ලැබුණේ ශ්‍රී ලංකාවේ බංග්ලාදේශ මහ කොමසාරිස්තුමන් පසුගියදා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමන් සමඟ පැවැති සුහද හමුවීමකින් අනතුරුවය.

2022 නොවැම්බර් මාසය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම වරණීය වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡාවල වත්මන් තත්ත්වය ජනාධිපති ලේකම් කාර්යාලයට දන්වා යවා ඇති අතර, ඒ යටතේ නව ජාතික වෙළඳ සාකච්ඡා කමිටුව ස්ථාපිත කර ඇති අතර, ඔවුන්ගේ ඉදිරි පියවර පිළිබඳ මගපෙන්වීම අපේක්ෂා කරන ලදී.

VIII. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරයෙහි (SLTIP) පියවරෙන් පියවර කාර්යාත්මකත්වය

අ. වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය සහ පියවරෙන් පියවර කාර්යාත්මකත්වය මඟින් සපයනු ලබන සේවා පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීමේ වැඩසටහන්

ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC), වාණිජ දෙපාර්තමේන්තුව, GIZ සහ කලාපීය වාණිජ මණ්ඩල සමඟ එක්ව ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරයට (SLTIP) ඇතුළත් කර ඇති පියවරෙන් පියවර කාර්යාත්මකත්ව ක්‍රියා පටිපාටිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු මාලාවක් 2022 වසර තුළ සංවිධානය කළේය.. වසරේ පළමු වැඩසටහන 2022 අගෝස්තු 16 වන දින ගාල්ලේදී පැවැත් වූ අතර දෙවන වැඩසටහන 2022 අගෝස්තු 31 වන දින අනුරාධපුරයේදී පැවැත්විණි. තෙවන වැඩසටහන 2022 සැප්තැම්බර් 08 වන දින ගම්පහ දී පැවැත්විණි. සිව්වන වැඩසටහන 2022 සැප්තැම්බර් 13 වන දින ත්‍රිකුණාමලයේදී ද පස්වන වැඩසටහන 2022 ඔක්තෝබර් 11 වන දින මහනුවරදී ද හයවන වැඩසටහන 2022 නොවැම්බර් 10 වන දින යාපනයේදී ද පවත්වන ලදී. මෙම වැඩමුළු වල අරමුණු වන්නේ වෙළඳ ක්‍රියා පටිපාටි, එය ක්‍රියාත්මක වන ආකාරය සහ එහි ප්‍රතිලාභ වෙළඳ පාර්ශවකරුවන් සඳහා වන පියවරෙන් පියවර මාර්ගෝපදේශනය ප්‍රදර්ශනය කිරීමයි.

ආ. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය නිතිපතා යාවත්කාලීන කිරීම

දේශසීමා වෙළඳාමට අදාළ රාජ්‍ය ආයතන 41 කින් තොරතුරු ලබා ගැනීමෙන් අදාළ මාස අනුව ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය 2022 වසර පුරා නිතිපතා යාවත්කාලීනව තබා ඇත.

ඇ. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය (SLTIP) විගමනය සහ මාරු කිරීම

දියත් කළ දින සිට වසරක් සඳහා ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරයෙහි සත්කාරකත්වය සහ නඩත්තුව සඳහා අනුග්‍රහය දැක්වීමට ලෝක බැංකුව එකඟ වූ අතර පසුව මෙය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී. සයිබීරියා යනු ලාඕ හි පිහිටි සමාගමක් වන අතර එය 2022 ජනවාරි මස අවසානය දක්වා තොරතුරු ද්වාරයෙහි සත්කාරකත්වය ලබා දී ඇත.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සහාය ඇතිව මිල ගණන් සඳහා තොරතුරු (IFQ) අවසන් කරන ලද අතර සාප්පු සවාරි ක්‍රමය යටතේ සමාගම් 11කින් (ICTA විසින් සපයන ලද) මිල ගණන් කැඳවන ලදී. තොරතුරු ද්වාරය නඩත්තුව සඳහා සමාගම් තුනක් ලංසු ඉදිරිපත් කළේය. 2021.11.15 (වසරක කොන්ත්‍රාත්තුවක්) සිට බලපැවැත්වෙන පරිදි ොතොරතුරු ද්වාරය නඩත්තු කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් Arimac Lanka Pvt Ltd පත් කරන ලද අතර ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය එය Lanka Government Cloud (LGC) හි නොමිලේ සංග්‍රාහක කරයි.

වෙළඳ තොරතුරු ද්වාරයෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් Arimac Lanka PVT LTD සමඟ 08.08.2022, 17.10.2022 සහ 24.11.2022 යන දිනවල දෙමුහුන් ආකාරයෙන් පැවැත්විණි.. මෙම රැස්වීමේ පරමාර්ථය වූයේ අවදානම් තක්සේරු පරීක්ෂණය (දෝෂ ප්‍රතිසාධනය පිළිබඳ) වාර්තාවට සමගාමීව ගාස්තු උඩුගත කිරීමේ කොටස කඩිනම් කිරීමයි.

ඈ. පියවරෙන් පියවර කාර්යාත්මකත්වය

පියවරෙන් පියවර ක්‍රියාකාරීත්වය (SBSF) යනු වත්මන් ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරයෙහි පරිශීලක සුහදත්වය වැඩිදියුණු කිරීම සඳහා වන අතිරේක ක්‍රියාකාරීත්වයකි. SBSF යටතේ 49 අපනයන නිෂ්පාදන සහ ආනයන නිෂ්පාදන 06ක් දැනටමත් සිතියම් ගත කර ඇති අතර, උනන්දුවක් දක්වන වෙළඳුන්ට අපනයන සහ ආනයන ක්‍රියා පටිපාටි පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සපයයි.

IX. වෙළඳ සංක්ෂේප සූදානම් කිරීම

විවිධ බාහිර පාර්ශ්වයන්ගේ ඉල්ලීම මත 2022 වර්ෂය තුළ ද්විපාර්ශ්වික වෙළඳාම පිළිබඳ වෙළඳ සංක්ෂේප/වාර්තා 293 විස්තීර්ණ හා ඒකාබද්ධ ආකාරයකින් සකස් කර ඇත.

1.5.4 වෙළඳ ප්‍රවර්ධන අංශය

වාණිජ දෙපාර්තමේන්තුව ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වල සමස්ත ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සබඳතා සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර ඉහත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශයන්හි වෙළඳ ප්‍රතිපත්ති සහ වෙළඳ ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සිදු කරයි.

විදේශයන්හි වෙළෙඳ ප්‍රවර්ධනය වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරකමක් වන බැවින්, අපනයන ප්‍රවර්ධන, අපනයන සංවර්ධනය, විදේශයන්හි වාණිජ නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් සහ වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ වාර්තා කිරීමේ අනෙකුත් යාන්ත්‍රණ ඉහළ බලධාරීන්ට වාර්තා කිරීමේ සමස්ත කාර්යය සමාලෝචනය කිරීම සඳහා වෙළඳ ප්‍රවර්ධන අංශයක් පිහිටුවන ලදී.

ඕනෑම තත්වයක් යටතේ, වෙළඳාම, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධනය ජාත්‍යන්තර/විදේශ වෙළඳාමේ ප්‍රධාන අංශයක් වන අතර එය පුද්ගලික අංශයට නව වෙළඳපොළට ඇතුළු වීමට, වෙළඳපල තත්ත්වයන් සහ බාධක පිළිබඳ දැනුම ලබා ගැනීමට සහාය වේ. වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ඔවුන්ගේ තාක්ෂණික දැනුම සහ ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික වෙළඳ විධිවිධාන පිළිබඳ ආයතනික අත්දැකීම් උපයෝගී කරගනිමින් අපනයනකරුවන්ට දේශීයව සහ විදේශයන්හි වාණිජ නිලධාරීන් ලෙස සම්බන්ධතා ඇති කර ගැනීමට සහ විදේශයන්හි නව වෙළඳපල සොයා ගැනීමට සහාය වේ.

ප්‍රධාන වශයෙන් ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සිදු කරනු ලබන්නේ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත වානිජ නිලධාරීන් හරහා ය. වෙළඳාම, සංචාරක සහ ආයෝජන වැඩි කිරීම, ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් සඳහා සහයෝගීතාවය, ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර සන්ධානය ගොඩනැගීම සඳහා ඔවුන් ක්‍රියාකාරීව සම්බන්ධ විය.

දෙපාර්තමේන්තුවේ වෙළඳ ප්‍රවර්ධන අංශය යටතේ ක්‍රියාකාරකම් පහත වගුවේ දැක්වේ.

අ.අ	ප්‍රධාන විෂය ක්ෂෙත්‍ර	ක්‍රියාකාරකම
1	අපනයන ප්‍රවර්ධන	වාණිජ දෙපාර්තමේන්තුව/ විදේශයන්හි වෙළඳ නිලධාරීන් සමඟ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආධාරක සංවිධාන සමඟ රැස්වීම් සංවිධානය කිරීම.
		ශ්‍රී ලංකාවේ අනාගත අපනයනකරුවන්ගෙන් සහ වෙනත් රටවල අනාගත ආනයනකරුවන්ගෙන් ලැබෙන වෙළඳ විමසීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
		විදේශයන්හි ශ්‍රී ලංකා වෙළඳ ප්‍රවර්ධන සිදුවීම් ප්‍රවර්ධනය කිරීම
		විභව අපනයනකරුවන්/නිෂ්පාදන සංගම්/ප්‍රමුඛ වාණිජ මණ්ඩල අතර විදේශීය වෙළඳ ප්‍රදර්ශන/වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම
		සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අපනයන ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම
		විදේශිකයන් සඳහා නේවාසික වීසා වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයට නිර්දේශ කිරීම
2	අපනයන සංවර්ධනය	අපනයනකරුවන්ට තාක්ෂණික නිරාවරණ වැඩසටහන් සංවිධානය කිරීම.
		ඕස්ට්‍රේලියාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ (විශේෂයෙන් මාළු සහ ආහාර නිෂ්පාදන අපනයනය සඳහා) ශ්‍රී ලංකා අපනයනකරුවන් සහ අනාගත ආනයනකරුවන් අතර ස්වස්ථතාව හා ශාඛසෞඛ්‍යය ක්‍රියාමාර්ග සහ වෙළඳාම සඳහා තාක්ෂණික බාධක ප්‍රමිති අවශ්‍යතා සහ ව්‍යාපාරික ගැලපීම් පිළිබඳ ශ්‍රී ලංකා

		දූත මණ්ඩල සමඟ එක්ව දැනුවත් කිරීමේ සැසිය සංවිධානය කිරීම
		විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලය/ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල හෝ සෘජු අපනයනකරුවන්/ආනයන්නන් හරහා දෙපාර්තමේන්තුවට ලැබෙන වෙළෙඳ පැමිණිලිවලට සහභාගි වීම.
		නව ව්‍යවසායකයින් හඳුනා ගැනීමට රේඛීය අමාත්‍යාංශවලට පහසුකම් සැලසීම.
3	**විදේශයන්හි වාණිජ නිලධාරීන් සමඟ වෙළෙඳ, ආයෝජන, සංචාරක යන ක්ෂේත්‍රවල විදේශීය වෙළෙඳපොළ පුළුල් කිරීමේ ක්‍රියාකාරකම්/ වැඩසටහන් සංවිධානය කිරීම**	සත්කාරක රටේ වෙළඳ ප්‍රවර්ධන ආයතන සහ ප්‍රධාන ආනයනකරුවන් සමඟ අන්තර් ක්‍රියා කිරීමෙන්, අනාගත අපනයනකරුවන්ගෙන් ලැබෙන වෙළඳ විමසීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම..
		ශ්‍රී ලංකාවේ වෙළෙඳ, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධන ආයතන සඳහා ප්‍රධාන වෙළෙඳ/සංචාරක/ආයෝජන ප්‍රදර්ශන හඳුනාගෙන නිර්දේශ කිරීම සහ වාණිජ නිලධාරියා විසින් ගොඩනඟන ලද සම්බන්ධතා හරහා එම ප්‍රදර්ශනවලදී ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීමට ඔවුන්ට සහාය වීම.
		විභව දේශීය හවුල්කරුවන් හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකා අපනයනකරුවන් සඳහා නව ආනයනකරුවන්/ හවුල්කරුවන් සොයා ගැනීම සඳහා B2B රැස්වීම් සංවිධානය කිරීම.
		රජයේ අමාත්‍යවරුන් සහ අනෙකුත් ප්‍රභූවරුන් සඳහා වැඩි නිරාවරණයක් ලබා දීම සඳහා ව්‍යාපාර ආශ්‍රිත වැඩසටහන් සංවිධානය කිරීම, වෙළඳාම සම්බන්ධ ගැටළු විසඳීම සහ වෙළඳාමට පහසුකම් සැලසීම සඳහා තාක්ෂණික සහාය සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ලබා ගැනීම.
		විශේෂයෙන්ම ශ්‍රී ලංකා සේවා අංශයට නව මාවතක් ඇති විදේශ ප්‍රධාන රාජ්‍ය ප්‍රසම්පාදන ටෙන්ඩර් සඳහා දායකත්වය.
		වාණිජ දෙපාර්තමේන්තුවේ සේවය කරන අතරතුර වාණිජ නිලධාරීන් විසින් ලබා ගන්නා ලද ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික ගිවිසුම් සමඟින් ලබාගත් තාක්ෂණික දැනුම සහ අත්දැකීම්වල සහාය ඇතිව වාණිජ බුද්ධිය ලබා දීම, මව් රට මුහුණ දෙන වෙළඳ බාධක සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ අපනයනකරුවන් සඳහා නව අවස්ථා ලබා දීම.
		අපනයනකරුවන්ට ජාත්‍යන්තර වෙළඳපොලේ වැඩි නිරාවරණයක් ලබා ගැනීමට සහ නව ගැනුම්කරුවන් සොයා ගැනීමට සහාය වන ව්‍යාපාරික චාරිකා වැඩසටහන් නිර්දේශ කිරීම.
		ජාත්‍යන්තර වෙළෙඳපොළට වැඩි නිරාවරණයක් සැපයීම සඳහා සත්කාරක රටෙහි වෙළෙඳ/සංචාරක/ආයෝජන ප්‍රවර්ධන ආයතනවල සහාය ඇතිව අභ්‍යන්තර සහ බාහිර ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම් සංවිධානය කිරීම/ පහසුකම් සැලසීම.
		ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම / පහසුකම් සැලසීම
		සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රචාරණය සහ ප්‍රවර්ධන ව්‍යාපාර සැලසුම් කිරීම
		තානාපති කාර්යාලයේ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන්වගකිය යුතු පිරිස් සමඟ සම්බන්ධ වීම සහ අත්සන් කරන ලද නිදහස් වෙළඳ ගිවිසුම්/වරණීය වෙළඳ.ගිවිසුම්/ කලාපීය වෙළඳ ගිවිසුම් ආදිය පිළිබඳව මතු කරන ලද වෙළඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ ගැටළු පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව සහ තාක්ෂණික පුහුණු වැඩසටහන් හරහා වාණිජ නිලධාරීන් ලබාගෙන ඇති තාක්ෂණික දැනුම සහ පළපුරුද්ද යොදා ගනිමින් සත්කාරක රජය සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
		වානිජ නිලධාරියාගේ තාක්ෂණික දැනුම හා පළපුරුද්ද උපයෝගී කර ගනිමින් වෙනත් රටවල රැස්වීම් හා කථන පැවරුම් නියෝජනය කිරීම, වෙළඳ නියෝජිතයින්ගේ ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
		වාණිජ දෙපාර්තමේන්තුව සමඟ එක්ව, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා පහසුකම් සැලසීම සඳහා මෙන්ම සහයෝගීතාවයේ අනෙකුත් ක්ෂේත්‍රවලදී මෙන්ම විවිධ රාජ්‍ය ආයතනවලට ඔවුන්ගේ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමට සහාය වන ඒකාබද්ධ කොමිෂන් සභා/වෙළඳ හා ආයෝජන පහසුකරණ ගිවිසුම්/ ක්‍රියාකාරී කණ්ඩායම්වලට අදාළ කරුණු සම්බන්ධීකරණය සහ පසු විපරම් කිරීම. ශ්‍රී ලංකා ආර්ථිකයට ඒවායේ බලපෑම / ප්‍රතිලාභ උපරිම කිරීමට වැඩසටහන්/

		ව්‍යාපෘති / ක්‍රියාකාරකම් සක්‍රීය කිරීමට ප්‍රතිපත්තිමය සහාය ලබා දීම.
		අසාධාරණ වෙළඳාම සහ අනෙකුත් භාවිතාවන් පිළිබඳව අනෙකුත් වෙළඳ පාර්ශවකරුවන්ට එරෙහිව ශ්‍රී ලංකාව විසින් මතු කරනු ලබන විශේෂිත වෙළඳ හෝ අනෙකුත් ප්‍රවේදිතාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඉදිරිපත් කිරීම, විශේෂයෙන්ම ලෝක වෙළඳ සංවිධානය/යුරෝපීය සංගමය/ආහාර හා කෘෂිකර්ම සංවිධානය/කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල/ලෝක ආහාර වැඩසටහන යන බහුපාර්ශවීය ක්ෂෙත්‍රයන්හි සභා/කමිටු/ විද්වත් මණ්ඩප සාකච්ඡා/ද්විපාර්ශවික/කණ්ඩායම්/ උපදේශන රැස්වීම්/විශේෂ අවස්ථා ආදියේදී මෙතෙක් නොවිසඳී ඇති ගැටලු විසඳීම. තවද පවතින බැඳීම්වලට සරිලන පරිදි කරනු ලබන නිත්‍ය දැනුම්දීම් පිළිබඳව ද දැනුම් දෙනු ලැබේ
4	**අපනයන සංවර්ධන මණ්ඩලයට අදහස් හා තොරතුරු ලබාදීම**	විදේශයන්හි පැවැත්වෙන ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී විය හැකි අපනයනකරුවන් තෝරා ගැනීම සඳහා සහභාගී වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා සහභාගිවීම
		වෙළඳ ප්‍රවර්ධනය, ජාතික තත්ත්ව යටිතල පහසුකම්, ජාතික කාබනික පාලන ඒකකය (NOCU), කුළු බඩු වෙළඳනාම පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම, ඖෂධ පැළෑටි, පළතුරු සහ රස කළ තේ සඳහා පිරිවිතරයන් සංවර්ධනය කිරීම පිළිබඳ කමිටු රැස්වීම, ශ්‍රී ලංගම, ජාතික නවෝත්පාදන නියෝජිතායතන මෙහෙයුම් සභාව (NIA) පිළිබඳ උපදේශක කමිටුවට සහභාගී වීම.
5	**තිරුබඳු අනුපාත කෝටා සහතික නිකුත් කිරීම/ කෝටාව සඳහා ලිපි නිකුත් කිරීම.**	ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඇහලුම් අපනයනකරුවන් සඳහා ඇහලුම් කෝටා සහතික නිකුත් කිරීම
		පාකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ බාස්මතී සහල් කෝටාව ආනයනය කිරීම සඳහා තීරුබදු නිදහස් කිරීමේ නිර්දේශ ලිපි නිකුත් කිරීම
6	**සාමාන්‍ය**	ණය නියෝජිතායතනවල ප්‍රකාශය
		ශ්‍රී ලංකාවේ සිටින වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පුහුණු චාරිකා සංවිධානය කිරීමග
		වාණිජ නිලධාරීන්ගේ මාසික / කාර්තුමය සාරාංශ වාර්තා සකස් කිරීම
		වාණිජ දෙපාර්තමේන්තුවේ හි ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගතිය සහ කාර්ය සාධන වාර්තා සකස් කිරීම සහ සම්පාදනය කිරීම
		වාණිජ නිලධාරීන්ගේ මාසික/ කාර්තුමය/ වාර්ෂික/ විශේෂ වාර්තා සම්පාදනය/ සමාලෝචනය
		විදේශගත වාණිජ නිලධාරීන් සඳහා වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා අයවැය සම්පාදනය කිරීම.

I. වෙළඳ විමසුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම

සමාලෝචිත කාලය තුළ, වානිජ නිලධාරීන්ට එවැනි විමසීම් 991ක් ලැබී ඇති අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශ වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අවශ්‍ය තොරතුරු/මාර්ගෝපදේශ ලබා දෙමින් නිසි පරිදි සහභාගී වී ඇත. ශ්‍රී ලංකාවේ අනාගත අපනයනකරුවන්ගෙන් සහ අනෙකුත් වෙළෙඳාම ආශ්‍රිත ආයතනවලින් වාණිජ දෙපාර්තමේන්තුව වෙත ලැබුණු විමසීම් 32 ඔවුන්ගේ ක්ෂණික පසු විපරම් සඳහා වාණිජ නිලධාරීන් වෙත යොමු කරන ලදී.

II. වෙළඳ ආරවුල් නිරාකරණයට සහාය වීම

මතභේදයට තුඩු දී ඇති පාර්ශ්වයන් අතර සාමකාමී විසඳුමක් හරහා අපනයන හා ආනයන ආශ්‍රිත වෙළඳ ආරවුල් විසඳීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. වෙළඳ පැමිණිලි සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුවට ලැබෙනුයේ ශ්‍රී ලංකාවේ විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩල/ ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල

හරහා හෝ සෘජුවම ය. සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ එවැනි පැමිණිලි 136ක් සඳහා ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල සහ විදේශ දූත මණ්ඩල පදනම් කරගත් වාණිජ නිලධාරීන්ගේ සහාය ඇතිව කටයුතු කරන ලදී.

III. නේවාසික වීසා සඳහා නිර්දේශය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවවිසින් නියම කර ඇති පරිදි සහ වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරා ඇති පරිදි, වාණිජ දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා සඳහා නිර්දේශ ලිපි නිකුත් කරනු ලබන්නේ සම්බන්ධීකරණ කාර්යාලවල, ශාඛා කාර්යාලවල හෝ විදේශීය සමාගම්වල, අනෙකුත් වෙළඳ හා වාණිජ ආයතනවල සේවය කරන දක්ෂ පිටරට වැසියන්, උපදේශකයින්, විශේෂඥයින් සහ ඔවුන්ගේ යැපෙන්නන් සඳහා පමණක් වන අතර එහිදී අපනයන වෙළඳාම, තාක්ෂණ හුවමාරුව සහ ජාතික ආර්ථිකයට ඵලදායිතාව වැඩිදියුණු කිරීම ආදිය සඳහා එවැනි රැකියා වලින් ලැබෙන්නා වූ සෘජු ප්‍රතිලාභ සැලකිල්ලට ගනී.

2022 දී වෙළඳ සහ සේවා අංශවල විදේශිකයන් 93 දෙනෙකු සහ යැපෙන්නන් 51 දෙනෙකු සඳහා නේවාසික වීසා නිර්දේශ ලිපි නිකුත් කරන ලදී.

IV. ණය දෙන ආයතන අනුමත කිරීම

1949 අංක 6 දරන උකස් පනත යටතේ, අනුමත ණය දෙන ආයතනයක් ලෙස සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයෙක් ප්‍රකාශයට පත් කිරීමට වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය පවරා තිබේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ කිරීමට අවශ්‍ය වන්නේ 1949 අංක 6 දරන උකස් පනතේ 114 (1) වගන්තිය යටතේ සභාපතිවරයෙකු සහ තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත අමාත්‍යවරයා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් කරන ලද නිර්දේශයක පදනම මතය.

වර්ෂය තුළ පත් කරන ලද මණ්ඩලයේ පළමු රැස්වීම 2022 ජනවාරි 7 වන දින පවත්වන ලද අතර සමාගම් 5ක අයදුම්පත් ඇගයීමට ලක් කරන ලදී. එක් අයැදුම්පතක් ප්‍රතික්ෂේප වූ අතර අනෙක් අයැදුම්පත් හතර ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරීක්ෂණ කටයුතු සඳහා මණ්ඩලය විසින් යොමු කරන ලදී.

මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා භාණ්ඩාගාරයේ සිට ශ්‍රී ලංකා රේගුවට මාරු කර ඇති බැවින් මුදල් අමාත්‍යාංශය විසින් 2022 ජුනි මාසයේදී මණ්ඩලයට නව සාමාජිකයෙකු නම් කරන ලදී. අයදුම්පත් 7ක් ඇගයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2022 අගෝස්තු 31 වන දින පැවැත්වුණු අතර මණ්ඩලය තීරණය කළේය. අයදුම්පත් පිරික්සීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් කෙටුම්පත් කිරීමට සහ අදාළ ආයතනවල සහාය ඇතිව යාන්ත්‍රණය කෙටුම්පත් කරන ලෙස වාණිජ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියේය.

2022 සැප්තැම්බර් 12 සහ 2022 ඔක්තෝබර් 3 වැනි දිනවල ද මණ්ඩලය ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරාධිත නිලධාරියෙකු සමඟ රැස් වූ අතර මණ්ඩලයේ නිර්දේශය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මාර්ගෝපදේශ සමඟ ණය නියෝජිතායතන අනුමත කිරීම සඳහා කෙටුම්පත් කරන ලද විස්තීරණ රාමුව සාකච්ඡා කර අවසන් කරන ලදී.

2022 දෙසැම්බර් 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡා කර සකස් කරන ලද මාර්ගෝපදේශ සමඟ සමාගම් 9ක අයදුම්පත් ඇගයීමට ලක් කළ අතර අනුමැතිය සඳහා සමාගම් 6ක් නිර්දේශ කිරීමට තීරණය කරන ලදී.

V. දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම

- බී හයිව්ස් ඕගනික් (පුද්ගලික) සමාගමේ ඖෂධ පැළෑටි සහ කුළුබඩු නිෂ්පාදන විදේශීය වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් එහි නිෂ්පාදන හඳුන්වාදීම සඳහා Zoom රැස්වීමක් සංවිධානය කරන ලදී. ගරු මහ කොමසාරිස්වරුන්, තානාපතිවරුන් ඇතුළුව තානාපති නිලධාරීන් සහ වෙළෙඳ, වාණිජ හා ආහාර

සුරක්ෂිතතා අමාත්‍යාංශයේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල තානාපතිවරුන්, කොන්සල් ජනරාල්වරුන් සහ වාණිජ නිලධාරීන් මෙම රැස්වීමට සහභාගි වූහ.

බී හයිව්ස් ඕගනික් (පුද්ගලික) සමාගමේ කළමනාකාර සුමුදු ගමගේ මහතා කැකිරාව අවට ගෑමී ගොවීන්ගේ සහය ඇතිව සමාගම නිෂ්පාදනය කරන නිෂ්පාදන පිළිබඳව විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කළ අතර විදේශීය වෙළෙඳපොළේ ගැනුම්කරුවන්/ආනයන්නන් සොයා ගැනීමට සහාය ඉල්ලා සිටියේය.

- සිලෝන් ට්‍රොපිකාන් පුද්ගලික සමාගමේ උසස් තත්ත්වයේ ශ්‍රී ලාංකේය ඖෂධීය විදේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම: උසස් තත්ත්වයේ ශ්‍රී ලංකා ඔසු සෞඛ්‍ය නිෂ්පාදන ආනයනය කරන්නන් සොයා ගැනීම සඳහා නිෂ්පාදන අත් පත්‍රිකාව සහ සමාගමේ පැතිකඩ වාණිජ නිලධාරීන් අතර බෙදා හරින ලදී. ජපානයෙන් එක් ආනයනකරුවෙකු සාම්පල අපනයනය සඳහා දැනටමත් තහවුරු කර ඇති අතර ලන්ඩනයේ සිට තවත් ආනයනකරුවෙකු ශ්‍රී ලංකා අපනයනකරු සමඟ සාකච්ඡා කරමින් සිටී.

වරණීය පොදු ක්‍රමය අනෙකුත් රටවල් *	12,495	12,468	10,884	8775	6,775	7,209	6494
අනු එකතුව 1	***86,498***	***93,335***	***54,564***	***13,103***	***6,775***	***7,209***	***6,494***
ඉන්දු- ශ්‍රී ලංකා නි.වෙ.ගි.	12,621	12,864	12,882	13,743	9,972	12,085	11,973
පාකිස්ථාන් ශ්‍රී ලංකා නි.වෙ.ගි.	6,673	6,703	5,265	6,669	5,608	4,373	4,090
ආසියා ශාන්තිකර වෙ.ගි.	4,508	6,038	4,290	5,515	5,806	6,135	5,068
දකුණු ආසියානු නි.වෙ.ගි.	149	679	557	1,323	671	1,240	982
දකුණු ආසියානු ව.වෙ.ගි.	288	277	239	220	117	135	136
ගෝලීය වෙළඳ වරණ ක්‍රමය	143	100	143	137	187	139	123
උප එකතුව 2	***24,382***	***26,661***	***23,376***	***27,607***	***22,361***	**24,107**	**22,372**
මුළු එකතුව	**110,880**	**119,996**	**77,940**	**40,710**	**29,136**	**31,316**	**28,866**

*REX ක්‍රමය (අපනයනකරුගේ ප්‍රකාශය) 2019.07.01 සිට ක්‍රියාත්මක කරන ලද බැවින් වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික පත්‍ර සංඛ්‍යාව අඩු වී ඇත.

ඊට අමතරව, අපනයනකරුවන් සහ සාමාන්‍ය ජනතාව සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් සේවාවන් සපයා හෝ සම්පූර්ණ කර ඇත.

සපයනු ලැබූ සේවා	සංඛ්‍යාව (2022)
සමාගම් ලියාපදිංචිකිරීම්	178
පිරිවැය ප්‍රකාශන	3,490
දිවිරුම් ප්‍රකාශ	684
විමසීම්	28,866
තහවුරු කරගැනීම්	498

II යුරෝපීය සංගම් GSP REX ක්‍රමය

ලියාපදිංචි අපනයනකරුවන්ගේ ක්‍රමය (REX ක්‍රමය) යනු යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය යටතේ අපනයනය කෙරෙන භාණ්ඩ සඳහා ප්‍රභවස්ථාන සහතික ලබා ගැනීම පිළිබඳව 2017 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන ක්‍රමයකි. මෙම ක්‍රමය යටතේ ප්‍රභවස්ථාන සහතිකය වෙනුවට අපනයනකරුවාගෙන් ප්‍රකාශයක් පමණක් සහතිකකරණය සඳහා අවශ්‍ය වේ.

REX ක්‍රමය ක්‍රියාත්මක කිරීම 2018.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාව ආරම්භ කළ අතර 2019.07.01 සිට එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන ලදී. 2021 වසරේදී REX ක්‍රමය යටතේ ලියාපදිංචි වූ මුළු සමාගම් සංඛ්‍යාව 99 ක් වූ අතර යුරෝපා සංගමය වෙත අපනයන සිදු කිරීම පිණිස මේ වන විට REX ක්‍රමය භාවිතා කරනු ලබන මුළු සමාගම් සංඛ්‍යාව 1,023 කි.

III. විද්‍යුත් ප්‍රභවස්ථාන සහතික පද්ධතියක් සකස් කිරීම

පද්ධතියේ පවතින අඩුපාඩු සඳහා පිළියම් යෙදීමට සහ ඊට නව විශේෂාංග එකතු කිරීමේ අරමුණින් වාණිජ දෙපාර්තමේන්තුව, ITC සහ GIZ හි තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇතිව, ප්‍රභවස්ථාන සහතික ඉලෙක්ට්‍රොනිකව නිකුත් කිරීම සඳහා දැනට පවතින පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය කොවිඩ් -19 වසංගතයේ සන්දර්භය තුළ දියත් කරන ලද අතර, ආරක්ෂාව සම්බන්ධයෙන් වර්තමානයේ පවතින ගැටළු හේතුවෙන් සංචලනය සීමා කිරීම්, කඩින් කඩ අගුලු දැමීම් සහ මුහුණට මුහුණ අන්තර්ක්‍රියා අවම කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අපනයනකරුවන් මුහුණ දෙන අභියෝගවලට විසඳුම් සෙවීමේ අරමුණින් එය දියත් කරන ලදී. ඒ අතරම, ප්‍රභවස්ථාන සහතික සහ අනෙකුත් උපකාරක සේවා නිකුත් කිරීම වඩා සුංසවිධිත කිරීම හා කඩිනම් කිරීම නව පද්ධතිය තුළින් අපේක්ෂා කෙරේ.

2022 වසර අවසන් වන විට, ITC සහ වාණිජ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත.

> විද්‍යුත් ප්‍රභවස්ථාන සහතික ව්‍යාපෘතියේ සංවර්ධකයා ලෙස තෝරා ගන්නා ලද එලිසියන් ක්‍රෙස්ට් සමාගම, වාණිජ දෙපාර්තමේන්තුව සමඟ උපදේශනය කර මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර (SRS) ලේඛනය සකස් කරන ලද අතර එම පිරිවිතර ලේඛනය 2022 පෙබරවාරි 25 වන දින වාණිජ දෙපාර්තමේන්තුව විසින් අත්සන් කරන ලදී.

විද්‍යුත් ප්‍රභවස්ථාන පද්ධතිය සමඟ LPOP ඒකාබද්ධ කිරීම සඳහා මහ බැංකු අනුමැතිය 2022 මාර්තු 4 වැනි දින ඉල්ලා සිටි අතර එය ලැබී ඇත.

සර්වරයේ අවශ්‍යතා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ බෙදා ගන්නා ලද අතර නියෝජිතායතනය විසින් Lanka Government Cloud හි සර්වර් සේවාදායක අවකාශය වෙන් කරන ලදී.

මෘදුකාංග සංවර්ධන සමාගම අවශ්‍ය විනිශ්චයන් සිදු කිරීම හාරගත් අතර ඔවුන්ගේ පරීක්ෂණ සර්වරයේ සිට Lanka Government Cloud වෙත සත්කාරකත්වය මාරු කරන ලදී.

දත්ත සංක්‍රමණය සම්පූර්ණ කරන ලද අතර වාර්තාකරණ කාල සීමාව තුළ, 'යෝග්‍යතාව' සහ 'ලියාපදිංචි කිරීමේ' සංරචක සජීවී විය. සජීවී වීමට පෙර, සංරචක දෙකෙහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පද්ධතිය හරහා ප්‍රභවස්ථාන සහතික සඳහා අයදුම් කිරීමේදී අදාළ සියලුම ලේඛන ඉදිරිපත් කරන ලෙස ව්‍යාපෘති කමිටු සාමාජිකයින්ගෙන් ඉල්ලා සිටියේය.

නව විද්‍යුත් ප්‍රභවස්ථාන පද්ධතිය තුළ ලියාපදිංචි වන්නේ කෙසේද යන්න පිළිබඳව අපනයනකරුවන් සඳහා සති 2ක කාලයක් තුළ දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී. මෙම දැනුවත් කිරීමේ සැසි සඳහා සමාගම් 200 ක් පමණ පුහුණු කරන ලදී. පුවක් සහ ගම්මිරිස් අපනයනකරුවන්ගේ ලියාපදිංචිය සඳහා වෙනම දැනුවත් කිරීමේ සැසි ද පවත්වන ලදී. දැනට පවතින අපනයනකරුවන්ට නව විද්‍යුත් ප්‍රභවස්ථාන ක්‍රමයේ ලියාපදිංචි වීම සඳහා නොවැම්බර් අවසානයේ අවසාන නිවේදනයක් ලබා දී ඇත.

අපනයනකරු සහ වාණිජ දෙපාර්තමේන්තුව යන දෙපාර්ශවයටම අදාළ පද්ධතියේ අනෙකුත් මූලික ලක්ෂණ සංවර්ධනය කිරීම සහ පරීක්ෂා කිරීම ද සම්පූර්ණ කරන ලදී.

විද්‍යුත් ගෙවීම් ද්වාරය සංවර්ධනය කිරීම සම්පූර්ණ කරන ලදී. එක් එක් ගිවිසුම සඳහා නිකුත් කරන ලද, භාවිතා කරන ලද සහ ඉතිරිව ඇති හිස් කඩදාසි කළමනාකරණය කරන හිස් කඩදාසි කළමනාකරණ සංරචකය ද තොරතුරු තාක්ෂණ සංවර්ධන සමාගම විසින් වාණිජ දෙපාර්තමේන්තුවෙත ඉදිරිපත් කරන ලදී.

කෝටාව සඳහා නව චක්‍රය (ඇඟළුම් සඳහා-ISFTA) දෙසැම්බර් පළමු සතියේ විවෘත කිරීමත් සමඟ, තීරුබදු අනුපාත කෝටා සංරචකය 2022 දෙසැම්බර් මාසයේදී සජීවී විය.

වාණිජ දෙපාර්තමේන්තුවේ සමාගම් ලියාපදිංචිය, සමාලෝචන ක්‍රියාවලිය, ප්‍රභවස්ථාන සහතික අනුමත කිරීම සහ නිකුත් කිරීම සහ වියදම් ප්‍රකාශ/ දිවුරුම් ප්‍රකාශ සමාලෝචනය පිළිබඳ පුහුණුව අවසන් කරන ලදී.

අදාළ පරිශීලක අත්පොත් සහ යූ ටියුබ් වීඩියෝ ද ප්‍රභවස්ථාන රීති අංශය විසින් අනුමත කිරීමෙන් පසු මෘදුකාංග සංවර්ධන සමාගම විසින් සකස් කර බෙදා ගන්නා ලදී.

පරිගණක 6ක්, ලැප්ටොප් 4ක්, මොනිටර 13ක්, UPS' සහ VGA කාඩ්පත් 6ක්, ස්කෑනිං යන්ත්‍ර 2ක් විද්‍යුත් ප්‍රභවස්ථාන සහතික පද්ධතිය සඳහා ITC ආයතනය විසින් වාණිජ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.

වාණිජ දෙපාර්තමේන්තු ජාලය සහ නව පද්ධතිය සුරක්ෂිත කිරීම සඳහා, වාණිජ දෙපාර්තමේන්තුව විසින් කරන ලද නිල ඉල්ලීමක් මත ITC ආයතනය විසින් ෆයර්වෝල්යක් සපයන ලදී.

ගෙවීම් පද්ධති ඒකාබද්ධ කිරීමේ තාක්ෂණික විස්තර සහ අදාළ ලියකියවිලි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ලංකා ක්ලියර් සහ මහජන බැංකුව සමඟ බහුවිධ රැස්වීම් ද පවත්වන ලද අතර ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවය සහ අන්තර්ජාල ගෙවීම් දොරටුවට අදාළව ලංකා පේ මාර්ගගත ගෙවීම් වේදිකාව සහ මහජන බැංකු සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

1.6 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

අදාළ නොවේ.

1.7 විදේශ අරමුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ විස්තර (තිබේ නම්)

ව්‍යාපෘතියේ නම	ප්‍රදාන නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන	ව්‍යාපෘති කාලසීමාව
ප්‍රභවස්ථාන සහතික ඉලෙක්ට්‍රොනිකව නිකුත් කිරීම සඳහා ස්වයංක්‍රියකෘත පද්ධතිය	'සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වෙළඳ පහසුකරණය' ව්‍යාපෘතිය යටතේ ජර්මනියේ ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා ෆෙඩරල් අමාත්‍යාංශයේ මූල්‍ය සහාය සහිතව Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ)	ප්‍රසම්පාදනය ITC ආයතනය විසින් සෘජුව සිදුකරයි. යුරෝ 300,000 (මෘදුකාංග සංවර්ධනය සහ අනෙකුත් තාක්ෂණික පිරිවැය, වසර තුනක නඩත්තු සහාය, තො.තා. උපකරණ, ෆයර්වෝලය ආදි සියලු වියදම් මීට ඇතුළත් වේ.)	2021 ඔක්තෝබර් සිට 2023 ජූනි දක්වා

පරිච්ඡේදය 02- ප්‍රගතිය හා ඉදිරි සැලසුම්

2.1 ප්‍රගතිය

ගෝලීය සංදර්භය

ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ඇස්තමේන්තු වලට අනුව, 2022 වසරේ දෙවන භාගයේදී ලෝක වෙළඳාම ඉදිරිය කරා ගමන් කිරීමේ ජවය අහිමි වූ අතර ගෝලීය ආර්ථිකය මත ඇතිවන විවිධ කම්පන හේතුවෙන් 2023 දී එය මන්දගාමී වනු ඇත. ලෝක වෙළඳ සංවිධානයේ ආර්ථික විද්‍යාඥයින් අනාවැකි පළ කළේ 2022 දී ගෝලීය වෙළඳ භාණ්ඩ වෙළඳ පරිමාව 3.5% කින් වර්ධනය වනු ඇති බවයි. එය අප්‍රේල් මාසයේ පුරෝකථනය කළ 3.0% ට වඩා තරමක් යහපත්ය. කෙසේ වෙතත්, 2023 සඳහා, ඔවුන් 1.0% වැඩිවීමක් අපේක්ෂා කරන අතර එය පෙර ඇස්තමේන්තුගත 3.4% ට වඩා සැලකිය යුතු ලෙස පහත වැටීමකිත යුක්‌රේනයේ යුද්ධය, ඉහළ බලශක්ති මිල ගණන්, උද්ධමනය සහ දැඩි මූල්‍ය පාලනය ඇතුළු සම්බන්ධිත කම්පන කිහිපයකින් වෙළඳාම සහ නිමැවුම දැඩි දුෂ්කරතා ඇති වනු ඇත. (https://www.wto.org/english/news_e/pres22_e/pr909_e.htm- 30.12.2022)

2023 ඉදිරි දැක්ම පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථනය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානී ක්‍රිස්ටලීනා ජියෝජීවා මහත්මියට අනුව, 2023 වසරේදී ලෝක ආර්ථිකයෙන් තුනෙන් එකක් බොහෝ විට අවපාතයක පවතිනු ඇත. එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ චීනය යන රටවල ආර්ථිකය මන්දගාමී බව, යුක්‌රේනයේ යුද්ධය, ඉහළ යන මිල ගණන්, ඉහළ පොලී අනුපාත සහ චීනයේ කොවිඩ් පැතිරීම ගෝලීය ආර්ථිකයට මත දැඩි බරක් පටවන බව ඇය පැහැදිලි කළාය. තවද, අවපාතයේ නොමැති රටවල් පවා මිලියන සිය ගණනක් ජනයාට එය අවපාතයක් ලෙස හැඟෙනු ඇතැයි ඇය පැවසුවාය.

චීනය ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය වුවද, එය 2023 දී දුෂ්කර ආරම්භයකට මුහුණ දෙනු ඇත. චීන වර්ධනය සෘණාත්මක වනු ඇත; කලාපය මත එහි බලපෑම සෘණාත්මක වනු ඇත; ගෝලීය වර්ධනයේ බලපෑම සෘණාත්මක වනු ඇත. එක්සත් ජනපදයේ පසුබෑම චීනයේ සහ තායිලන්තය සහ වියට්නාමය ඇතුළු අනෙකුත් ආසියානු රටවල නිෂ්පාදනය කරන නිෂ්පාදන සඳහා අඩු ඉල්ලුමක් ඇති කරයි.

ඉහළ පොලී අනුපාත නිසාවෙන් ණය ගැනීම වඩා මිල අධික වීමට, අඩු ආයෝජන සිදුවීමට සහ ව්‍යාපාර පුළුල් නොවීමට හේතු වනු ඇත. එය ආයෝජකයින් ආර්ථිකයෙන් මුදල් ඉවත් කිරීමට හේතු වනු ඇත. විශේෂයෙන්ම දුප්පත් රටවලට ආහාර සහ බලශක්තිය වැනි තීරණාත්මක ආනයන සඳහා ගෙවීමට ඇත්තේ අඩු මුදලකි. ණය සඳහා ඉහළ පොලී අනුපාතවල බලපෑම රජයේ මට්ටමින් ආර්ථිකයන්ට ද බලපායි - විශේෂයෙන් නැගී එන වෙලඳපොලවලට, ඔවුන්ගේ ණය ආපසු ගෙවීමට දැඩි වෙහෙසක් දැරීමට සිදුවනු ඇත.

ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වෙළඳපොළවල ඉල්ලීම හැකිළෙමින් පවතී

ලෝක වෙළඳ සංවිධානයේ ඇස්තමේන්තු වලට අනුව, උතුරු ඇමරිකාව සහ යුරෝපය වැනි අපගේ සාම්ප්‍රදායික වෙළඳපලවලින් ආනයන ඉල්ලුම සැලකිය යුතු ලෙස සංකෝචනය වනු ඇත. පහත වගුවට අනුව උතුරු ඇමරිකාවේ ආනයන ඉල්ලුම වර්ධනය 2022 දී 8.5% සිට 2023 දී 0.8% දක්වා අඩු විය හැක. තවද, 2023 වසර සඳහා යුරෝපයේ ඉල්ලුම සෘණාත්මක වනු ඇත.

කෙසේ වෙතත්, ආසියාව සහ මැදපෙරදිග වැනි ශ්‍රී ලංකාවේ මීළඟ මට්ටමේ ආනයන වෙලඳපොලවල් පිළිවෙලින් 2.2% සහ 5.7% කින් වර්ධනය වනු ඇත.

වාර්ෂික ප්‍රතිශත වෙනස්වීම්

	2018	2019	2020	2021	2022	2023
ආනයන						
උතුරු ඇමෙරිකාව	5.1	-0.6	-5.9	12.3	8.5	0.8
දකුණු ඇමෙරිකාව	4.6	-1.8	-10.7	25.4	5.9	-1.0
යුරෝපය	1.9	0.3	-7.3	8.3	5.4	-0.7
රුසියානු ෆෙඩරේෂණය	4.0	8.3	-5.5	9.1	-24.7	9.4
අප්‍රිකාව	5.5	3.1	-14.7	7.7	7.2	5.7
මැද පෙරදිග	-4.4	11.2	-10.1	8.4	11.1	5.7
ආසියාව	5.0	-0.4	-1.0	11.1	0.9	2.2

ශ්‍රී ලංකා පරිදර්ශනය

2023 දී ලෝක වෙළඳාමේ මෙම ගෝලීය හැකිලීම, ශ්‍රී ලංකාව හා සමාන රටවලට අහිතකර ප්‍රතිවිපාක ඇති කරනු ඇත. අපගේම වෙළඳ දත්ත වලට අනුව, එය ශ්‍රී ලංකාව සඳහා ද එවැනිම රටාවක් නිරීක්ෂණය කළ හැකිය. සමස්ත වෙළඳාම 2021 දී බිලියන 32 සිට 2022 දී බිලියන 30 දක්වා පහත වැටී ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන්ම ආනයන මත පනවා ඇති පාලනයන් සහ අපනයන අංශයේ සුළු වර්ධනය හේතුවෙන් 2022 දී වෙළඳ හිඟය පාලනය කර ඇත. ගෝලීය අවපාතය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු ලෙස බලපෑමට බොහෝ ඉඩ කඩක් ඇත. විශාලතම පහර එල්ල වී ඇත්තේ රටේ නිෂ්පාදිත අපනයනවලටයි. දැනටමත්, 2022 අවසාන කාර්තුවේදී, අපනයන ඇණවුම් අඩු වී ඇති අතර ස්ථීර නිෂ්පාදන අපනයන පහත වැටී ඇත. 2023 පළමු භාගය සඳහා අපනයන ඇණවුම් පහත වැටී ඇති බැවින් මෙම ප්‍රවණතාවය දිගටම පවතිනු ඇති බව පැහැදිලිය. මෙය විශේෂයෙන්ම රටේ ප්‍රධාන අපනයනය වන ඇඟලුම් සම්බන්ධයෙන් එලෙස වනු ඇත. රබර් භාණ්ඩ සහ පිඟන් භාණ්ඩ අපනයනයට ද එය බලපා ඇත.

2.2 විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත ඉලක්ක

අධිශ්ඨානශීලී නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රතිපත්තිය

විශේෂයෙන්ම ආසියාවේ ප්‍රධාන ආර්ථිකයක් සමග අධිශ්ඨානශීලී නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රතිපත්තියක් රජයට තිබේ. ඉදිරි වසර දෙක තුළ ශ්‍රී ලංකාව ඉන්දියාව, චීනය සහ තායිලන්තය සමඟ පුළුල් නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) වැනි වඩාත් විස්තීර්ණ විධිවිධානවලට අවසානයේ ප්‍රවේශ වීම පිළිබඳව රජය සලකා බලයි. අපගේ සාම්ප්‍රදායික වෙලඳපොලවල ඉල්ලුම හැකිලීම සැලකිල්ලට ගෙන, නිදහස් වෙළඳ ගිවිසුම් උපාය මාර්ගය හරහා ශ්‍රී ලංකාව විශේෂයෙන්ම ආසියාවේ නව වෙලඳපොලවල් ගවේෂණය කිරීම අවශ්‍ය වේ.

නව වෙළඳ උපායමාර්ගය

2023 අයවැය තුළ වෙළඳ ප්‍රතිපත්තිය ප්‍රධාන ධාරා ගත කිරීම ඉලක්ක කර ගනිමින් රජය ක්‍රියාමාර්ග කිහිපයක් ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන්, රජය එක් අතකින් ජාතික ප්‍රතිපත්ති සාකච්ඡාවලදී වෙළෙඳ පැනිකඩ ඉහළ නැංවීමට අදහස් කරන අතරම එම පැනිකඩ පවත්වාගෙන යාමට ආයතනික යාන්ත්‍රණයක් සකස් කිරීමට අදහස් කරයි.

අයවැය මඟින් ඉදිරි වසර 10 සඳහා ජාත්‍යන්තර වෙළඳාම සඳහා ඉතා අභිලාෂකාමී ඉලක්ක දක්වා ඇත, එහිදී මුළු වෙළඳාම (අපනයන සහ ආනයන) දළ දේශීය නිෂ්පාදිතයෙන් 100% දක්වා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්‍රමානුකූලව පැරා තීරුබදු ඉවත් කිරීම 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ කිරීමට ද අපේක්ෂා කෙරේ.

වෙළඳ ප්‍රතිපත්තිය වඩා හොඳින් ආයතනගත කිරීම සඳහා විදේශ වෙළඳාම සහ ආයෝජන සඳහා නියෝජිතායතනයක් පිහිටුවීම, ජාත්‍යන්තර වෙළඳ නිලධාරි (ITO) සහ විදේශ කටයුතු සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය ස්ථාපිත කිරීම වැනි පියවර කිහිපයක් ද අයවැයේ අඩංගු විය.

වාණිජ රාජ්‍යතාන්ත්‍රිකත්වය

වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සබඳතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම් කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කළේය. ශ්‍රී ලංකාව තම වෙළඳ හවුල්කරුවන් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) සහ මනාප වෙළඳ ගිවිසුම් (PTAs) හරහා වරණයක් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහ වෙළඳපල ප්‍රවේශය පුළුල් කිරීම තවදුරටත් කරගෙන ගියේය.

ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා අපනයන ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ විදේශීය දූත මණ්ඩල සමඟ පුළුල් ලෙස සම්බන්ධ වීම තුළින් ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් වාණිජ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා රජය ඉහළම ප්‍රමුඛතාව ලබා දී ඇත.

වෙළඳාම පහසුකරණය

ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයෙකු වන අතර, වෙළඳ පහසුකරණ ගිවිසුම (TFA) ක්‍රියාත්මක කිරීමෙහි දිගටම නිරත විය. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය (SLTIP) හරහා කාලානුරූපව යාවත්කාලීන කරන ලද වෙළෙඳාම සම්බන්ධ තොරතුරු සැපයීම මගින් දේශසීමා වෙළඳාමට තවදුරටත් පහසුකම් සැලසීමේ උත්සාහයක් ලෙස. ජාත්‍යන්තර නියෝජිතායතන කලාපීය මණ්ඩලවල සහාය ඇතිව බස්නාහිර පළාතෙන් පිටත පිහිටි ව්‍යාපාරික ප්‍රජාවේ සාමාජිකයින් අතර ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය භාවිතය පුළුල් ලෙස පදනම් කර ගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමේ සැසි අඛණ්ඩව පවත්වයි.

දෙපාර්තමේන්තුව දැනටමත් නිදහස් වෙළඳ ගිවිසුම් සහ වරණීය වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රභවස්ථාන සහතිකය නිකුත් කිරීම පරිගණක ගත කර ඇත. එය 2022 වසර අවසන් වන විට දියුණු මට්ටමක පැවතුණි. එය ක්‍රියාත්මක කළ පසු දෙපාර්තමේන්තුවෙන් ප්‍රභවස්ථාන සහතික ලබා ගැනීමේදී පෞද්ගලික අංශයට කාලය සහ මුදල් ඉතිරි වනු ඇත.

2011 - 2022 කාලය සඳහා ශ්‍රී ලංකාවේ සම්පූර්ණ ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය පිළිබඳ සංඛ්‍යාලේඛන පහත පරිදි වේ.


(වටිනාකම: ඇ.ඩො. මිලියන)

වර්ෂය	අපනයන	වර්ධනය %	ආනයන	වර්ධනය %	මුව වෙළඳාම	වෙළඳ ශේෂය
2011	10,018	20.8	19,703	59.7	29,721	-9,685
2012	9,181	-8.4	17,889	-9.2	27,069	-8,708
2013	10,009	9.0	17,098	-4.4	27,107	-7,088
2014	11,044	10.3	19,246	12.6	30,290	-8,202
2015	10,212	-7.5	18,989	-1.3	29,201	-8,777
2016	10,217	0.1	19,515	2.7	29,732	-9,298
2017	11,411	11.69	21,324	9.2	32,735	-9,913
2018	11,687	2.42	22,069	3.5	33,756	-10,382
2019	11,769	0.7	19,486	-11.7	31,255	-7717

2020	9,912	-15.7	15,606	-19.9	25,518	-5,694
2021	12,249	23.9	20,052	28.66	32,301	-7,803
2022*	12,800	4.5	17,500	-12.7	30,300	-4,700

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව *

දෙසැම්බර් දත්ත රේඛිය ඇස්තමේන්තු මත පාදක වේ



පරිච්ඡේදය 03

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ACA -F

2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය **2021**		සටහන		නව්‍ය		
					Restated	
			2022		**2021**	
Rs.			රු.		රු.	
-	**ආදායම් ලැබීම්**		-		-	
-	ආදායම් බදු	**1**	-		-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-		-	**ACA-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-		-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-		-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-		-	
-	**ආදායම් නොවන ලැබීම්**		-		-	
-	භාණ්ඩාගාර අග්‍රිම		68,810,000		110,746,000	**ACA-3**
-	තැන්පතු		177,325		645,812	**ACA-4**
-	අත්තිකාරම් ගිණුම්		4,761,368		5,179,548	**ACA-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**73,748,693**		116,571,360	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**73,748,693**		116,571,360	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)**		14,518,504		5,929,621	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		**59,230,189**		110,641,739	
	අඩු කළා : වියදම්					
-	**පුනරාවර්තන වියදම්**					
75,080,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	72,818,487		65,664,514	
32,520,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	25,211,967		24,496,616	**ACA-2(ii)**

90,700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	672,888	45,254,127	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
198,300,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**98,703,342**	135,415,257	
	මූලධන වියදම්				
150,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	107,515	11,429,567	
750,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	711,371	490,188	
7,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	4,287,171	3,099,376	**ACA-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
100,000	හැකියා වර්ධනය	**14**	24,000	61,900	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
8,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**5,130,057**	15,081,031	
	තැන්පතු ගෙවීම්		484,463	31,535	**ACA-4**
	අත්තිකාරම් ගෙවීම්		4,157,543	5,472,093	**ACA-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**4,642,006**	**5,503,628**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		108,475,405	155,999,916	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(49,245,216)	(45,358,177)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(49,245,216)	(45,358,177)	**ACA-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ACA-3**
			(49,245,216)	(45,358,177)	


3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021	2020
		රු	රු
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසීඒ-6**	65,151,249	60,014,462
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	12,505,697	13,109,522
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**77,656,946**	**73,123,984**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		12,198,558	12,495,245
දේපළ පිරියත හා උපකරණ සංචිතය		65,151,249	60,014,462
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	307,139	614,277
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**77,656,946**	**73,123,984**

පිටු අංක 01.සිට 51දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 52 සිට 59දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තථ්‍ය	
	2022 රු.	නැවත ප්‍රකාශිත **2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	46,105,835	41,247,230
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	68,810,000	110,746,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,520,218	3,396,259
තැන්පතු ලැබීම්	177,325	645,812
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**118,613,378**	**156,035,301**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	98,068,609	101,614,047
සහනාධාර සහ මාරුකිරීම්	672,888	42,442,605
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	300,000
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	14,518,504	5,929,621
අත්තිකාරම් ගෙවීම්	4,157,543	5,227,305
තැන්පතු ගෙවීම්	484,463	31,535
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**117,902,007**	**155,545,113**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**711,371**	**490,188**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා - මුදල් වැය කිරීම්:		
භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	711,371	490,188
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලදු මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**711,371**	**490,188**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(711,371)**	**(490,188)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**0**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - නැත

3.5 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		රැස්කළ ආදායම	
		මුල්	අවසාන	ප්‍රමාණය (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
		බිංදුවයි			

3.6 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදනය		තථ්‍ය වියදම	අවසන් ප්‍රතිපාදනයේ % ක් ලෙස ප්‍රතිපාදන උපයෝජනය
	මුල්	අවසන්		
පුනරාවර්තන	198,300,000	198,300,000	98,703,342	50
ප්‍රාග්ධන	8,000,000	8,000,000	5,130,057	64

3.7 මූල්‍ය රෙගුලාසි 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 0000

අ. අ.	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල්	අවසාන		
	නැත					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ	60,014,462.27	65,151,249.35	නැත	100%

3.9 විගණකාධිපති වාර්තාව (ඇමුණුම 01)

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ක්‍රියාකාරී සැලැස්මක් පදනම් වූ වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශක

#	කාර්යසාධන දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
1	අන්‍යෝන්‍ය නොවන වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු සහන අත්කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම *	✓		
2	අන්‍යෝන්‍ය වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු සහන ලබා ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම**	✓		
3	පැවැත්වූ ඒකාබද්ධ කොමිෂන් සභා ගණන	✓		
4	බහුපාර්ශ්වික සංසදවලදී ශ්‍රී ලංකාවේ අභාලාෂයන් ආරක්ෂා කිරීම*	✓		
5	වාර්තා කර ඇති වෙළඳපල ප්‍රවේශ ගැටළු වලට මැදිහත් වීම සහ විසඳීම*	✓		
6	පැය 2 ක් ඇතුළත නිසි පරිදි පරිපූර්ණ කළ ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම	✓		
7	ව්‍යාපාර ගැලපීම් ගණන (තනි තනි වශයෙන්)	✓		
8	සංවිධානය කරන ලද ව්‍යාපාර ජාලකරණ සැසි ගණන	✓		
9	සංවිධානය කරන ලද ආයෝජන සම්මන්ත්‍රණ ගණන	✓		✓
10	විදේශයන්හි පවත්වන ලද ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව	✓		
11	තෝරාගත් විදේශ රටවල ප්‍රදර්ශන/වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම	✓		
12	ශ්‍රී ලංකාවේ පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන / ප්‍රදර්ශනවලට සහභාගී වීම සඳහා අභ්‍යන්තර මිලදී ගැනීමේ මෙහෙයුම් සංවිධානය කිරීම	✓		✓
13	FTAs/RTAs සහ PTAs යටතේ වෙළඳපල ප්‍රවේශ අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමේ සැසි	✓		
14	වෘත්තීය සංවර්ධනය/ ජාත්‍යන්තර වෙළඳාම් අවස්ථා තර්ජන පිළිබඳ පැවැත්වූ දැනුවත් කිරීමේ සැසි	✓		
15	ධාරිතා ගොඩනැගීමේ සම්මන්ත්‍රණ/වැඩමුළු පැවැත්වීම	✓	✓	
16	කටයුතු කළ වෙළඳ විමසීම් ගණන	✓		
17	කටයුතු කළ වෙළඳ පැමිණිලි ගණන	✓		
18	පදිංචි වීසා නිර්දේශ ගණන	✓		

* මෙය අඛණ්ඩ ක්‍රියාවලියකි. දෙපාර්තමේන්තුවට පවරා ඇති කාර්යයන්/ක්‍රියාකාරකම් සමාලෝචනයට භාජනය වන කාලය තුළ සම්පූර්ණ කර ඇත.

***අන්‍යෝන්‍ය නොවන ගිවිසුම් FTAS සහ PTAS වෙත යොමු වන අතර, ඒවා සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ජාත්‍යන්තර වෙළඳ කාර්යාලය (OIT) විසින් සම්බන්ධීකරණය කරන ලදී. දෙපාර්තමේන්තුව අඛණ්ඩ සාකච්ඡා සඳහා තාක්ෂණික විශේෂඥතාව පුළුල් කළේය. කාලසටහනේ දක්වා ඇති ඉලක්කගත ජයග්‍රහණය වාණිජ දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් දායකත්වයට යොමු වේ.*

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

අභිමතාර්ථ/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% -74%	75%-100%
අභමතාර්ථ 17: තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය ක්‍රියාත්මක කිරීමේ සහ යළි පණ ගැන්වීමේ ක්‍රම ශක්තිමත් කිරීම	ඉලක්ක 17.10: දෝහා න්‍යාය පත්‍රයේ සාකච්ඡාවල නිගමනයන් ද ඇතුළත්ව විශ්වීය, නීති පදනම් කරගත්, විවෘත, වෙනස් කොට සැලකිලි නොදක්වන සහ සමානාත්මයෙන් යුත් බහු පාර්ශවික වෙළඳ ක්‍රමයක් ලෝක වෙළඳ සංවිධානය යටතේ ප්‍රවර්ධනය කිරීම.*	ලෝක වෙළඳ සංවිධානයේහි (WTO) 12 වන අමාත්‍ය සමුළුව ඇතුළුව WTO සාකච්ඡා සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය. WTO වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුමේ අවශ්‍යතා සපුරාලීම; 2018 අංක 2 දරන ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ ප්‍රතිවිරෝධී බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂක පියවර පනත ක්‍රියාත්මක කිරීම; ශ්‍රී ලංකාවට එරෙහිව ආරම්භ කරන ලද වෙළඳ ප්‍රතිකර්ම විමර්ශනවලට ප්‍රතිචාර දැක්වීම; නිත්‍ය WTO කවුන්සිල සහ කමිටු යටතේ සාකච්ඡා සඳහා සහභාගී වීම. WTO හි 2022 වෙළඳාම සඳහා ආධාර ගෝලීය සමාලෝචනය; තාක්ෂණික සහාය වැඩසටහන්			✓
	අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් ලෝක අපනයනයට සපයන කොටස 2020 වන විට දෙගුණ කිරීමේ දැක්මකින් යුක්තව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සැලකිය යුතු මට්ටමකින් වර්ධනය කිරීම*	ව්‍යාපාරික ගැලපීමේ සිදුවීම් ගණන, තෝරාගත් විදේශ රටවල ව්‍යාපාර ජාලකරණ සැසි ගණන, අපනයන කේන්ද්‍රීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් විදේශ රටවල ආයෝජන සම්මන්ත්‍රණ ගණන, ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය පැවැත්වීම, තෝරාගත් විදේශ රටවල ප්‍රදර්ශන/වෙළඳ ප්‍රදර්ශන ගණන, ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන වෙළඳ ප්‍රදර්ශන/ප්‍රදර්ශනවලට සහභාගී වීම සඳහා අභ්‍යන්තර මිලදී ගැනීමේ දූත මණ්ඩල ගණන. FTA සහ PTA යටතේ ඇති අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ සැසි ගණන, වෙළඳ ගිවිසුම්/විධිවිධාන යටතේ තීරුබදු සහන සඳහා පහසුකම් සැලසීම සඳහා ප්‍රභව සහතිකය කඩිනමින් නිකුත් කිරීම, ඒකාබද්ධ කොමිෂන් සභා ගණන, මැදිහත්වීම් ගණන සහ වෙළඳපල ප්‍රවේශ ගැටළු විසඳීම වාර්තා කර ඇත.			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

I. WTO හි 12 වන අමාත්‍ය සමුළුව ඇතුළුව WTO සාකච්ඡා සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය. ආහාර සුරක්ෂිතතාවයට හදිසි ප්‍රතිචාර දැක්වීම, COVID 19 එන්නත් නිෂ්පාදනය සඳහා බුද්ධිමය දේපළ අයිතිවාසිකම් අත්හැරීම, COVID 19 වසංගතයට WTO සූදානම සහ අනාගත වසංගත සඳහා සූදානම සහ ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුම යන ක්ෂේත්‍රවල බහුපාර්ශ්විකව සාකච්ඡා කරන ලද නිගමන සුරක්ෂිත කරන ලදී

II. WTO වෙළඳ පහසුකම් ගිවිසුමේ අවශ්‍යතා සපුරාලීම

III. 2018 අංක 2 දරන ඩම්පින් විරෝධී සහ ප්‍රතිවිරෝධී රාජකාරි පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂක පියවර පනත ක්‍රියාත්මක කිරීම

IV. ශ්‍රී ලංකාවට එරෙහිව ආරම්භ කරන ලද වෙළඳ ප්‍රතිකර්ම විමර්ශනවලට ප්‍රතිචාර දැක්වීම

V. ව්‍යාපාර ගැලපීම් 1220ක් සංවිධානය කිරීම (B2B රැස්වීම්)

VI. තෝරාගත් විදේශ රටවල ව්‍යාපාර ජාලකරණ සැසි 138ක් පැවැත්වීම

VII. අපනයන-නැඹුරු ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් විදේශ රටවල ආයෝජන සම්මන්ත්‍රණ 39ක් සංවිධානය කිරීම

VIII. ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය පැවැත්වීම

IX. තෝරාගත් විදේශ රටවල ප්‍රදර්ශන/වෙළඳ ප්‍රදර්ශන 114 කට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම

X. තෝරාගත් විදේශ රටවල සංචාරක ප්‍රවර්ධන කටයුතු 276 ක් සංවිධානය කිරීම/පහසුකම් සැලසීම

XI. නිදහස් වෙළඳ ගිවිසුම් සහ වෙළඳ ගිවිසුම් යටතේ ඇති අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ සැසි

XII. වෙළඳ ගිවිසුම්/විධිවිධාන යටතේ තීරුබදු සහන සඳහා පහසුකම් සැලසීම සඳහා ප්‍රභව සහතිකය කඩිනමින් නිකුත් කිරීම

XIII. වෙළඳපල ප්‍රවේශ ගැටළු සඳහා මැදිහත් වීම සහ විසඳීම වාර්තා කර ඇත.

අභියෝග

I. තීරණාත්මක ගැටළු සම්බන්ධයෙන් එකඟතාවක් නොමැතිවීම සහ ප්‍රධාන සාමාජිකයන්ගේ පරස්පර අභිලාෂයන් හේතුවෙන් කලාපීය මට්ටමේ සාකච්ඡා වල ප්‍රගතිය අඩාල වීම.

II. ද්විපාර්ශ්වික කරුණුවලදී, වෙනස් මතිමතාන්තර නිසා සාකච්ඡාවල ඉදිරි ගමන නතර වීම.

III. පශ්චාත් උරුගුවේ වටයේ කාල සීමාවේදී, සාකච්ඡා ක්‍රියාවලියේ විශාල රටවල ආධිපත්‍යය සැලකිය යුතු ලෙස අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලෝක වෙළඳ සංවිධානයේ සාකච්ඡා වලදී සම්මුතියෙන් ගිවිසුමකට එළඹීම ඉතාමත්ම අසිරු කටයුත්තක් බවට පත්ව ඇත. ඒ වෙනුවට බහුපාර්ශ්වික මට්ටමේ සාකච්ඡා ආයෝජන පහසු කිරීම, තොරතුරු තාක්ෂණය, රජයේ ප්‍රසම්පාදනය වැනි ක්ෂේත්‍ර කරා අවධානය යොමු කරයි.

IV. ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීමේදී අනෙකුත් බාධක හා අවහිරතා අතර සැපයුම් අංශයේ බාධා පැවැතීම.

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	67	48	19
තෘතීයික	02	01	01
ද්විතියික	61	38	23
ප්‍රාථමික	21	16	05

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

විභාග දෙපාර්තමේන්තුව හා එක්ව නව සහකාර වාණිජ අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී. නව රජයේ සේවකයන් බඳවා ගැනීම සීමා කිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය හේතුවෙන් මෙම ක්‍රියාවලිය තවමත් අවසන් කර නොමැත. කෙසේ වෙතත්, දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මකව තබා ගැනීම සඳහා අධීක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් යටතේ විවිධ කාර්යයන් ඉටු කිරීමට දැනට සිටින නිලධාරීන්ට සිදු විය.

තවද, කළමනාකරණ සේවා නිලධාරි සහ රියදුරු කාණ්ඩවල කාර්ය මණ්ඩල හිඟය නිසා මාණ්ඩලික නිලධාරීන් සඳහා සහාය භූමිකාවක් සැපයීමේ දුෂ්කරතා ඇති විය. සහායක කාර්ය මණ්ඩලයේ හිඟය පෙන්වා දෙමින් අදාළ බලධාරීන් වෙත සන්නිවේදන කිහිපයක් යවා ඇත. මෙම තත්ත්වය යම් ප්‍රමාණයකට මහහරවා ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන්ගේ සේවක සංඛ්‍යාව වැඩි කිරීමටත් කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ඇතැම් කේඩර තනතුරු යටපත් කිරීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් යැවීමට තීරණය විය.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය රු. '000)		වැඩ සටහනේ ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
"බෙංගාල බොක්ක කලාපීය වෙළඳ සම්බන්ධතාවය" නම් වූ පුහුණු සහ ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන.	01	දින 1 යි	-	-	මාර්ගගත	දැනුම ලබා ගැනීම
සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආයෝජන පහසුකරණය හා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 7 යි	-	-	මාර්ගගත	ආයෝජන පහසුකරණය හා සංවර්ධනය පිළිබඳ දැනුම
දරිද්‍රතාවය තුරන් කිරීම සහ ගෝලීය තිරසාර සංවර්ධනය සඳහා දේශසීමා ඊ-වාණිජ්‍යය සඳහා දකුණු-දකුණු සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 5 යි	-	-	මාර්ගගත	ඊ-වාණිජ්‍යය පිළිබඳ දැනුම

ලෝක වෙළඳ සංගමය ප්‍රංශ - අයර්ලන්ත මෙහෙවර සීමාවාසික වැඩසටහන - 2022	01	මාස 10	-	-	ජිනීවා	ලෝ.වෙ.ස. සහ ලෝ.වෙ.සංවිධානයේ කර්තව්‍ය පිළිබඳ සමස්ත දැනුම
එ.ජා. කාර්මික සංවර්ධන සංවිධානය විසින් චීනයේ වෙළඳ, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධන සහ නීල ආර්ථිකය පිළිබඳ ශ්‍රී ලංකාවට පුහුණුව ලබා දෙන ලදී.	01	දින 1 යි	-	-	මාර්ගගත	දැනුම ලබා ගැනීම
ඕස්ට්‍රේලියාව ශ්‍රී ලංකාවට කෙටි පාඨමාලා ලබා දෙයි - වෙළඳ ප්‍රවර්ධනය සහ අලෙවිකරණය-පශ්චාත් කොවිඩ්-19	04	සති 3 යි	-	-	ශ්‍රී ලංකාව	දැනුම ලබා ගැනීම
වෙළඳාම සහ යටිතල පහසුකම් සම්බන්ධනය පිළිබඳ වට මේස සාකච්ඡාව	01	දින 2 යි	25		තායිලන්තය	දැනුම ලබා ගැනීම
සංචාරක අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද MICE සංචාරක වැඩමුළුව	02	දින 1 යි	-	-	ශ්‍රී ලංකාව	දැනුම ලබා ගැනීම
මූලික ගබඩා කළමනාකරණය පිළිබඳ පාඨමාලාව	01	දින 1 යි	9		ශ්‍රී ලංකාව	දැනුම ලබා ගැනීම
විශ්‍රාම වැටුප් ගණනය කිරීම හා ගෙවීම පිළිබඳ සම්මන්ත්‍රණය	02	දින 2 යි	15		මාර්ගගත	දැනුම ලබා ගැනීම

6.4 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට පුහුණු වැඩසටහන්වල දායකත්වය

ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය විවිධ මට්ටම් තුනකින් එනම්. බහුපාර්ශ්වික, කලාපීය සහ ද්විපාර්ශ්වික වශයෙන් ඉදිරියට ගෙන යාමේදී වාණිජ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ලෝක වෙළඳ සංවිධානය සහ අනෙකුත් බහුපාර්ශ්වික සංසදවලදී ශ්‍රී ලංකාවේ අවශ්‍යතා නියෝජනය කිරීම, කලාපීය සහ ද්විපාර්ශ්වික නිදහස්/වරණීය වෙළඳ ගිවිසුම් සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීම, වෙළඳ හා ආර්ථික සහයෝගිතාව සඳහා ඒකාබද්ධ කොමිෂන් සභාවලට නායකත්වය දීම සහ අනෙකුත් රජයන් සමඟ සමාන සැකසුම් ආදිය වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන වගකීම් වේ. මෙම සන්දර්භයේදී. විදේශයන්හි සිය වෙළඳ නියෝජිත සේවාව හරහා වාණිජ දෙපාර්තමේන්තුව වෙළෙඳ, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධකයෙකු සහ පහසුකම් සපයන්නෙකු ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයට වැදගත් දායකත්වයක් සපයයි.

දීපව්‍යාප්ත තරඟ විභාග පවත්වා ශ්‍රී ලංකා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්වීම් පිරිනමන වාණිජ දෙපාර්තමේන්තුවේ කුසලතා මත පමණක් සිදු කරන බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය මඟින් විශේෂිත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් දෙපාර්තමේන්තුවට සම්බන්ධ විය හැකි බවට සහතික කරයි. ඔවුන් බඳවා ගැනීමෙන් පසු, වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දේශීය හා ජාත්‍යන්තර සංසදවල සුදුසු පුහුණුවක් සහ නිරාවරණයක් ලබා දේ. වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධන යන දෙඅංශයේම දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීම, පශ්චාත් උපාධි අධ්‍යයන සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටතේ ඇති රැකියා පුහුණුව ආදිය මෙයට ඇතුළත් වේ. විදේශ අමාත්‍යාංශය සමඟ ඇති ගිවිසුම යටතේ රාජ්‍යතාන්ත්‍රික සේවා නිලධාරීන්ගෙන් ද (වාණිජ සහ ආර්ථික) වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමන්විත වේ. වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම යන තෙක් අඛණ්ඩ සේවා නියුක්ත වීම හේතුවෙන්, වාණිජ දෙපාර්තමේන්තුවෙ හි ඔවුන්ගේ වෘත්තීය ජීවිතය පුරාවටම ලබාගත් තාක්ෂණික පුහුණුව සහ පළපුරුද්ද දිගටම පවත්වා ගෙන යනු ලැබේ.

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නැත	වාණිජ දෙපාර්තමේන්තුවට අදාළ නැත.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නැත	වාණිජ දෙපාර්තමේන්තුවට අදාළ නැත.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නැත	වාණිජ දෙපාර්තමේන්තුවට අදාළ නැත.	
1.6	වෙනත්	අදාළ නැත	වාණිජ දෙපාර්තමේන්තුවට අදාළ නැත.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ. රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් නොමැත. එය අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබයි.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් පුවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගනන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාරතාවල පිටපත් තළමනාකරන විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභයන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2016-9 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම		ගර්හිත වාහන නොමැත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම		වාහන අනතුරු සිදුව නොමැත.	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	2022 පැවැති ඉන්ධන ගැටලු හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ නොහැකි විය.	මේ සඳහා අදාළ ක්‍රමවේදයන් සකසනු ලැබේ
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබෙන ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			

13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප	අනුකූල වේ		

	මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	08 අදාළ නොවන අතර 10 අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නෙඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		